# වාර්ෂික කාර්යසාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
## Annual Performance Report
# 2017

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2017

අධ්‍යාපන අමාත්‍යාංශය

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4.1. ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදි.

2018 මැයි

නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව
සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ, තනතුරු හා නිලධාරීන් (2017.12.31 දිනට)

**අධ්‍යාපන අමාත්‍ය**

ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා

**රාජ්‍ය අමාත්‍ය**

ගරු වී. රාධක්‍රිෂ්ණන් මැතිතුමා

**අධ්‍යාපන ලේකම්**

සුනිල් හෙට්ටිආරච්චි මයා

**රාජ්‍ය ලේකම්**

තිස්ස හේවාවිතාන මයා

**සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය**

අතිරේක ලේකම් - එස්.යූ. විජේරත්න මයා

**අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය**

අතිරේක ලේකම් - ආචාර්ය මධුරා එම් වෙහැල්ල මිය

**අධ්‍යාපන සේවා ආයතන අංශය**

අතිරේක ලේකම් - එච්.යූ. ප්‍රේමතිලක මයා

**ප්‍රසම්පාදන ඉදිකිරීම් හා පාසල් සැපයීම් අංශය**

අතිරේක ලේකම් - අනුරාධ විජේකෝන් මයා

**පාසල් කටයුතු අංශය**

අතිරේක ලේකම් - ඒ.එස්. හේවගේ මයා

**පාලන අංශය**

අතිරේක ලේකම් - එච්. හේවගේ මයා

**ජාතික උරුම අංශය**

අතිරේක ලේකම් - එල්.ඒ. අසෝක සිරිවර්ධන මයා

**මූල්‍ය අංශය**

අධ්‍යක්ෂ ජනරාල් - එස්.පී. විජේරත්න මයා

# පටුන

## 01. අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය


දැක්ම
මෙහෙවර
1.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම 01
1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය 01
1.3 අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන 02


## 02. ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්ම


2.1 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම 05
2.2 මධ්‍යකාලීන සංවර්ධන අභිමතාර්ථ උපායමාර්ග හා ඉලක්ක 08
2.3 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන 2013-2017 10


## 03. මූල්‍යකරණය


3.1 2017 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා මූල්‍ය වෙන් කිරීම 15
3.2 දේශීය හා විදේශීය ආධාර ආයෝජන 15
3.3 මූලධන වියදම් සඳහා මූල්‍ය වෙන් කිරීම 16
3.4 “ළඟ ම පාසල හොඳ ම පාසල” වැඩසටහන 17
3.5 දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීම 18
3.6 අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන - ආසියානු සංවර්ධන බැංකු වැඩසටහන් (ESDP/ADB) 19
3.7 ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව මගින් සම්බන්ධීකරණය කළ වැඩසටහන් 22
3.8 ඉන්දීය රජයේ ආධාර ලබන වැඩසටහන් 22
3.9 UNICEF ආධාර ලබන වැඩසටහන් 22


## 04. ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයේ සම සාධාරණ ප්‍රවේශය සහ සහභාගිත්වය සහතික කිරීම


4.1 “ළඟ ම පාසල හොඳ ම පාසල” ජාතික වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය 25
4.2 පාසල් සංවර්ධන වැඩසටහන් 30
4.3 පිරිවෙන් අධ්‍යාපනය 34
4.4 නොවිධිමත් අධ්‍යාපනය හා විශේෂ අධ්‍යාපනය 35
4.5 පාසල් පෝෂණ හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් 36
4.6 සුරක්ෂා සිසු රක්ෂණ වැඩසටහන 37
4.7 ශිෂ්‍ය සුභ සාධන වැඩසටහන් 38


## 05. ඉගෙනුම් සංවර්ධන වැඩසටහන්


5.1 ප්‍රාථමික අධ්‍යාපනය 41
5.2 විද්‍යා අධ්‍යාපනය 42
5.3 ගණිත අධ්‍යාපනය 43
5.4 තාක්ෂණ අධ්‍යාපනය 45
5.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය 48
5.6 කෘෂිකර්ම හා පරිසර අධ්‍යාපනය 49
5.7 වාණිජ හා ව්‍යාපාර අධ්‍යාපනය 50
5.8 සෞන්දර්යය අධ්‍යාපනය 51

| | | |
|---|---|---|
| 5.9 | ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය | 53 |
| 5.10 | ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය | 54 |
| 5.11 | ද්වි භාෂා හා ත්‍රෛ භාෂා අධ්‍යාපනය | 55 |
| 5.12 | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය | 55 |
| 5.13 | ආගමික හා සාරධර්ම අධ්‍යාපනය | 56 |
| 5.14 | විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් | 57 |
| 5.15 | පාසල් පුස්තකාල සංවර්ධනය | 58 |
| 5.16 | අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය | 58 |
| 5.17 | අධ්‍යාපන සැලසුම්කරණය හා කාර්යසාධන ඇගයිම | 58 |
| 5.18 | ප්‍රමිති පාදක පාසල් ඇගයීම්කරණ ක්‍රියාවලිය | 59 |
| 5.19 | දත්ත හා තොරතුරු කළමනාකරණය හා අධ්‍යාපන සැලසුම් නියාමනය | 60 |


## 06. අධ්‍යාපන වෘත්තීය සේවාවන් බලගැන්වීම


| | | |
|---|---|---|
| 6.1 | ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම | 63 |
| 6.2 | අධ්‍යාපන වෘත්තීය සේවාවන්ට බඳවා ගැනීම් හා උසස් කිරීම් | 63 |
| 6.3 | ගුරු අධ්‍යාපනය සහ ගුරු සංවර්ධනය | 64 |
| 6.4 | වෘත්තීය සේවාවන්හි මානව සම්පත් සංවර්ධනය | 65 |
| 6.5 | අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් | 67 |
| 6.6 | මහජන ගැටලු, පැමිණිලි හා විමසීම්වලට විසඳුම් ලබා දීම | 67 |


## 07. වියදම් සාරාංශය


| | | |
|---|---|---|
| 7.1 | වියදම් විශ්ලේෂණය | 71 |
| 7.2 | පුනරාවර්තන වියදම් සාරාංශය | 72 |
| 7.3 | ප්‍රාග්ධන වියදම් සාරාංශය | 73 |
| 7.4 | සමස්ත අධ්‍යාපන වියදම | 74 |
| 7.5 | සාමාන්‍ය අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය - 2017 | 75 |


## 08. ශිෂ්‍ය සාධනය


| | | |
|---|---|---|
| 8.1 | ශිෂ්‍ය සාධනයේ සමස්ත නිරීක්ෂණ | 79 |
| 8.2 | පස් වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය | 79 |
| 8.3 | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය | 80 |
| 8.4 | අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය | 80 |
| 8.5 | සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම පිළිබඳ ජාතික තක්සේරුකරණ වැඩසටහන | 82 |


## 09. ජාතික උරුම අංශයට අයත් ආයතන


| | | |
|---|---|---|
| 9.1 | ජාතික උරුම වැඩසටහන් | 87 |
| 9.2 | ටවර් හෝල් රගහල පදනම | 88 |
| 9.3 | ශ්‍රී ලංකා කලා මණ්ඩලය | 88 |
| 9.4 | ජනකලා කේන්ද්‍රය | 89 |



## ඇමුණුම


| | |
|---|---|
| ඇමුණුම 1 | 93 |
| ඇමුණුම 2 | 99 |


මෙම වාර්තාවෙ හි ආතුළත් යම් යම් සංඛ්‍යාලේඛන හා විශේෂ කරුණු පිළිබඳ නිර්වචන [(a) - (y) ලෙස දක්වා ඇති ] ඇමුණුම 1 හි අවසන් කොටසෙහි ඇතුළත් කර ඇත.

# මූලික සංඛ්‍යා දත්ත - 2017


## රජයේ පාසල් සංඛ්‍යාව 10,194




| | |
|---|---|
| රජයේ අනුමත පෞද්ගලික පාසල් සංඛ්‍යාව | 80 |
| විශේෂ පාසල් සංඛ්‍යාව | 26 |
| පිරිවෙන් සංඛ්‍යාව | 753 |


| |
|---|
| 1AB - 1– 13 ශ්‍රේණි උසස් පෙළ විද්‍යා විෂය ධාරාව සහිත |
| 1C - 1– 13 ශ්‍රේණි උසස් පෙළ විද්‍යා විෂය ධාරාව රහිත |
| 2 වර්ගය - 1 - 11 ශ්‍රේණි පමණක් |
| 3 වර්ගය - 1 - 5/ 1 - 8 ශ්‍රේණි පමණක් |

## රජයේ පාසල්වල ගුරුවරු සංඛ්‍යාව 241,018




| ස්ත්‍රී පුරුෂභාවය අනුව ගුරුවරු සංඛ්‍යාව | |
|---|---|
| ස්ත්‍රී | 176,530 |
| පුරුෂ | 64,488 |

## රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව 4,165,955




| ස්ත්‍රී පුරුෂභාවය අනුව ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|
| ස්ත්‍රී | 2,106,159 |
| පුරුෂ | 2,059,796 |

මූලාශ්‍රය : පාසල් සංගණනය—2017



# 01.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය

## දැක්ම

ශ්‍රී ලාංකීය අනන්‍යතාවෙහි හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මගින් විශ්ව සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම.

## මෙහෙවර

පාර්ශවකරුවන් තෘප්තිමත්භාවයට පත් වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකභාවයට යොමුවන අධ්‍යාපනයේ නවීකරණය කරන ලද නූතන ප්‍රවේශයක් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට සරිලන පරිදි දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීම.

## 1.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව තුළ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ව ජාතික පොදු අරමුණු ඉටුකර ගැනීම උදෙසා වෙනස් වන ලෝකයට සරිලන සේ අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කරමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී වගකීම අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පනත්වලින් පැනවෙන විධිවිධාන හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව වගකීම මධ්‍යම අමාත්‍යාංශයට පැවරී ඇති බැවින් පළාත් අධ්‍යාපන අධිකාරීත්වයත් සමඟ සහයෝගයෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම අමාත්‍යාංශයේ ප්‍රධාන භූමිකාවකි. අධ්‍යාපන ප්‍රමිති සහතික කිරීමට අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් ව සැපයීම හා විධිමත් සුපරීක්ෂණ ක්‍රියාවලියක් දියත් කිරීම ද අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරෙන වගකීම් අතර වේ.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට පැවරී ඇති පාසල් විෂයමාලා සම්පාදනය, පෙළපොත් සම්පාදනය, ඇගයීම හා තක්සේරුකරණය වැනි වගකීම් පිළිබඳ පසු විපරම් කිරීම හා ගුණාත්මක තහවුරුව පවත්වාගෙන යාම ද අමාත්‍යාංශයේ වගකීම් භාරයට අයත් වේ.

සංස්කෘතික හා ජාතික උරුම අංශයට අයත්වන ආයතන 8ක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පැවති අතර එම ආයතනවල අධීක්ෂණ කටයුතු මෙන් ම ඓතිහාසික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීමේ හා කලා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට අදාළ ව එම ආයතනවල කාර්යභාරය විමසා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම ද අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී තිබිණි.

## 1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය

1. අධ්‍යාපන විෂයයට සහ 1.3 හි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවක් ඇතිවන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම හා සම්පාදනය කිරීම
3. ලෝක තරගකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතු ව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම
4. ජාතික පාසල් සඳහා අවශ්‍ය මානව සම්පත් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
5. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල ව ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය
6. පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
7. ශිෂ්‍ය සුභසාධන වැඩසටහන් ලෙස නොමිලේ පාසල් පෙළපොත්, නිල ඇඳුම්, දිවා ආහාර හා ශිෂ්‍ය රක්ෂණාවරණ ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
8. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය හා සංවර්ධනය
9. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය හා සදාචාරය මනා අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම
10. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම
11. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය හා ශ්‍රී ලංකා ගුරු සේවය සමග සම්බන්ධ වූ පරිපාලන සහ පිරිස් කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම
12. ඵලදායී ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම
13. ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
14. පාසල් සංවර්ධන මණ්ඩල පරිපාලනය

15. අධ්‍යාපන ආයතන නීතිගත කිරීම

16. බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටුවන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම

17. ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

18. නවීන හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනයට සහ කලා ශිල්පීන් දිරිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම

19. නාට්‍ය, සංගීත හා නර්තන ක්ෂේත්‍රවල අභිවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීම

20. රාජ්‍ය ලේඛන විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීම

21. 1.3 හි දැක්වෙන ආයතනවල පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු

22. 1.3 හි දැක්වෙන ආයතන අධීක්ෂණය කිරීම.

## 1.3 අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන - 2017

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
- ජාතික අධ්‍යාපන ආයතනය
- ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම
- ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
- අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල
- අධ්‍යාපන විද්‍යාපීඨ
- ගුරු විද්‍යාල
- පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- ටවර්හෝල් රඟහල පදනම
- ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය
- ජාතික කලා මණ්ඩලය
- ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය
- අපේ ගම
- ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
- මධ්‍යම සංස්කෘතික අරමුදල



# 02.

## අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හා මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්ම

## 2.1 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම

ගෝලීය තිරසර සංවර්ධන අරමුණු 2030 වර්ෂය වන විට සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය මට්ටමින් ක්‍රියාත්මක වන යාන්ත්‍රණයේ සිව් වන අරමුණ වන ***2030 දී සැමට ගුණාත්මක හා සමාන අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශයක් සහතික කිරීම හා යාවජීව ඉගෙනුම ප්‍රවර්ධනය කරමින් ඒ සඳහා අවස්ථා සැලසීම*** ඉටුකර ගැනීමෙහි ලා අධ්‍යාපන අමාත්‍යාංශය ජාතික මට්ටමේ වැඩසටහනක් හඳුන්වා දී ඇත. ඒ සමග ම තාක්ෂණික ක්ෂේත්‍රයේ සීඝ්‍ර ලෙස ඉදිරියට යන ලෝකය තුළ අනාගතය සඳහා අවශ්‍ය කුසලතා ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීම සහ ඊට ගැළපෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නවීකරණය කිරීම අරමුණු කර ගත් නව ප්‍රතිසංස්කරණ යෝජනා කිහිපයක් ක්‍රියාවට නැංවීමට අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගෙන ඇත.

### I. 13 වසරක සහතික කරන ලද අධ්‍යාපනය

පළමු වසරට ඇතුළත් වන සෑම සිසුවෙකුට ම වසර 13ක අනිවාර්ය පාසල් අධ්‍යාපනයක් ලබා දීම අරමුණු කර ගත් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ අ.පො.ස.(සා/පෙළ) විභාගයේ සමත් අසමත් බව නොසලකා වෘත්තීය විෂයය ධාරාවක් යටතේ උසස් පෙළ හැදෑරීමට අවස්ථාව සිසුන්ට ලබා දීමට සැලසුම් කර ඇති අතර එහි නියාමක ව්‍යාපෘතියේ පළමු අදියර 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

පොදු විෂයය මාලාවකින් හා වෘත්තීය පාඨමාලා 26කින් සමන්විත මෙම වැඩසටහනේ පළමු වාරය තුළ විෂයයන් 9කින් යුත් පොදු විෂය මාලාවක් උගන්වන අතර දෙවන වාරයේ සිට හඳුන්වා දී ඇති වෘත්තීය පාඨමාලා 26න් අවම වශයෙන් 6ක් වත් එක් පාසලක් තුළ ක්‍රියාත්මක කෙරේ. ශිෂ්‍යයෙකුට පළමු වසර තුළ ඉන් පාඨමාලාවන් 3ක් හැදෑරීමටත් දෙවන වසර තුළ එම පාඨමාලා 3න් තමා වඩාත් දක්ෂතා දක්වන පාඨමාලාව වැඩිදුර හැදෑරීමටත් අවස්ථාව හිමි වේ. රාජ්‍ය හා පෞද්ගලික කර්මාන්ත ආයතන සමග සහයෝගීතාවයෙන් මෙම සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණු අවස්ථා සම්පාදනය කරන අතර ඒ සඳහා පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානයන් ලෙස ප්‍රතිපාදන පාසල් වෙත ලබා දීමට පියවර ගෙන ඇත.
"පිරුණු හැකියාවක්-දිනන රැකියාවක්" තේමාවෙන් 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනේ පළමු අදියර යටතේ පාසල් 42ක පළමු නියාමක වැඩසටහන ලෙස ආරම්භ කරන ලදී.






- පළමු අදියරේ ශිෂ්‍ය සංඛ්‍යාව 2,560ක් විය.
- පාසල් 42 සඳහා සුහුරු පන්ති කාමර ආකෘතියේ පන්ති කාමර 134ක් සකස් කරන ලදී.
- පාසල් 42හි සිසුන් සඳහා පොදු විෂයමාලාව ඉගැන්වීමේ කටයුතු 2017 ඔක්තෝම්බර් මස සිට ආරම්භ කරන ලදී.
- වෘත්තීය විෂයයන් 26න් නියාමක පාසල් 42ක ප්‍රධාන වශයෙන් තෝරා ගෙන ඇති විෂයයන් පහත පරිදි වේ.
    - මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය (පාසල් 31)
    - විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය (පාසල් 24)
    - සංචාරණය හා ආගන්තුක සත්කාර (පාසල් 24)
    - ග්‍රැෆික් නිර්මාණකරණය (පාසල් 19)
    - විලාසිතා නිර්මාණකරණය (පාසල් 14)
    - ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය (පාසල් 13)

- ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය, ප්‍රාසාංගික කලාව, කාර්යය සිද්ධි කළමනාකරණය, ශිල්ප කලා, අභ්‍යන්තර නිර්මාණකරණය, ග්‍රැෆික් නිර්මාණකරණය, කලාව හා පිරිසැලසුම්කරණය ඇතුළු වෘත්තීය විෂයයන් 26 සඳහා උපාධිධාරීන් 2,100ක් ගුරුවරුන් වශයෙන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇත.
- පාසල් 42ක් සඳහා පාසල් පාදක මූල්‍ය ප්‍රදානයන් ලබා දීමට කටයුතු කරන ලදී.
- නියමු ව්‍යාපෘතියේ අදියර 2 යටතේ තවත් පාසල් 150ක 2018දී ආරම්භ කිරීම සඳහා අදාළ විදුහල්පතිවරුන් දැනුම්වත් කිරීමේ වැඩමුළු පවත්වා ඇත.
- සුහුරු පන්ති කාමර ආකෘතියේ පන්ති කාමර 500ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් පවතී.

## II. ජාතික සුපරීක්ෂණ අධිකාරිය ආරම්භ කිරීම

පාසල් නියාමනය හා කාර්යසාධනය තක්සේරුකරණය තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රමිතීන් තහවුරු කිරීමේ හා පාසල් කළමනාකරණයට සහාය වීමේ අරමුණින් පාසල් සුපරීක්ෂණ අධිකාරිය පිහිටුවා 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

- ජාතික සුපරීක්ෂණ අධිකාරිය ස්ථාපිත කිරීම සඳහා ස්ථානයක් වෙන් කර ඇත.
- කාර්ය මණ්ඩල අනුමත කිරීම පිණිස කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.
- තනතුරු ඇතිකිරීම සඳහා මු.රෙ.71 මගින් ඉදිරිපත් කර ඇත.
- පළාත් අධ්‍යාපන ලේකම්වරුන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හා අදාළ නිලධාරීන් දැනුම්වත් කර ඇත.
- ඇගයීම් නිර්ණායක හා මාර්ගෝපදේශ සකස් කර ඇත.
- සුපරීක්ෂණ සේවාව සඳහා වෙබ් අඩවියක් හා දත්ත පදනම් සකස් කර ඇත.
- 2018 මුල්භාගයේ දී නියාමක වැඩසටහන ජාතික පාසල් මුල් කර ගනිමින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

## III. පළාත් මට්ටමින් අධ්‍යාපන කළමනාකරණය බලගැන්වීම

- වඩාත් ආසන්න හා කාර්යක්ෂම අධීක්ෂණ සේවාවක් ස්ථාපිත කිරීම සඳහා කලාප කාර්යාල සංඛ්‍යාව 98 සිට 200 දක්වා ඉහළ නැංවීමට අවශ්‍ය සිතියම්කරණ අභ්‍යාසය ආරම්භ කර ඇත.
- සිතියම්ගත කිරීමේ නිර්ණායක පළාත් අධ්‍යක්ෂකවරුන් වෙත ඉදිරිපත් කර යෝජනා ලබා ගැනීම ආරම්භ කර ඇත.
- මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත සියලුම පාසල් වෙත ජ්‍යාමිතික ඛණ්ඩාංක ලබා දී පාසල් සිතියම්ගත කිරීම ආරම්භ කර ඇත.
- මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පළාත් මට්ටමින් ග්‍රාම සේවා මායිම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මායිම්, දිස්ත්‍රික්ක මායිම්, පළාත් මායිම් පරිවහන රටාව, භූගෝලීය බාධක ඇතුළු දත්ත සහිත ඩිජිටල් සිතියම්කරණ මෘදුකාංග ලබා දීමට කටයුතු කර ඇත.

## IV. පාසල් ගුරු කාර්යමණ්ඩල ප්‍රතිපත්තිය සැකසීම

ගුරුවරුන් බඳවා ගැනීම, පත් කිරීම, මාරු කිරීම, උසස් වීම් ලබා දීම සහ ගුරු පුහුණුව හා සංවර්ධනය පාසල් පද්ධතියේ අවශ්‍යතා මත විචාරවත් අයුරින් සිදුකර දක්ෂ , කුසලතා පිරි, කැපවීමෙන් යුත් ගුරු පිරිසක් පද්ධතියේ රඳවා ගැනීම අරමුණු කර ගනිමින් පාසල් ගුරු කාර්යමණ්ඩල ප්‍රතිපත්තියක් සකස් කිරීමට අවධානය යොමු කර ඇත.

## V. පාසල් ඇගයීම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය හා කාර්යක්ෂමභාවය වැඩි කිරීම

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කාර්යභාර්යය ප්‍රතිසංවිධානය කිරීම සඳහා පත්කළ විද්වත් කමිටුව ලබා දුන් නිර්දේශවලට අනුව නවීකරණ කටයුතු ආරම්භ කර ඇත. පාසල් විභාග ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඩිජිටල්කරණය හා නවීකරණය කිරීම මේ යටතේ සිදු වේ. අ.පො.ස (සා.පෙ) හා අ.පො.ස (උ.පෙ) විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා ගත වන කාලය අඩු කිරීම ද පාසල් විභාග පැවැත්වෙන දින වකවානු ගැළපෙන අයුරින් වෙනස් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

## VI. ජාතික පාසල් සංඛ්‍යාව ඉහළ නංවා ජාතික පාසල්වලට ප්‍රවේශවීමට වැඩි සිසුන් ප්‍රමාණයකට අවස්ථා සලසා දීම

ජාතික පාසල්වලට ඇතුළත් වීමට දැනට ඇති ඉල්ලුමට විසඳුමක් ලබා දීම සඳහා 1AB පාසල් ජාතික පාසල් බවට පත් කර දැනට පවතින ජාතික පාසල් 353ක ප්‍රමාණය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා සංකල්ප පත්‍රිකාව සහ තෝරා ගැනීමේ නිර්ණායක සකස් කර අනුමැතියට ඉදිරිපත් කර ඇත.

## VII. මානව සම්පත් සංවර්ධනය හා පුහුණුව

ගුරුවරුන්, විදුහල්පතිවරුන්, අධ්‍යාපනඥයින් හා අධ්‍යාපන නිලධාරීන්ට තම වෘත්තීය සාර්ථකත්වය හා දියුණුව ඇති කර ගැනීම සඳහා මෙන්ම පුහුණුකරුවකු ලෙස ධාරිතා සංවර්ධනය හා ආයතනික සංවර්ධනය සඳහා දායකවීමට හැකි වන සේ ඔවුන් උසස් මට්ටමේ උපාධි, ඩිප්ලෝමා සහ පුහුණු වැඩසටහන් සඳහා විධිමත් ක්‍රමවේදයක් තුළ සහභාගී කරවීම අරමුණු කර ගනිමින් සියලුම විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි මානව සම්පත් පුහුණු හා සංවර්ධන ප්‍රධාන සැලැස්ම සකස් කර 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලදී.

## VIII. අධ්‍යාපනය හා සම්බන්ධ අනෙකුත් පනත් සංශෝධනය

ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ආදී පනත් වර්තමානයට ගැළපෙන පරිදි සංශෝධනය කිරීමට යෝජිතය.

## IX. අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ ප්‍රධාන සැලැස්ම

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට, අධ්‍යාපන පරිපාලනයට හා කළමනාකරණයට තොරතුරු තාක්ෂණය (ICT) යොදා ගැනීම විධිමත් අයුරින් සිදු කිරීම සඳහා අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ ප්‍රධාන සැලැස්ම සකස් කිරීමට පියවර ගනු ලැබිණි.

## X. පාසල් විෂයමාලා ප්‍රතිසංස්කරණය

නවීන ලෝකයට ගැළපෙන අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ලබා ගත හැකි පරිදි පාසල් විෂයමාලා ප්‍රතිසංස්කරණයක් කිරීමට අපේක්ෂා කෙරේ. මෙහි දී පූර්ව අධ්‍යාපන අවධියේ විෂයමාලාව, 5 ශිෂ්‍යත්ව විභාගය, සාමාන්‍ය පෙළ විෂයමාලාවේ කාණ්ඩ විෂයය, විෂයමාලා අන්තර්ගතයන් විෂය දැනුම තක්සේරුකරණය යන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ජාතික විෂයමාලා රාමුවක් සකස් කිරීමට ද එහි සංශෝධන ජාතික විෂයයමාලා කමිටුවක් යටතේ සිදුකිරීම කෙරෙහි ද අවධානය යොමුව ඇත.

## XI. සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන සැලැස්ම 2018-2020

ඉහත ප්‍රතිසංස්කරණ යෝජනා සියල්ල ඇතුළත් 2018 - 2020 සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට පියවර ගනු ලැබිණි.

## XII. ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම

වඩා ප්‍රශස්ථ ගුරු උපයෝජනයක් ලබා ගැනීම, ගුරු භවතුන්ගේ රාජකාරී අත්දැකීම් පරාසය පුළුල් කිරීම, ජනප්‍රිය පාසල් වල සේවය කළ ගුරු භවතුන්ගේ අත්දැකීම් අනෙකුත් පාසල්වලට ලබා දීම හා දුෂ්කර පාසල්වල ගුරු භවතුන්ට ජනප්‍රිය පාසල්වල සේවය කිරීමට අවස්ථාව ලබා දීම යන ප්‍රධාන අරමුණු පාදක කරගනිමින් 2017 වර්ෂය තුළ දී ගුරු ස්ථාන මාරු සිදු කිරීම සඳහා සැලසුම් කරන ලදී. ඒ අනුව එක ම පාසලක වසර 10කට වඩා සේවයේ නියුතු ගුරුවරුන් මේ යටතේ පහත පරිදි අදියර කිහිපයකින් ස්ථාන මාරු කිරීමට සැලසුම් කෙරේ.

| | | |
|---|---|---|
| අ.පො.ස.(උසස් පෙළ) | - | 3,120 |
| අ.පො.ස.(සාමාන්‍ය පෙළ) | - | 5,550 |
| ප්‍රාථමික | - | 1,919 |

ස්ථාන මාරු සඳහා යොමු වී තිබූ ගුරු මාරු සංඛ්‍යාව ඉතා විශාල නිසා, අ.පො.ස.(උසස් පෙළ)හා ප්‍රාථමික ශ්‍රේණි වල උගන්වන ගුරුවරුන්ගේ ස්ථාන මාරු පමණක් 2017 වර්ෂය තුළ දී අවසන් කරන ලද අතර සමස්ත ක්‍රියාවලිය 2018 මාර්තු මස වන විට අවසන් කරන ලදී.

## 2.2 මධ්‍ය කාලීන සංවර්ධන අභිමතාර්ථ, උපායමාර්ග හා ඉලක්ක

| | |
|---|---|
| අධ්‍යාපන සංවර්ධන අභිමතාර්ථ හා ඉලක්ක | පූර්ව ළමාවිය අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම |
| | අනිවාර්ය අධ්‍යාපන වයසේ සියලු ම දරුවන් අධ්‍යාපනය සඳහා ප්‍රවේශවීම සහතික කිරීම |
| | ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත් වන දරුවන් අ.පො.ස (සා.පෙළ) දක්වා රැඳී සිටීම 2017 වන විට 90% දක්වා ඉහළ නැංවීම |
| | අ.පො.ස (සා.පෙළ) සමත් ප්‍රතිශතය 2017 වන විට 81% දක්වා ඉහළ නැංවීම |
| | අ.පො.ස (සා.පෙළ) සමත් අසමත් බව නොසලකමින් සියලුම සිසුන්ට වෘත්තීය ප්‍රවේශ අනුව 13 වසරක අධ්‍යාපනය සහතික කිරීම. |
| | අ.පො.ස (උ.පෙළ) සහභාගිත්වය විද්‍යා හා තාක්ෂණ ධාරාව සඳහා 40% දක්වාත් වාණිජ විෂය ධාරාව සඳහා 35% දක්වාත් 2017 වන විට ඉහළ දැමීම හා කලා විෂය ධාරාවේ ව්‍යුහගත වෙනසක් ඇතිකිරීම |
| | 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70ට වඩා ලබා ගන්නා ශිෂ්‍ය ප්‍රතිශතය ඉහළ නැංවීම |
| | අ.පො.ස. උසස් පෙළ සමත් වන ප්‍රතිශතය ඉහළ නැංවීම |
| | 2017 වන විට වෘත්තීය සුදුසුකම් සපිරි ගුරු ප්‍රතිශතය 90% දක්වා වැඩි කිරීම |
| | ශිෂ්‍ය තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව 70% දක්වා ඉහළ නැංවීම |
| | තොරතුරු තාක්ෂණ කුසලතා සහිත ගුරු ප්‍රතිශතය 70% දක්වා ඉහළ නැංවීම |
| | අ.පො.ස. (සා.පෙ.) හා අ.පො.ස. (උ.පෙ.) හදාරා පාසලින් පිටවන සෑම ශිෂ්‍යයකු ම උසස් අධ්‍යාපන හෝ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීමට යොමු වීම සහතික කිරීම |
| | ත්‍රිභාෂා කුසලතා පිරි දරු පරපුරක් පාසල් පද්ධතිය තුළින් බිහි කිරීම |
| | උසස් පෞරුෂයක් හා ශාරීරික යෝග්‍යතාවක් සහිත යොවුන් පරපුරක් සමාජයට දායාද කිරීම |
| | නිර්මාණශීලී කුසලතාවලින් හෙබි දේශීයත්වය අගයන සාරධර්ම සුරකින පුරවැසියන් පාසල තුළින් බිහි කිරීම |
| | භෞතික හා මානව සම්පත් සපුරාලීම මගින් සෑම අධ්‍යාපන ආයතනයක් ම කාර්යක්ෂම හා ඵලදායී සේවා සපයන ආයතනයක් බවට පත් කිරීම |
| | අධ්‍යාපනය සඳහා වන රාජ්‍ය වියදම දළ ජාතික නිෂ්පාදනයෙන් 6% ක් දක්වා ක්‍රමික ව ඉහළ නැංවීම |

| | |
|---|---|
| උපාය මාර්ගික සංවර්ධන අරමුණු හා ඉලක්ක | නව අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම |
| | “ළඟ ම පාසල හොඳ ම පාසල” වැඩසටහන යටතේ සෑම ප්‍රා.ලේ. කොට්ඨාසයකට ම පාසල් දෙකක්වත් වන සේ පාසල් 600ක් අංග සම්පූර්ණ ව සංවර්ධනය කිරීම |
| | ප්‍රාථමික පාසල් සඳහා සියලු පහසුකම් සැපයීම හා ද්විතීයික පාසල් පද්ධතිය හා විචාරවත් පරිදි ඒකාබද්ධ කිරීම |
| | සිසුන්ගේ ඇදහැලීම අඩුකර සහභාගිත්වය වැඩිකිරීම සඳහා සිසු රක්ෂණ ක්‍රමය ශිෂ්‍යත්ව වැඩසටහන් හා සුභසාධක සේවාවන් ක්‍රියාත්මක කිරීම |
| | සියලු ම පාසල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම |
| | පන්ති කාමරවල ශිෂ්‍ය සංඛ්‍යාව උපරිම සීමාවකට යටත් ව පවත්වා ගැනීම |
| | වසර 13ක් අධ්‍යාපනය ලබාදීම තහවුරු කෙරෙන අයුරින් පාසල්වල වෘත්තීය විෂයය මාලාව ක්‍රියාත්මක කිරීම හා අදාළ අනෙකුත් අමාත්‍යාංශ සමඟ ඒකාබද්ධ වැඩසටහන් දියත් කිරීම |
| | ගෝලීය මට්ටමට ගැළපෙන උසස් තත්ත්වයේ සමබර විෂය මාලාවක් නිර්මාණය කිරීම |
| | අ.පො.ස.(සා.පෙළ) සඳහා විද්‍යාගාර පහසුකම් හා අ.පො.ස.(උ.පෙළ) සඳහා තෝරා ගත් පාසල්වලට විද්‍යාගාර පහසුකම් ලබා දීම හා උසස් පෙළ විද්‍යා ධාරාව ඇරඹීම |
| | සෑම පාසලකට ම විෂයය අනුව සාධාරණ ලෙස ගුරුවරු ලබා දීම සඳහා වන ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරීම |
| | අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම හා ඒ සඳහා ප්‍රධාන සැලැස්මක් සකස් කිරීම |
| | පිරිවෙන් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම |
| | විශේෂ අධ්‍යාපන ප්‍රවේශ පහසුකම් හා සම්පත් වැඩිදියුණු කිරීම |
| | පූර්ව සේවා සහ සේවාස්ථ ගුරු පුහුණුවෙහි ගුණාත්මක බව වැඩි කිරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු අධ්‍යාපනය සංවර්ධනය හා ආයතන හා විෂය මාලාව සංවර්ධනය |
| | ශිෂ්‍ය ඇගයීම් ක්‍රියාවලිය නව ක්‍රමවේදය අනුව දියුණු කිරීම |
| | අධ්‍යාපන වෘත්තිකයන් උසස් වෘත්තීය හා නායකත්ව සංවර්ධන වැඩසටහන් සඳහා දේශීය හා විදේශීය වශයෙන් යොමු කරවීම |
| | පාසල් අධීක්ෂණ මණ්ඩලයක් ස්ථාපිත කිරීම |
| | පාසල් හා අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මක ප්‍රමිති නිර්ණය කිරීම හා ඇගයීම |
| | තීරණ ගැනීමේ ක්‍රියාවලියට සාක්ෂි සැපයෙන දත්ත හා තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීම |
| | ශිෂ්‍ය පෞරුෂ වර්ධනය හා ශාරීරික සෞඛ්‍ය වර්ධනය වෙනුවෙන් වැඩසටහන් දියත් කිරීම |

## 2.3 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන 2013 - 2017 හා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 2017

### තේමාව 1
**ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සම සාධාරණ අධ්‍යාපන ප්‍රවේශ හා සහභාගිත්ව අවස්ථා ඉහළ නැංවීම**

**අපේක්ෂිත ප්‍රතිඵල**

- 1ශ්‍රේණියට ඇතුළත් වන සිසුන් 11 ශ්‍රේණිය (වයස අවුරුදු 16 දක්වා) දක්වා රැඳී සිටිමේ අනුපාතය 100% ක් බවට පත්වීම.
- 9 ශ්‍රේණියෙන් 10 ශ්‍රේණියට සමත් වන ශිෂ්‍ය අනුපාතය ඉහළ යාම.
- දළ ඇතුළත් වීම් අනුපාත හා ශුද්ධ ඇතුළත් වීම් අනුපාත ඉහළ යාම.
- පළාත් විසින් තීරණය කරන ලද ඉලක්කවලට අනුව පාසල් නොයන ශිෂ්‍ය සංඛ්‍යා අවම වීම.
- ජාතික ප්‍රතිමානවලට අනුව මූලික යටිතල පහසුකම් හා උසස් මට්ටමේ ඉගෙනුම් පහසුකම් සියලු පාසල්වලට සැපයීම.
- නොවිධිමත් අධ්‍යාපන හා විශේෂ අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් ව ක්‍රියාත්මක වීම.
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ට ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සම අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීම.
- පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක බව දියුණු වීම.
- සියලු පාසල් දරුවන්ට රක්ෂණාවරණය සහිත පාසල් පද්ධතියක් සහතික වීම.
- පාසල්වලින් ශාරීරික දඬුවම් දීමේ ක්‍රමය තුරන් වී තිබීම.
- ආපදා හා අවදානම් කළමනාකරණය ශක්තිමත් වීම.
- පාසල් පෙළපොත්, පාසල් නිල ඇඳුම්, අවශ්‍ය සිසුන් සඳහා දිවා ආහාර හා ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර සැපයීම වැනි ඉල්ලුම මත පදනම් වූ අධ්‍යාපන සුභසාධනමය කාර්යයන් පවත්වා ගෙන යාම හා නිසි වේලාවට අදාළ ප්‍රතිලාභීන්ට එම සේවාවන් සැපයී තිබීම.
- සියලු පාසල් ආවරණය වන පරිදි පාසල් සෞඛ්‍යය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වීම.

### තේමාව 2
**ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම**

**අපේක්ෂිත ප්‍රතිඵල**

- සිසුන් තුළ ත්‍රිභාෂා කුසලතා දියුණු කිරීම.
- අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල 80% දක්වා ඉහළ යාම.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තොරතුරු තාක්ෂණය ඇසුරෙන් නවීකරණය වීම.
- වෘත්තීය සුදුසුකම් සපිරි ගුරු ප්‍රතිශතය ඉහළ යෑම.
- සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයන් අතර සහයෝගීතාව හා සම්බන්ධීකරණය සවිමත් වීම.
- ජාතික විෂයමාලාව ප්‍රතිසංස්කරණය වීම හා යාවත්කාලීන වීම.
- පළමු බසින් අධ්‍යාපනය ලැබීම සහතික වීම
- ශිෂ්‍යයන්ගේ විභව්‍යතාව අනුව ගණිතය හා විද්‍යාව විෂයමාලාව විවිධාංගිකරණය වීම.
- ද්විභාෂා අධ්‍යාපනය සඳහා විෂය අන්තර්ගතය හා භාෂා සමෝධානික රාමුවක් ස්ථාපිත කිරීම.
- සෑම ද්විතීයික පාසලක ම අවම වශයෙන් ක්‍රීඩා තුනක් වත් සිසුන් සඳහා හඳුන්වා දීම.
- ආයතනික ගුරු සංවර්ධන රාමුවක් අධ්‍යාපන පද්ධතිය තුළ ස්ථාපිත වීම.
- අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) තෝරා ගත් විෂයයන් සඳහා අයිතම ප්‍රතිචාරාත්මක විශ්ලේෂණ ප්‍රකාශයට පත් කිරීම.
- අ.පො.ස. (උ.පෙළ) විද්‍යා විෂය හදාරණ ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ යාම.(2017 වන විට 40% )
- අ.පො.ස. (උ.පෙළ) වාණිජ විෂය ධාරාවෙන් පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ යාම. (2017 වන විට 35% )
- අ.පො.ස. (උ.පෙළ) කලා විෂය ධාරාවෙන් පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අඩු කිරීම. (2017 වන විට 25% )
- ප්‍රාථමික හා ද්විතීයික ශ්‍රේණිවල සිසුන්ගේ ප්‍රාප්ති මට්ටම් මැනෙන පරිදි ජාතික ඇගයීම් ක්‍රමවේදය මූලික ව ක්‍රියාත්මක වීම.
- අඩු සාධන මට්ටම් සහිත සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතාවලට ගැළපෙන පරිදි විශේෂ ඉගැන්වීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක වීම හා ඊට අදාළ පහසුකම් සැපයීම.
- පාසල් පෙළපොත්වල ගුණාත්මක භාවය 100% කින් ඉහළ නැංවීම සඳහා නිරීක්ෂණ කණ්ඩායම් කටයුතු කිරීම.
- පාසල්වල ජාතික සමාජ ඒකාග්‍රතා වැඩසටහන ප්‍රවර්ධනය වීම.
- ප්‍රමිති හා තත්ත්ව වැඩසටහන් යාවත්කාලීන කොට සියලු ම පළාත්වල ක්‍රියාත්මක කිරීම.

## තේමාව 3
## අධ්‍යාපනයේ යහපාලනය හා සේවා සැපයීම් ශක්තිමත් කිරීම

**අපේක්ෂිත ප්‍රතිඵල**

- පාසල් නගා සිටුවීමේ වැඩසටහනේ අදාළ පියවර සම්පූර්ණ වීම හා පාසල් සංවර්ධනය සඳහා සැලසුම්කරණය, සැලසුම් යාවත්කාලීන කිරීම ආදී ක්‍රියාවලි අඛණ්ඩ ව ක්‍රියාත්මක වීම
- පාසල් සංවර්ධනය සඳහා පාසල් සංවර්ධන සමිති, පාසල් සංවර්ධන කමිටු හා පාසල් කළමනාකරණ කමිටු සංවර්ධනය කිරීම, ස්ථාපිත කිරීම හා ඊට අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වීම
- පාසල් වෙත තීරණ ගැනීමේ බලතල හා අධිකාරීත්වය මුදා හැරීම
- සියලු ම ප්‍රාථමික පාසල්වල ළමා මිතුරු ප්‍රවේශය ශක්තිමත් ව තිබීම
- වෘත්තීය පළපුරුද්ද සහිත ගුරු අධ්‍යාපනඥයින්ගේ සේවාව පද්ධතියට ලැබීම
- වෘත්තීයමය පළපුරුද්ද හා කුසලතාවන්ගෙන් හෙබි විදුහල්පතිවරුන් සේවයේ නියුක්ත වීම
- වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වන විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම
- කලාප අධ්‍යාපන කාර්යාල, කළමනාකරණ / පරිපාලන ඒකක ලෙසත්, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල, අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ඒකක ලෙසත් ශක්තිමත් ව ක්‍රියාත්මක වීම

## පදනම් තේමාව
## අධ්‍යාපන ආංශික සංවර්ධන පෙරළුම් සැලැස්ම

**අපේක්ෂිත ප්‍රතිඵල**

- තොරතුරු හා දත්ත මත පදනම් වූ අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම්කරණ සංස්කෘතියක් ස්ථාපිත වී තිබීම
- අධ්‍යාපන ආංශික ක්‍රමෝපායික පෙරළුම් සැලැස්ම හා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම පිළියෙල කිරීම හා යාවත්කාලීන කිරීම
- ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් මැනෙන ජාතික ඇගයීම් ක්‍රමවේදයක්, ප්‍රාථමික අවධිය (4 ශ්‍රේණිය : මවු භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි විෂයයන් සඳහා) හා ද්විතීයික අවධිය (8 ශ්‍රේණිය : ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා) අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම හා ඉන් අනාවරණය වන තොරතුරු අධ්‍යාපන සංවර්ධනය සඳහා යෙදවීම
- අධ්‍යාපන පුනරාවර්තන අයවැයෙන් උසස් මට්ටමේ ඉගෙනුම් ක්‍රියාවලි සඳහා 2011 දී වෙන් වූ 3.2% ක් වූ ප්‍රතිපාදනය 2017 වන විට 4.3% ක් දක්වා ක්‍රමික ව වැඩි වී තිබීම
- අධ්‍යාපන ප්‍රාග්ධන අයවැයෙන් උසස් මට්ටමේ ඉගෙනුම් ඉඩකඩ හා ප්‍රාග්ධන යෙදවුම් සඳහා 2011 දී වෙන් වූ 42% ක් වූ ප්‍රතිපාදනය 2017 වන විට 44% ක් දක්වා වැඩි වී තිබීම
- අධ්‍යාපන ප්‍රාග්ධන අයවැයෙන් උසස් මට්ටමේ ඉගෙනුම් ඉඩකඩ හා ප්‍රාග්ධන යෙදවුම් නඩත්තු හා නවීකරණය සඳහා 2011 දී වෙන් වූ 15% ක් වූ ප්‍රතිපාදනය 2017 වන විට 17.5% ක් දක්වා වැඩි වී තිබීම
- පාසල් අධ්‍යාපනය හා තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍ර අතර මනා අන්තර් ආංශීය සම්බන්ධතාවක් ස්ථාපනය වී තිබීම

මෙම වැඩසටහනට අදාළ ප්‍රතිඵල පාදක නියාමනය සඳහා ඇගයීම් රාමුවක් සකස් කර ශක්තිමත් ව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.



# 03.

## මූල්‍යකරණය

## 3.1 2017 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා මූල්‍ය වෙන්කිරීම

**අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සමස්ත මූල්‍යකරණය**

2017 වසර සංශෝධිත අයවැය ඇස්තමේන්තුවට අනුව පහත දැක්වෙන පරිදි පුනරාවර්තන වියදම් සඳහා මුදල් වෙන්කෙරුණු අතර එම වියදම් මූල්‍යයනය කිරීමට දේශීය හා විදේශීය මූලාශ්‍ර යොදා ගන්නා ලදි.

සමස්තයක් ලෙස වියදම් මූල්‍යයනය කිරීමේදී දේශීය මූලාශ්‍ර වැඩි වශයෙන් භාවිතා කර ඇති අතර විදේශීය මූලාශ්‍ර ද භාවිතයට ඇස්තමේන්තුගත කර තිබුණි. පුනරාවර්තන වියදම් අතුරින් වැටුප් හා වේතනවලට අමතරව වැඩිම වෙන්කිරීම සුභ සාධන කටයුතු වෙනුවෙන් සිදුකර ඇත.

## 3.2 2017 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා මූල්‍ය වෙන්කිරීම

**3.2.1. වගුව : පුනරාවර්තන වියදම් - 2017**

| ශීර්ෂය | විස්තරය | 2017 සංශෝධිත ඇස්තමේන්තුව (රු. මි.) |
|---|---|---|
| 126 | වැටුප් සහ වේතන | 20224.48 |
| | වෙනත් දීමනා සහ ගමන් වියදම් | 12374.66 |
| | සැපයීම් නඩත්තු හා පොදු සේවා | 9003.56 |
| | රාජ්‍ය සේවක දේපොල ණය පොළී ගෙවීම් | 414.73 |
| | පාසල් පෝෂණ වැඩසටහන | 4631.00 |
| | සිසුන්ට කිරි වීදුරුවක් ලබාදීම | 310.00 |
| | පාසල් පෙළපොත් | 4385.00 |
| | පාසල් හා පිරිවෙන් නිල ඇඳුම් | 2700.00 |
| | 5 ශ්‍රේණිය ශිෂ්‍යාධාර | 363.00 |
| | සුභග ශිෂ්‍යත්ව ක්‍රමය | 30.00 |
| | සුරක්ෂා රක්ෂණාවරණය | 2700.00 |
| | දුෂ්කර හා අතිදුෂ්කර පාසල් සිසුන්ට සපත්තු ලබා දීම | 640.00 |
| | පිරිවෙන් අධ්‍යාපනය | 3367.25 |
| | පාසල් ක්‍රීඩා උලෙළ | 10.00 |
| | ආබාධිත සිසුන් සඳහා අධ්‍යාපනය | 233.00 |
| | උපකෘත පාසල් සඳහා ආධාර | 1670.00 |
| | ජාතික අධ්‍යාපන ආයතනය | 430.00 |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | 1415.00 |
| | ජාතික පුස්තකාල සේවා මණ්ඩලය | 144.00 |
| | ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන | 291.35 |
| | ජාතික උරුම රැක ගැනීම | 133.00 |
| 207* | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 857.43 |
| 209* | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 111.29 |
| 212* | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | 3112.00 |
| 213* | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 56.71 |
| | **එකතුව** | **69,607.46** |

මූලාශ්‍රය - අමාත්‍යාංශ ගිණුම් වාර්තා
* අයවැය මුදල් ඇස්තමේන්තුව අනුව

# 3.3 මූලධන වියදම් සඳහා මූල්‍ය වෙන්කිරීම්

**3.3.1. වගුව : මූලධන වියදම් - ඇස්තමේන්තුව 2017 (රු.මි.)**

| | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව | නව මිලදී ගැනීම් | නව ඉදිකිරීම් | ධාරිතා සංවර්ධනය | සංවර්ධන ආයෝජනය | එකතුව |
|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ කාර්යාල | 97.33 | 148.19 | 111.63 | 4.00 | | 361.145 |
| ජාතික අධ්‍යාපන ආයතනය - අයවැය යෝජනා 2017 | | | | | 360.00 | 360.000 |
| ජාතික පුස්තකාල ප්‍රලේඛන සේවා මණ්ඩලය වැඩිදියුණු කිරීම | | | | | 50.00 | 50.000 |
| කොළඹ ජාතික පුස්තකාලය ප්‍රවර්ධනය | | 100.00 | 400.00 | | | 500.000 |
| ප්‍රාථමික අධ්‍යාපනය - ජාතික පාසල් | 50.00 | 10.00 | 150.00 | | 5.00 | 215.00 |
| ආරක්ෂක විද්‍යාල | | | 126.30 | | | 126.30 |
| ද්විතියික අධ්‍යාපනය - ජාතික පාසල් | 780.00 | 140.00 | 1,315.68 | | 230.00 | 2,465.68 |
| ක්‍රීඩා පාසල් සංවර්ධනය | 150.00 | 50.00 | | | | 200.00 |
| විශේෂ අධ්‍යාපනය | 35.00 | 20.00 | 50.00 | | | 105.00 |
| පිරිවෙන් අධ්‍යාපනය | | 10.00 | 70.00 | | | 80.00 |
| විශේෂ අවශ්‍යතා සහිත දරුවන් බලගැන්වීම | | 10.00 | | | | 10.00 |
| විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය - වෙනිවැල්කොළ | | | 65.73 | | | 65.73 |
| ගුරු මධ්‍යස්ථාන හා ගුරු විද්‍යාල සංවර්ධනය | 101.50 | 40.90 | 50.00 | | | 192.40 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංවර්ධනය | 707.00 | 287.13 | 250.00 | | | 1,244.13 |
| ගුරු සංවර්ධනය | | | 570.00 | 191.97 | | 761.97 |
| UNESCO ක්‍රියාකාරකම් | | | | | 15.00 | 15.00 |
| දැනුම් සමාජයක් සඳහා පාසල් පද්ධතිය සංවර්ධනය (TSEP ) - ලෝක බැංකු ආධාර | 241.00 | 30.00 | 52.00 | 23.00 | 161.00 | 507.00 |
| සමාජ සංහිඳියාව සඳහා අධ්‍යාපනය - GIZ | | | | | 25.87 | 25.87 |
| UNICEF ක්‍රියාකාරකම් | | | | 12.30 | | 12.30 |
| UNFPA ක්‍රියාකාරකම් | | | | 0.46 | | 0.46 |
| FAO ක්‍රියාකාරකම් | | | | 9.50 | | 9.50 |
| නැගෙනහිර පළාත් පාසල් 27ක් සංවර්ධනය - ඉන්දීය රජයේ ආධාර | | | | | 60.00 | 60.00 |
| පොලොන්නරුව ත්‍රෛභාෂා පාසල - ඉන්දීය රජයේ ආධාර | | | 97.11 | | | 97.11 |
| උඩුපුස්සැල්ලාව සරස්වතී ජාතික පාසල නවීකරණය- ඉන්දීය රජයේ ආධාර | 89.00 | | | | | 89.00 |
| ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | | | | | 250.00 | 250.00 |
| තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන | | 6.41 | 118.59 | | | 125.00 |
| ද්විතියික අධ්‍යාපනය සංවර්ධනය ( ESDP ) -ආ.සං.බැ. ආධාර | 500.00 | 1,523.01 | 1,110.50 | 659.05 | | 3,792.56 |
| ගංවතුර හා නායයෑම්වලින් අනතුරට යත් වූ පාසල් ප්‍රතිසංස්කරණය හා ඉදිකිරීම | 400.00 | 200.00 | 200.00 | | | 800.00 |

| | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව | නව මිලදී ගැනීම් | නව ඉදිකිරීම් | ධාරිතා සංවර්ධනය | සංවර්ධන ආයෝජනය | එකතුව |
|---|---|---|---|---|---|---|
| **අයවැය යෝජනා 2016 හා 2017** | | | | | | |
| පිරිවෙන් යටිතල පහසුකම් හා ධාරිතා සංවර්ධනය | | | | 50.00 | | 50.00 |
| විශේෂ අධ්‍යාපනය සංවර්ධනය | | 144.00 | | 6.00 | | 150.00 |
| Tab පරිගණක ලබා දීම | 5,000.00 | | | | | 5,000.00 |
| ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය* | 1,370.00 | 1,500.00 | 4,139.00 | | | 7,009.00 |
| 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන | 1,000.00 | 2,135.00 | 1,468.00 | 205.00 | 192.00 | 5,000.00 |
| ප්‍රාථමික පාසල් 3577 ක පහසුකම් වැඩිදියුණු කිරීම * | 1,000.00 | 2,000.00 | 3,500.00 | | | 6,500.00 |
| සියලුම පාසල්වලට ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම * | | | 1,200.00 | | 2,608.00 | 3,808.00 |
| සියලුම පාසල්වලට විදුලි බලය සැපයීම* | | | | | 892.00 | 892.00 |
| වතු පාසල් 25ක් සංවර්ධනය * | 180.00 | 70.00 | | | | 250.00 |
| පාසල්වල විද්‍යා අධ්‍යාපනය නැංවීමට පහසුකම් සැපයීම * | | 200.00 | | | | 200.00 |
| දන්ත සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම* | 20.00 | | 30.00 | | | 50.00 |
| මෑත කාලීනව කිසිදු ව්‍යාපෘතියකට අයත් නොවූ පාසල් 1360 සංවර්ධනය * | 1,800.00 | 3,800.00 | 4,503.00 | | 150.00 | 10,253.00 |
| ගුරු නිවාස ඉදිකිරීම * | | | 577.00 | | | 577.00 |
| ජාතික උරුමයන් | 262.07 | 14.50 | 20.00 | 5.00 | 15.70 | 317.27 |
| විභාග දෙපාර්තමේන්තුව | | | | | 778.00 | 778.00 |
| අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | | | | | 83.50 | 83.50 |
| පුරා විද්‍යා දෙපාර්තමේන්තුව | | | | | 58.60 | 58.60 |
| ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | | | | | 233.10 | 233.10 |
| **එකතුව** | **13,782.90** | **12,439.14** | **20,174.54** | **1,166.27** | **6,167.77** | **53,730.62** |

මූලාශ්‍රය - අමාත්‍යාංශ ගිණුම් වාර්තා

* ළඟ ම පාසල හොඳ ම පාසල වැඩසටහනට ඇතුළත් ව්‍යාපෘති

## 3.4 "ළඟ ම පාසල හොඳ ම පාසල" ජාතික වැඩසටහන - දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

සමස්ත පාසල් පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2016 අයවැය සඳහා මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද රුපියල් බිලියන 64ක ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා 2017 වසර සඳහා වෙන් කරන ලද රුපියල් බිලියන 13ක ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 10කින් යුත් " ළඟ ම පාසල හොඳ ම පාසල " වැඩසටහන පළාත් සභා හා ඒකාබද්ධ ව ක්‍රියාත්මක කරන ලදි. මේවන විට පාසල් 8583ක් තුළ අවම වශයෙන් ව්‍යාපෘතිය ට අයත් එක් ක්‍රියාකාරකමක් හෝ වශයෙන් ක්‍රියාකාරකම් 18,684ක් සැලසුම් කර ක්‍රියාවට නංවමින් පවතී. මෙම සමස්ත වැඩසටහන රාජ්‍ය අරමුදල් ආයෝජනය කරමින් ක්‍රියාවට නැංවේ.

| විස්තරය | ඇස්තමේන්තු මුදල රු.මි. | 2017 සඳහා වෙන් වූ ප්‍රතිපාදන රු.මි. | 2017.12.31 දිනට සමුච්චිත වියදම රු.මි. |
|---|---|---|---|
| ගුරු අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම | 1,000 | 761.9 | 898.10 |
| ග්‍රාමීය හා දුෂ්කර පාසල් සඳහා ගුරු නිවාස ගුරු විවේකාගාර වැනි පහසුකම් සැලසීම | 2,000 | 577.0 | 119.00 |
| සියලු පාසල්වලට ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 4,000 | 3,808 | 3,652.91 |
| සියලු පාසල්වලට විදුලි බල පහසුකම් ලබා දීම | 2,000 | 892 | 1251.41 |
| ප්‍රාථමික පාසල් 3,577කට මූලික පහසුකම් ලබා දීම | 10,000 | 6,500 | 3863.43 |
| ද්විතීයික පාසල් 1000ක පහසුකම් සංවර්ධනය | 15,000 | 7,009 | 6722.01 |
| කිසිදු ව්‍යාපෘතියකට මෑතක දී අයත් නොවූ අ.පො.ස.(උ.පෙ.) සහිත පාසල් 1,360ක් සංවර්ධනය කිරීම | 30,000 | 10,253 | 7214.55 |
| වතු පාසල් 25ක් ද්විතීයික මට්ටමට උසස් කිරීම | 250 | 250 | 133.70 |
| විද්‍යාගාර නොමැති ද්විතීයික ශ්‍රේණි සහිත පාසල් 3,000කට ජංගම විද්‍යාගාර කට්ටල ලබාදීම | 450 | 200 | 0.00 |
| පාසල්වල දන්ත සෞඛ්‍ය ඒකක වැඩි දියුණු කිරීම | 250 | 50 | 94.56 |
| **එකතුව** | **64,950** | **30,300.9** | **23,949.67** |

## 3.5 දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීම (TSEP) - ලෝක බැංකු හා DFAT ආධාර ලද ව්‍යාපෘතිය

අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන යටතේ දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වේ. එහි ප්‍රධාන මූල්‍ය තොරතුරු පහත පරිදි දැක්විය හැකිය.

**TSEP - වැඩසටහන් කාල සීමාව - 2012 - 2017**

සමස්ත ආයෝජන - ඇ.ඩො.මි.100
ක්‍රියාත්මක වන දිනය - 2012, ජනවාරි

**DAFT - වැඩසටහන් කාල සීමාව- 2012 - 2017**

සමස්ත ආයෝජන - ඇ.ඩො.මි.100
ක්‍රියාත්මක වන දිනය - 2012, ජනවාරි

**ආයෝජන කොටස: පළාත් මට්ටම -** මුළු වාර්ෂික වෙන්කිරීමෙන් 70% - 80%
**ජාතික මට්ටම -** මුළු වාර්ෂික වෙන්කිරීමෙන් 20% - 30%

**3.5.1. වගුව : 2017 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශයට මුදල් වෙන්කිරීම—TSEP**

| වැඩසටහන | රු.මි. |
|---|---|
| ගොඩනැගිලි අලුත්වැඩියා හා ඉදිකිරීම් | 293 |
| ලී බඩු උපකරණ | 30 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 23 |
| ආයෝජන (අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනෙකුත් ආයතන) | 231 |
| එකතුව | 577 |



මූලාශ්‍රය:අමාත්‍යාංශ ගිණුම් වාර්තා

## TSEP යටතේ ලබාගත් ප්‍රතිඵල

- **11 ශ්‍රේණිය දක්වා රැඳීසිටීමේ අනුපාතය (Survival Rate) ඉහළ නැංවීම**

  රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන් යන සමස්තයේ ම සිටින සිසුන්ගෙන් 11 ශ්‍රේණිය දක්වා රැඳීසිටීමේ අනුපාතය 88% දක්වා රැගෙන ඒමට සමත්ව ඇත. එහිදී පිරිමි සිසුන් 85% ක් ද ගැහැණු සිසුන් 90% ක් ද ලෙස 11 ශ්‍රේණිය දක්වා රැඳීසිටින බව සංඛ්‍යා දත්ත හරහා පැහැදිලි වේ.

- **ප්‍රධාන විෂයයන්ගේ ඉගෙනුම්ඵල පදනම් කරගත් ජාතික තක්සේරුව සිදුකිරීම**

  8 ශ්‍රේණිය සඳහා වන ජාතික තක්සේරුව (National Assessment) 2012/13, 2014/15 හා 2016/17 යන වසර පදනම් කරගනිමින් සිදුකර අවසන් ය. එමෙන් ම 4 ශ්‍රේණිය සඳහා වන 2013/14 හා 2015/16 වසර පදනම් කරගත් ජාතික තක්සේරුව ද මේ වන විට සිදුකර අවසන් ය.

- **සියලු ම අධ්‍යාපන කලාපවල පාසල් නඟාසිටුවීමේ වැඩසටහන (PSI) ක්‍රියාත්මක කිරීම**

  ලංකාවේ සියලු ම පාසල්වල පාසල් නඟාසිටුවීමේ වැඩසටහන් (PSI) චක්‍රය අනුගමනය කරනු ලබයි. මීට පහසුකම් සලසමින් ක්‍රියාත්මක කිරීමේ අදියරේදී භාවිතා වන මාර්ගෝපදේශ හා අත්පොත සකස්කර බෙදාහැරීම අවසන් කර ඇත.

- **සියලු ම අධ්‍යාපන කලාපවල පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන (SBTD) ක්‍රියාත්මක කිරීම**

  වර්තමානය වන විට ලංකාවේ සියලු ම පාසල්වල පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන (SBTD) හඳුන්වා දී තිබෙන අතර එය මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

- **පාසල් ඉගෙනුම් පරිසරය සංවර්ධනය කිරීමේ වැඩසටහන**

  මෙම ඉලක්කය යටතේ තාක්ෂණ විද්‍යාගාර 175ක් (පළාත් මට්ටමෙන් - 135 + ජාතික මට්ටමෙන් - 40) ගොඩනැංවීම කර අවසන් ඇති අතර පංති කාමර ගොඩනැගිලි 743 ක් සම්පූර්ණයෙන් ම ගොඩනංවා අවසන් ය. මීට අමතර ව පංති කාමර ගොඩනැගිලි 538 ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඇති අතර කලාප කාර්යාල 42 ක හා කොට්ඨාස කාර්යාල 68 ක නව ගොඩනැංවීම් කටයුතු සිදු කෙරේ.

- **ඉගෙනුම් සංවර්ධන වැඩසටහන්**

  සමස්තයක් ලෙස TSEP වැඩසටහන පසුගිය වසර කීපය තුළ විෂයානුබද්ධ වැඩසටහන් රාශියක් ද ක්‍රියාත්මක කෙරුණි. එහිදී ගුණාත්මක බවින් ඉහළ පෙළපොත් ලබාදීම සඳහා පෙළපොත් රචකයන් වෙනුවෙන් ධාරිතා සංවර්ධන වැඩසටහන්, පර්යේෂණ, ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය පෙළපොත් ලබාදීම හා අනෙකුත් අවශ්‍ය පහසුකම් ලබාදීම සිදුවිය. එමෙන් ම ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ විෂය මාලාව සංශෝධනය කර සංවර්ධන කටයුතු කරන ලදි. ඒ අනුව පළමු හා දෙවන වසර ගුරු මාර්ගෝපදේශයන් ද 6, 8 හා 12 ශ්‍රේණිවල ගුරු මාර්ගෝපදේශයන් ද සකස්වීම සිදුවිය. මීට අමතරව 6, 7, 10 හා 11 යන ශ්‍රේණිවල ගණිතය හා විද්‍යාව සඳහා නව විෂය නිර්දේශයක් සකසන ලද අතර 9, 12 හා 13 ශ්‍රේණි සඳහා වන විෂය නිර්දේශයන් ද සංශෝධනය කරන ලදි. මීට අමතරව විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනයට දේශිය හා විදේශීය පුහුණු අවස්ථා ලබාදීම ද සිදුවිය.

## 3.6 අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන - ආසියානු සංවර්ධන බැංකු ආධාර (ESDP/ ADB)

අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහනට සහය ලබාදීම හා ද්විතීයික අධ්‍යාපනය අවසන් කරන්නන් සඳහා සේවා නියුක්ති අවස්ථා ඉහළ නැංවීමට හැකි නවීන ද්විතීයික අධ්‍යාපන ක්‍රමයක් සංවර්ධනය කිරීම, අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනේ (ESDP) ප්‍රධාන අරමුණු වේ .

වැඩසටහනේ කාල සීමාව - 2013 - 2017
සමස්ත ආයෝජනය - ඇ.ඩො.මි. 200

**3.6 වගුව : ESDP සඳහා ප්‍රාග්ධන මුදල් වෙන්කිරීම - 2017**

| වැඩසටහන | වෙන් කළ මුදල රු.මි. |
|---|---|
| ගොඩනැගිලි අලුත්වැඩියා | 500.00 |
| නව ගොඩනැගිලි ඉදිකිරීම් | 1,110.50 |
| නව ලී බඩු හා උපකරණ | 1,523.00 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 659.05 |
| **එකතුව** | **3,792.56** |

මූලාශ්‍රය: අමාත්‍යාංශ ගිණුම් වාර්තා

රැකියා වෙළඳපොළට අවශ්‍ය කුසලතා පිරි තරුණ තරුණියන් බිහිකරන නවීකෘත ද්විතීයික අධ්‍යාපන පාසල් පද්ධතියක් බිහිකිරීම හා එමගින් තරුණ රැකියා නියුක්තිය ඉහළ නැංවීම වැඩසටහනින් අපේක්ෂා කෙරේ.

මේ සඳහා රජය හා ආසියානු සංවර්ධන බැංකුව එකඟතාවකින් යුතු ව මුදල් ආයෝජනය හා බැඳි ප්‍රතිඵල (Disbursement Linked Results) 9 ක් හඳුනාගෙන ඇත.

1. **අ.පො.ස. (සා.පෙළ)** සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම
2. **අ.පො.ස. (උ.පෙළ)** සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම
3. **අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණ විෂයධාරාව හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම**
4. **කලා, වාණිජ හා විද්‍යා විෂය ධාරා තුන ම ඇතුළත් වන සේ ද්විතීයික පාසල් උසස් කිරීම**
5. **අ.පො.ස. (උ.පෙළ) විද්‍යා විෂය ධාරාව සඳහා ශිෂ්‍ය ඇතුළත් වීම ඉහළ** නැංවීම
6. **අ.පො.ස. (උ.පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා ශිෂ්‍ය ඇතුළත් වීම ඉහළ යාම**
7. **විදුහල්පතිවරුන්ගේ හා නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය**
8. **ජාතික හා පළාත් මට්ටමේ ආයතනික ධාරිතා සංවර්ධනය හා ESDFP මූල්‍යකරණය ශක්තිමත් කිරීම**
9. **ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිද භාවය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.**

මෙම ප්‍රතිඵල මැන බැලීම සඳහා ප්‍රතිඵල පාදක දර්ශක (Disbursement Linked Indicators) 33ක් හඳුනා ගෙන ඇත.

### 3.6.1. මූල්‍ය ප්‍රේෂණය සඳහා පදනම් කරගත් ප්‍රතිඵල ළඟා කර ගැනීම (Disbursement Linked Results)

**1. අ.පො.ස. (සා.පෙළ) සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම**

මේ සම්බන්ධ DLR ඉලක්කය 70% ලෙස සංශෝධනය කරන ලද අතර ඒ අනුව 2017 වසරේදී සංශෝධනය කරන ලද ඉලක්කයට අනුව 70.02% දක්වා සමත් ප්‍රතිශතය ඉහළ නංවාගැනීමට හැකි විය.

**2. අ.පො.ස. (උ.පෙළ) සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම**

2017 වසරේදී DLR ඉලක්කයට අනුව 66.02% දක්වා ඉහළ නංවාගැනීමට හැකි විය. පෙර වර්ෂය සාපේක්ෂව මෙය 2.66%න් සමත් ප්‍රතිශතය ඉහළ නැංවීමකි.

**3. අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණ විෂයධාරාව හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම**

මෙම DLR ඉලක්කය සම්පූර්ණයෙන් ම අත්පත් කර ගනිමින් මේ වන විට අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණ විෂයධාරාව ක්‍රියාත්මක වේ. මේ සමග සම්බන්ධ තාක්ෂණ පීඨයන්ගේ ගොඩනැංවීමේ කටයුතු අවසන් අදියරේ පවතින අතර එම තාක්ෂණ පීඨයන්ගෙන් 247 ක වැඩ අවසන්ව පවතී. ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය සඳහා පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගුරුවරුන් බඳවාගැනීම අවසන් කර ඇත.

**4. කලා, වාණිජ හා විද්‍යා විෂයධාරා තුන ම ඇතුළත් වන සේ ද්විතීයික පාසල් උසස් කිරීම**

මෙම DLR ඉලක්කය අත්පත් කර ගනිමින් පාසල් 255 ක අ.පො.ස. (උ.පෙළ) විද්‍යා විෂය ධාරාව ආරම්භ කිරීමට අවශ්‍ය භෞතික පහසුකම් සපයා ඇති අතර පාසල් දහසේ ව්‍යාපෘතිය යටතේ විද්‍යාගාර ලබාදීම අවසන් කර ඇත. මෙලෙස අලුතින් විද්‍යා විෂය ධාරාව ස්ථාපිත කරන ලද පාසල්වල අලුතින් සිසුන් 3729 විද්‍යා විෂය ධාරාව සඳහා බඳවාගෙන ඇත. රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය හා ජීව විද්‍යාව සඳහා පවතින ගුරු පුරප්පාඩු හඳුනාගෙන ඇති අතර එම පුරප්පාඩුව පිරවීමට මේ වන විට කටයුතු කරමින් සිටී.

**5. අ.පො.ස. (උ.පෙළ) විද්‍යා ශිෂ්‍ය ඇතුළත් වීම ඉහළ නැංවීම**

මේ සම්බන්ධයෙන් ඇති ඉලක්කය වන්නේ අ.පො.ස. (උ.පෙළ) විද්‍යා ශිෂ්‍ය ඇතුළත් වීම 28% දක්වා ඉහළ නැංවීමයි. ඒ අනුව 2015 වසරේදී එම ප්‍රතිශතය 24.45% වන අතර 2016 වසරේදී එම ප්‍රතිශතය 22.36% මට්ටමින් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව මෙම DLR ඉලක්කය ළඟා කර ගැනීමට තව දුරටත් ක්‍රියාත්මක විය යුතුය.

**7. විදුහල්පතිවරුන්ගේ හා නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය**

පාසල් නායකත්ව පුහුණුව හා කළමනාකරණය සඳහා වන ජාතික නිපුණතා රාමුව ( National Competency Framework for School Leadership Training & Management) මේ වන විට අනුමත වී ඇත. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් (TOT) ඌව හා මධ්‍යම පළාත් කේන්ද්‍ර කරගනිමින් පවත්වා ඇති අතර විදුහල්පතිවරු පුහුණු කිරීම 2018 ජනවාරි මස ආරම්භ කිරීමට නියමිතය.


**8. ජාතික හා පළාත් මට්ටමේ ආයතනික ධාරිතාව මෙන් ම ESDFP මූල්‍යකරණය ශක්තිමත් වීම**

2018 වසරේ පළාත් 9 සඳහා වන කාර්යය සාධනය පදනම් කරගත් සහයෝගිතා ගිවිසුම (Performance-Based Partnership Agreement) සංශෝධනය කර සකස්කර අවසන් ය. ඒ අනුව 2018 වසරේ කාර්යය සාධනය පදනම් කරගත් සහයෝගිතා ගිවිසුම් කටයුතු සඳහා රු.මි. 315 වෙන්කර ඇත.

**9. ඉහළ විනිවිද භාවයෙන් යුත් කාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රියාවලියක්**

විනිවිදභාවය දියුණු කිරීමට ප්‍රසම්පාදන අත්පොත (Procurement Manual) මේ වන විට සකස්කර අවසන් ය. මේ අනුව සරල ලෙස ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මාර්ගෝපාදේශයන් ඇතුළත් මෙම අත්පොත විශේෂ කමිටුවක අනුමැතියෙන් පසුව මුද්‍රණය කිරීමට නියමිත ය.

**3.6.1. ප්‍රස්තාරය : ESDP ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය 2014 - 2017**




**මූලාශ්‍රය : ESDP ප්‍රගති වාර්තාව**

## 3.7 ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව මගින් සම්බන්ධීකරණය කළ වැඩසටහන්

* කාලගුණික විපර්යාසවලට අනුව කඩොලාන පරිසර පද්ධතියේ හැඩගැසීම පිළිබඳ අධ්‍යයනයක් රුහුණු විශ්ව විද්‍යාලය මගින් ද ද ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල උපාධිධාරීන් පිළිබඳ අධ්‍යයනයක් විශ්ව විද්‍යාල කොමිෂන් සභාව මගින් ද සිදුකිරීමට සහය ලබාදීම සිදුවිය.

* මීට අමතරව විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සමානාත්මතාව හා සාධාරණත්වය සවිබලගැන්වීමට නැගෙනහිර විශ්ව විද්‍යාලය සමග එක්ව කටයුතු කරන ලදි.

* රජයේ හා අධ්‍යාපන ආයතනවල විවිධ අංශයන්හි නිලධාරීන්ට විදේශ පුහුණු වීම්, සම්මන්ත්‍රණ හා නියෝජනයන් සඳහා සහභාගිවීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම.

* කඩොලාන සංරක්ෂණ පිළිබඳ ව සම්මන්ත්‍රණ, රූපවාහිනි වැඩසටහන් හා පාසල් සිසුන් සඳහා තරග සංවිධානය කිරීම.

* 2017 වසරේ ගංවතුරින් විපතටපත් පාසල් පුනරුත්ථාපනය කිරීමට සහය ලබාදීම සිදුවිය. එහිදී ගංවතුරින් විපතට පත් පාසල්හි විද්‍යාගාර සඳහා උපකරණ ලබාදීමේ කටයුතු මේ යටතේ සිදුවිය.

* යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල මගින් අවශ්‍යතා සහිත සිසුන් 34 දෙනෙකුට ශිෂ්‍යත්ව පිරිනැමීම.

*තොරතුරු තාක්ෂණ අධ්‍යාපන සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය හා සැලැස්ම සැකසීම සඳහා පහසුකම් සැපයීම යුනෙස්කෝව මගින් සිදුකෙරිණි.

* දරුවන්ගේ කලා කුසලතා දියුණු කිරීම සඳහා "ඉනික්කි ෆෙස්ටා" (Enikki Festa) නැමැති වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

## 3.8 ඉන්දියන් රජයේ ආධාර ලබන වැඩසටහන්

- උතුරු පළාතේ පාසල් 27ක නවීකරණ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.
- පොළොන්නරුවේ ත්‍රෛභාෂා බහුවාර්ගික පාසල ඉදිකිරීමේ මූලික කාර්යයන් ආරම්භ කර ඇත.
- පුස්සැල්ලාව සරස්වතී විද්‍යාලය උසස් මට්ටමට වැඩිදියුණු කිරීම ආරම්භ කර ඇත.

## 3.9 UNICEF ආධාර ලද වැඩසටහන්

2017 වර්ෂයේ යුනිසෙෆ් වැඩසටහන් සඳහා ලද ප්‍රතිපාදන රු.මි. 15.00කි.

**ක්‍රියාත්මක කළ වැඩසටහන්.**

- පළාත්වල පූර්ව ළමාවිය අධ්‍යාපන බලධාරීන්ගේ හා ප්‍රාථමික අධ්‍යාපන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය.
- පූර්ව ළමාවිය විෂයමාලා රාමුව සකස් කිරීම.
- ප්‍රාථමික ගණිතය හා භාෂාව සඳහා සායනික ඉගැන්වීමට අදාළ ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම.
- ගැටලු විසඳීම, සමාජ සංහිඳියාව, කාලගුණ වෙනස් වීම්, ආපදා අඩු කිරීම, පාසල් සුරක්ෂිතභාවය යන සංකල්ප ශක්තිමත්වන සේ ප්‍රාථමික විෂයමාලාව සකස් කිරීම.

## 3.10 දේශීය හා විදේශීය ආධාර ආයෝජන සාරාංශය

2017 වසරේ අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා විදේශාධාර ව්‍යාපෘති යටතේ සිදුකරන ලද ප්‍රාග්ධන වෙන්කිරීම් පහත පරිදි විය.

**3.10.1. වගුව : විදේශාධාර ව්‍යාපෘති යටතේ ප්‍රාග්ධන වියදම්**

| මූල්‍ය ප්‍රභවය | රු.මි. |
|---|---:|
| TSEP- ලෝක බැංකුව | 577.00 |
| යුනෙස්කෝ | 15.00 |
| ESDP - ආසියානු සංවර්ධන බැංකුව | 3,792.56 |
| GIZ - ජර්මානු රජය | 25.87 |
| ඉන්දියානු රජයේ අධාර | 246.00 |
| යුනිසෙෆ් | 12.30 |
| වෙනත් ( UNFPA / FAO ) | 25.87 |
| **එකතුව** | **4,694.60** |



# 04.

# ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයේ සම සාධාරණ ප්‍රවේශය සහ සහභාගිත්වය සහතික කිරීම

## 4.1 "ළඟ ම පාසල හොඳ ම පාසල" ජාතික වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය

**A ව්‍යාපෘතිය**

එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අවම වශයෙන් පාසල් 2ක් වන සේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් ම තෝරා ගත් පාසල් 600ක් පමණ අංග සම්පූර්ණ ලෙස සංවර්ධනය කිරීම.

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2016-2020 | 2016-2017 ආරම්භ කළ | 2017.12.31 වන විට අවසන් කළ |
| ප්‍රධාන අලුත්වැඩියා | 515 | 232 | 106 |
| සුළු අලුත්වැඩියා | 523 | 434 | 237 |
| සෞන්දර්යය ඒකක | 54 | 33 | 3 |
| විදුහල්පති නිල නිවාස | 351 | 217 | 22 |
| ගුරු නිවාස | 251 | 147 | 4 |
| පන්තිකාමර ගොඩනැගිලි | 526 | 397 | 188 |
| කණිෂ්ඨ ද්විතියික විද්‍යාගාර | 152 | 85 | 7 |
| ආපන ශාලා | 150 | 79 | 3 |
| ක්‍රීඩා සංකීර්ණ | 57 | 21 | 0 |



මාලිගාතැන්න මහ විද්‍යාලය - මොනරාගල



බණ්ඩාරගම මහ විද්‍යාලය - ඇහැටුවැව



හාලි ඇල දෙමළ විද්‍යාලය - බදුල්ල



රඹුක විද්‍යාලය - නිවිතිගල



තේවරෙයාලි හින්දු විද්‍යාලය - වඩමාරච්චි



ජයන්ති මහ විද්‍යාලය - ඇඹිලිපිටිය

**B ව්‍යාපෘතිය**
මැත කාලීනව කිසිදු ව්‍යාපෘතියකට අයත් නොවූ අ.පො.ස.(උ.පෙළ.) සහිත පාසල් 1,200ක් පමණ සංවර්ධනය කිරීම.

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2016-2020 | 2016-2017 ආරම්භ කළ | 2017.12.31 වන විට අවසන් කළ |
| සුළු අලුත්වැඩියා | 1072 | 914 | 482 |
| තාක්ෂණ ගොඩනැගිලි | 330 | 248 | 14 |
| කණිෂ්ඨ ද්විතියික විද්‍යාගාර | 194 | 155 | 10 |
| ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන | 531 | 413 | 76 |



බණ්ඩාරවෙල දෙමළ මහ විද්‍යාලය



ඇල්ල මහ විද්‍යාලය - බදුල්ල



තිස්ස මහ විද්‍යාලය - උස්ගල



ගනන්ගමුව ප්‍රාථමික විද්‍යාලය - කුරුණෑගල



කාන්තපුරම් වානි විද්‍යාලය

**C ව්‍යාපෘතිය**
ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීම වැඩසටහනට අයත් වූ පාසල් සංවර්ධනය

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2016-2020 | 2016-2017 ආරම්භ කළ | 2017.12.31 වන විට අවසන් කළ |
| පාසල් අලුත්වැඩියා | 527 | 220 | 115 |
| පන්ති කාමර ගොඩනැගිලි | 137 | 66 | 10 |


රාමක්‍රිෂ්ණා මධ්‍ය මහා විද්‍යාලය - ගලහ


රත්තොට දෙමළ විද්‍යාලය - මාතලේ

**D ව්‍යාපෘතිය**
ප්‍රාථමික පාසල් 3,600ක් සංවර්ධනය කිරීම

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2016-2020 | 2016-2017 ආරම්භ කළ | 2017.12.31 වන විට අවසන් කළ |
| ප්‍රාථමික පාසල් අලුත්වැඩියා | 3340 | 2775 | 2047 |
| තනිමහල් ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන | 270 | 205 | 65 |
| දෙමහල් ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන | 250 | 185 | 24 |


වෙලනි දකුණ අයියනාර් විද්‍යාලය - යාපනය


ගිරිබාව ප්‍රාථමික විද්‍යාලය - මහව

**E ව්‍යාපෘතිය**
ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවලට ප්‍රමුඛත්වය දෙමින් පාසල්වලට විදුහල්පති නිල නිවාස, ගුරු නිවාස, විවේක කාමර ආදී පහසුකම් ලබා දීම

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2016-2020 | 2016-2017 ආරම්භ කළ | 2017.12.31 වන විට අවසන් කළ |
| ගුරු නිවාස හා ගුරු විවේකාගාර | 607 | 271 | 121 |



රිදී මාලියද්ද මහ විද්‍යාලය - බදුල්ල



ඇල්ල මහ විද්‍යාලය - බදුල්ල

**F ව්‍යාපෘතිය**
සියලු ම පාසල්වලට ජල හා වැඩි දියුණු කළ සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබා දීම දිවයිනේ සෑම පාසලකට ම ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම.

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2016-2020 | 2016-2017 ආරම්භ කළ | 2017.12.31 වන විට අවසන් කළ |
| ජල පහසුකම් | 2474 | 787 | 217 |
| සනීපාරක්ෂක පහසුකම් | 4220 | 3634 | 2167 |



අග්‍රාමාත්‍ය මහ විද්‍යාලය - පන්නිපිටිය



නැඩුම්කේනි මහ විද්‍යාලය - වව්නියාව

**G ව්‍යාපෘතිය**
සියලු ම පාසල්වලට විදුලිය ලබා දීම සෑම පාසලකට ම ජාතික විදුලි පද්ධතිය හරහා හෝ සූර්ය බලය මගින් විදුලිය ලබා දීම.

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2016-2020 | 2016-2017 ආරම්භ කළ | 2017.12.31 වන විට අවසන් කළ |
| විදුලි බලය | 4944 | 1658 | 1299 |



මහුමාලි රෝමානු කතෝලික දෙමළ විද්‍යාලය - කිලිනොච්චි



කල්මදුකුලම් දෙමළ විද්‍යාලය - විශ්වමඩු

**H ව්‍යාපෘතිය**
වතුකරයේ පාසල් 25ක් ද්වීතියික මට්ටමට උසස් කර උසස් පෙළ විද්‍යා අධ්‍යාපනය සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම.

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2016-2020 | 2016-2017 ආරම්භ කළ | 2017.12.31 වන විට අවසන් කළ |
| වතු පාසල් අලුත්වැඩියා | 22 | 20 | 4 |
| නව ඉදිකිරීම් | 8 | 8 | 2 |



තලවකැලේ දෙමළ මහ විද්‍යාලය




ශාන්ත මරියා විද්‍යාලය - යටියන්තොට

**J ව්‍යාපෘතිය**
පාසල්වල දන්ත සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම.

පාසල් සිසුන්ගේ මුඛ සෞඛ්‍ය පරීක්ෂා කිරීම සහ අවශ්‍ය ප්‍රතිකර්ම කිරීම සඳහා පහසුකම්වලින් සමන්විත දන්ත සායන පාසල්වලට ලබා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණ යි.

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2016-2020 | 2016-2017 ආරම්භ කළ | 2017.12.31 වන විට අවසන් කළ |
| දන්ත සෞඛ්‍ය අලුත්වැඩියා | 170 | 122 | 70 |
| නව ඉදිකිරීම් | 30 | 20 | 4 |


සරස්වතී මහා විද්‍යාලය - බදුල්ල


බලල්ල මහා විද්‍යාලය - මහව

## 4.2 පාසල් සංවර්ධන වැඩසටහන්

### 4.2.1 ජාතික පාසල් සංවර්ධනය

**භෞතික සම්පත් සංවර්ධනය**

- ජාතික පාසල් විසින් කරන ලද ඉල්ලීම් අනුව රු.මි.75ක වටිනාකමින් යුත් පන්ති කාමර සඳහා අවශ්‍ය සිසු හා ගුරු පුටු මේස, වයිට් බෝඩ් සහ කාර්යාල ලී බඩු හා උපකරණ බෙදාදීම.
- රු.මි.40ක වටිනාකමින් යුත් ෆැක්ස් යන්ත්‍ර, ඩුප්ලෝ යන්ත්‍ර ජාතික පාසල්වල අවශ්‍යතාවය අනුව බෙදාදීම.
- ජාතික පාසල් 353 සඳහා ලීබඩු උපකරණ අලුත්වැඩියාවට රු.මි.30ක් ද, ද්විතීයික අංශයේ ගුණාත්මක යෙදවුම් සඳහා රු.මි.25ක මුදලක් ද ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගනිමින් බෙදා දීම.
- පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධනය සඳහා (SBLIG) රු.මි.211ක ප්‍රතිපාදන ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් ව පාසල් 353ක් අතර බෙදා දීම.

**පහසුකම් සපිරි ජාතික පාසල් අලුතින් ඉදිකිරීම**

- ජන ඝණත්වය වැඩි දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් පහසුකම් සපිරි ජාතික පාසල් අලුතින් ඉදි කිරීම සඳහා පියවර ගනිමින් පවතී.
- කුරුණෑගල දිස්ත්‍රික්කය

  පළමු පියවර වශයෙන් මිශ්‍ර පාසලක් ලෙස 1-13 ශ්‍රේණි සඳහා කුරුණෑගල මගුරුඔය වත්තේ අක්කර 5ක භූමියක රුපියල් මිලියන 1,000ක පමණ ඇස්තමේන්තුවකින් නව ජාතික පාසලක් ඉදි කිරීමට මුල් ගල තබන ලදී.
- පොළොන්නරුව දිස්ත්‍රික්කය

  බහුවාර්ගික ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත 6-13 නව ජාතික පාසලක් ඉන්දියානු ජනරජයේ ද මූල්‍යාධාර සහිත ව ආදර්ශ පාසලක් ලෙස ඉදිකිරීමට සැලසුම් කර ඇත.

**ශිෂ්‍ය සම්මන්ත්‍රණ**

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල වර්ධනය කිරීමේ අරමුණින් විභාග සම්මන්ත්‍රණ පැවැත්වීමට ප්‍රධාන විෂයයන් සඳහා විභාග දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සංයුක්ත තැටි සකස් කර කලාප අධ්‍යක්ෂකවරුන් මගින් පාසල් වෙත ලබා දීම.

**ජාතික පාසල් ගුරු මාරු ක්‍රියාත්මක කිරීම**

- එකම ජාතික පාසලේ වසර 10ක් සම්පූර්ණ කරන ලද ගුරුවරුන් ස්ථාන මාරු කිරීම, මාරු මණ්ඩල හරහා ආරම්භ කරන ලදී.
- පළමු අදියර යටතේ උසස් පෙළ ගුරුවරුන් 3,120 දෙනෙකුගෙන් 2,590ක් සඳහා ස්ථාන මාරුවීම් ලබා දුනි.
- දෙවන අදියර යටතේ ප්‍රාථමික ගුරුවරුන් 2,408 දෙනෙකුගෙන් 1,679ක් සඳහා 2018 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරුවීම් ලබා දුනි.
- තුන් වන අදියර යටතේ 6-11 ශ්‍රේණිවල ගුරුවරුන් 7,951ක් සඳහා ස්ථාන මාරු ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
- වාර්ෂික ස්ථාන මාරු යටතේ 2017 වර්ෂය සඳහා අයදුම්පත් 3,219ක් ලැබූ අතර ඉන් 2,422ක් සඳහා ස්ථාන මාරු ලබා දීම සිදුවිය.



පොළොන්නරුව ත්‍රිභාෂා පාසල් ආකෘතිය



කුරුණෑගල ජාතික පාසල් ආකෘතිය

## 4.2.2 වතු පාසල් සංවර්ධනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් සංඛ්‍යාව |
| --- | --- | --- |
| පාසල් කළමනාකරණය හා නායකත්වය | විදුහල්පතිවරු 69ක් | එක් වැඩසටහනක් |
| ඉගෙනුම් ක්‍රමවේද සංවර්ධනය | අ.පො.ස.(සා/පෙළ)<br>විද්‍යා ගුරුවරුන් 45<br>ඉංග්‍රීසි ගුරුවරුන් 34 | වැඩසටහන් 2ක් |
| ඉගෙනුම් ක්‍රමවේද අභිප්‍රේරණය | ප්‍රාථමික ගුරුවරුන් 34 | එක් වැඩසටහනක් |

**විෂයය සංවර්ධන වැඩසටහන්**

වතු පාසල් සිසුන්ගේ ගණිත සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා පුහුණු මොඩියුලයක් සකස් කිරීම සඳහා වැඩසටහනක් පැවැත්වීම.

**භෞතික සංවර්ධනය**

මධ්‍යම, බස්නාහිර, ඌව, දකුණ හා සබරගමු පළාත් 5හි තෝරා ගත් වතු පාසල් 32ක යටිතල පහසුකම් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක අතර මෙහි දී පාසල් ගොඩනැගිලි ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම, ගුරු නිවාස ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම, විද්‍යාගාර හා පරිගණක විද්‍යාගාර ඉදිකිරීම හා ජල පහසුකම් ලබා දීමට අදාළ ඉදිකිරීම් ද මේ යටතේ සිදු වේ. පන්ති කාමර හා කාර්යාලීය උපකරණ සැපයීම යටතේ මෙම පාසල් 32 සඳහා ලැප්ටොප් පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ලබා දීම සිදුවේ.

### 4.2.3 දෙමළ පාසල් සංවර්ධනය

ධාරිතා සංවර්ධන වැඩසටහන්

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| දෙවන ජාතික භාෂාව ලෙස සිංහල භාෂාව භාවිත හැකියාව සිසුන් තුළ වර්ධනය කිරීම | උතුරු පළාතේ පාසල්වල 6 - 11 ශ්‍රේණිවල සිංහල උගන්වන ස්වෙච්ඡා ගුරුවරුන් 378ක් | කලාප මට්ටමින් වැඩසටහන් 12ක් |
| | නැගෙනහිර පළාතේ පාසල්වල 6 - 11 ශ්‍රේණිවල සිංහල උගන්වන ගුරුවරුන් 449ක් | කලාප මට්ටමින් වැඩසටහන් 12ක් |
| සීමාවාසී විද්‍යාපීය ගුරුවරුන්ගේ ධාරිතා වර්ධනය | යාපනය අධ්‍යාපන විද්‍යාපීඨයේ සීමාවාසී විද්‍යාපීය ගුරුවරුන් 100ක් | දෙදින වැඩසටහනක් |
| දෙමළ මාධ්‍ය විෂයයන් උගන්වන ගුරුවරුන් ගේ ධාරිතා වර්ධනය | පුත්තලම හා නිකවැරටිය අධ්‍යාපන කලාපවල දෙමළ මාධ්‍ය ගුරුවරුන් | තෙදින වැඩසටහනක් |

### 4.2.4 මුස්ලිම් පාසල් සංවර්ධනය

ධාරිතා සංවර්ධන වැඩසටහන්

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| අ.පො.ස.(සා/පෙළ) ප්‍රතිඵල අඩු සාධන මට්ටම් පවතින අධ්‍යාපන කලාපවල ගණිතය, විද්‍යාව ඉංග්‍රීසි විෂයයන් උගන්වන දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගේ කුසලතා වර්ධනය | ගණිතය, විද්‍යාව ඉංග්‍රීසි විෂයයන් උගන්වන දෙමළ මාධ්‍ය ගුරුවරුන් 493ක් | වයඹ, බස්නාහිර, දකුණ, නැගෙනහිර, උතුරු මැද, උතුර සහ මධ්‍යම යන පළාත් 7හි තෙදින වැඩමුළු 9ක් |
| ඉස්ලාම් විෂයය ඉගැන්වීමේ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ඉගෙනුම් ආධාරක නිර්මාණය කිරීම | ඉස්ලාම් විෂයය උගන්වන ගුරුවරුන් | දෙදින වැඩමුළු 3ක් |
| අධ්‍යාපනයේ නව ප්‍රවනතා පිළිබඳ දැනුම්වත් කිරීම | කැබිතිගොල්ලෑව කලාපයේ අංශ ප්‍රධානීන් 60ක් | තෙදින වැඩමුළුවක් |
| | පොළොන්නරුව කලාපයේ විදුහල්පතිවරු හා නියෝජ්‍ය විදුහල්පතිවරු 60ක් | තෙදින වැඩමුළුවක් |
| | කළුතර අධ්‍යාපන කලාපයේ මුස්ලිම් පාසල්වල විදුහල්පතිවරුන් හා අංශ ප්‍රධානීන් 40 | දෙදින වැඩමුළුවක් |
| | පුත්තලම අධ්‍යාපන කලාපයේ විදුහල්පතිවරු හා නියෝජ්‍ය විදුහල්පතිවරු 72ක් | තෙදින වැඩමුළුවක් |
| දෙමළ, ඉතිහාසය හා ආගම උගන්වන දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගේ කුසලතා වර්ධනය කිරීම | මන්නාරම අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් 60ක් | තෙදින වැඩමුළුවක් |
| මුස්ලිම් පාසල් සිසුන්ගේ සෞන්දර්යය හැකියාවන් වර්ධනය කිරීම සඳහා විශේෂිත සංගීත තරඟාවලිය | අදාළ ගුරුවරුන් | දෙදින වැඩමුළු 2ක් |






### 4.2.5 පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් සම්බන්ධීකරණය

- පළාත් 9හි ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්, සහාය නිලධාරීන් හා සියලුම අනුමත පෞද්ගලික පාසල් විදුහල්පතිවරුන්, කළමනාකරුවන් හා කාර්යමණ්ඩලය දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- රජයේ අනුමත පෞද්ගලික පාසල් 26ක් අධීක්ෂණය කර අවශ්‍ය මග පෙන්වීම් ලබා දීම.
- රජයේ අනුමත ආධාර ලබන පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ට අංක 19/2017 චක්‍රලේඛය නිකුත් කරමින් 2017 අයවැයෙන් යෝජිත අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ වරප්‍රසාද ලබාදීම.
- රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට අදාළ චක්‍රලේඛ හා උපදෙස් ලිපි ඇතුළත් පොතක් මුද්‍රණය කර අදාළ පාර්ශවයන්ට ලබා දීම.
- ආධාර ලබන පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ට 2017 අයවැයෙන් යෝජිත රාජ්‍ය සේවක දේපළ ණය හා ආපදා ණය වරප්‍රසාද ලබා දීම සඳහා අයවැය දෙපාර්තමේන්තුව රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය, රාජ්‍ය බැංකු හා ගණකාධිකාරීවරුන් සමග සාකච්ඡාකර අදාළ චක්‍රලේඛය කෙටුම්පත් කිරීම.
- දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ජාත්‍යන්තර පාසල් පිළිබඳ තොරතුරු රැස්කිරීම.
- ජාත්‍යන්තර පාසල් සඳහා අවශ්‍ය පෙළ පොත් මුද්‍රණය කළ හැකි වන පරිදි ජාත්‍යන්තර පාසල් පිළිබඳ තොරතුරු ප්‍රකාශන දෙපාර්තමේන්තුවට ලබා දීමේ සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- ජාත්‍යන්තර පාසල් සම්බන්ධව රෙගුලාසි සැකසීම ආරම්භ කිරීම.

### 4.2.6 පාසල් නගා සිටුවීමේ වැඩසටහන, ශිෂ්‍යත්ව වැඩසටහන හා පාසල් කටයුතු සම්බන්ධීකරණය

- ජාතික පාසල්වල ඉගෙනුම ලබන 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වධාරීන් 72480ක් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම් හා අනෙකුත් ශිෂ්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
- 2016 වර්ෂයේ 5ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග ලකුණු මත සිසුන් 20023ක් සඳහා පාසල් ලබා දීම හා අභියාචනා මඟින් දෙවන වටයේ දී සිසුන් 4400ක් සඳහා පාසල් ලබා දීම.
- 2017 වර්ෂයේ සිට සුභග ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන චක්‍රලේඛ නිකුත් කර සිසුන් 900ක් තෝරා ශිෂ්‍යත්ත්ව ප්‍රදානය කිරීම.
- පාසල් පදනම් කරගත් තක්සේරු වැඩසටහනට අදාළ නව චක්‍රලේඛය නිකුත් කර මූලික උපදෙස් සංග්‍රහය සහිත අත්පොත් 10000 මුද්‍රණය කර 6-13 ශ්‍රේණි සහිත පාසල් සඳහා බෙදා හැරීම
- පාසල් නගා සිටුවීමේ වැඩසටහන (PSI) සම්බන්ධව පුහුණු වැඩසටහන් හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා එම වැඩසටහන සංශෝධනය කිරීම සඳහා වැඩසටහන් 9ක් පවත්වා 139 දෙනෙකු පුහුණු කිරීම.
- 2017 ආසියානු පැසිපික් ළමා සමුළුව සඳහා සිසුන් සහභාගි කරවීම
- සංස්කෘතික හුවමාරු වැඩසටහන යටතේ ජපන් දූත කණ්ඩායම සඳහා වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම.
- පළමු වසරට සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛය සකස් කිරීම.
- ආචාර්ය සි.ඩබ්.ඩබ්.කන්නන්ගර දිනය හොරණ තක්ශිලා විද්‍යාලයේ දී පැවැත්වීම.



# 4.3 පිරිවෙන් අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| "එල සපිරි පිරිවෙන්" ව්‍යාපෘතිය - පරිවේනාචාර්යවරුන් පුහුණු කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම | ගුරු උපදේශකවරු | සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 2017 අයවැය යෝජනා - පිරිවෙන් ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය | සියලු ම විෂයයන් උගන්වන පිරිවෙන් ගුරුවරුන් | දිස්ත්‍රික් මට්ටමින් |
| පිරිවෙන් සිසුන්ගේ දෙමළ භාෂා සංවර්ධනය | පිරිවෙන්වල සිසුන් | දිස්ත්‍රික් මට්ටමින් |

**ගුණාත්මක සංවර්ධනය**

- දිවයින පුරා ක්‍රියාත්මක පිරිවෙන් 761 ආවරණය වන පරිදි පිරිවෙන්වල පැවති හඳුනාගත් ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගිහි පරිවේනාචාර්යවරුන් 198ක් හා ස්වාමීන්වහන්සේලා 271ක් වශයෙන් පරිවේනාචාර්යවරුන් 469ක් මෙම වසර තුළ බඳවා ගැනීම.
- ඵලදායිතා සංකල්පය මූලික කරගත් පිරිවෙන්වල ගුණාත්මක බව හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන නැගෙනහිර, උතුරු මැද, ඌව හා වයඹ පළාත්වල ක්‍රියාත්මක කිරීම.
- වසර තුළ පිරිවෙන් 33ක් කණ්ඩායම් අධීක්ෂණය මගින් අධීක්ෂණය කිරීම.
- රු.මි. 2.1ක වියදමින් ගුරුකාර්ය දර්ශන සහ පන්ති කළමනාකරණය පොත් මුද්‍රණය කිරීම. මූලික පිරිවෙන්වල 1-5 ශ්‍රේණිවල විෂය 10ක් සඳහා විෂය නිර්දේශ විධිමත් ව සකස් කර බෙදාහැරීම.
- 1-5 ශ්‍රේණිවලට අදාළ සියලු ම පෙළ පොත් කාලානුරූපව යාවත්කාලීන කොට සම්පාදනය කිරීම.
- 2017 අයවැය යෝජනා යටතේ පිරිවෙන්වල පැවිදි සිසුන්ගේ අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය සඳහා වෙන් වූ රු.මිලියන 150ක ප්‍රතිපාදන එක් පැවිදි ශිෂ්‍යයකුට රු.2500ක් වන සේ පැවිදි සිසුන් 23,577ක් වෙනුවෙන් පිරිවෙන්වල සංවර්ධන අරමුදල වෙත බෙදා දීම.
- පිරිවෙන්වල සිසුන්ගේ පාඨක දැනුම වර්ධනය සඳහා රු.මි.4.5ක වියදමින් සම්භාෂා සඟරාව මුද්‍රණය කිරීම.

**භෞතික සංවර්ධනය**

- පිරිවෙන්වල ප්‍රගතිය හා සංවර්ධනය උදෙසා රු.මි.145.296 ප්‍රතිපාදන පිරිවෙන් වෙත වාර්ෂික ආධාර ලෙස බෙදා දීම.
- සසුනට දිරි දෙන සුරකිමු පිරිවෙන ජාතික වැඩසටහන යටතේ හඳුනාගත් පිරිවෙන් 10ක් සඳහා පරිවේනාධිපති කාර්යාල ඉදිකිරීම වෙනුවෙන් ලක්ෂ 30 බැගින් ද, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට පිරිවෙන් 60ක් සඳහා ලක්ෂ 9 බැගින්ද ලබා දීම.
- පිරිවෙන් 42ක් සඳහා ගණිත උපකරණ කට්ටල බෙදා දීම.
- විද්‍යාලංකාර, විද්‍යෝදය හා චතුරුවිල පිරිවෙන් පුහුණු ආයතනවල සංවර්ධනය සඳහා රු.මි. 11.0ක ප්‍රතිපාදන ලබා දීම.
- සීතාවක පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය සංවර්ධනය සඳහා රු.මි.3.05ක ආධාර ලබාදීම.

**4.3.1. වගුව : පිරිවෙන් පිළිබඳ මූලික තොරතුරු - 2017**

| පිරිවෙන් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | | | පරිවේණාචාර්ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | පැවිදි | ගිහි | එකතුව | පැවිදි | ගිහි | එකතුව |
| 753 | 33,441 | 29,431 | 62,872 | 3,490 | 3,292 | 6,782 |

## 4.4 නොවිධිමත් අධ්‍යාපනය හා විශේෂ අධ්‍යාපනය

### 4.4.1 නොවිධිමත් අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| උපදේශන පිළිබඳ පුහුණුව | ගුරුවරුන් 10ක් හා බන්ධනාගාරගත නේවාසිකයින් 43ක් | වැඩමුළු 2ක් |
| නව අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම්වත් කිරීම | අදාළ නිලධාරීන් | වැඩමුළු 4ක් |
| ආදායම් ඉපයීමේ පාඨමාලා ප්‍රවර්ධනය | පාඨමාලා උපදේශකවරුන් | වැඩසටහන් 3 |

**වෙනත් වැඩසටහන්**

- ජාත්‍යන්තර සාක්ෂර දින සමරු වැඩසටහන සාක්ෂර පන්ති සිසුන් 198ක් ඇතුළු 300ක ගේ සහභාගීත්වයෙන් පැවැත්වීම.
- ප්‍රගති සමාලෝචන හා වැඩසටහන් නිරීක්ෂණ කාර්ය සැසි 3ක් පැවැත්වීම.

### 4.4.2 විශේෂ අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| **ඔටිසම් සිසුන්ගේ අධ්‍යාපනය** | විශේෂ අධ්‍යාපන ගුරුවරුන්, උපකෘත විශේෂ පාසල් විදුහල්පතිවරු හා කළමනාකරුවන් | වැඩසටහන් 2 |
| **බේල් හා සංඥා භාෂා පුහුණුව** | විශේෂ අධ්‍යාපන ගුරුවරුන් | වැඩසටහන් 1 |

**ගුණාත්මක සංවර්ධනය**

- විශේෂ අධ්‍යාපන උපදේශන කමිටු රැස්වීම් 3ක් පැවැත්වීම.
- බුද්ධිමය ඌනතා සහිත දරුවන් සඳහා විෂය නිර්දේශ සකස් කිරීමට වැඩසටහනක් පැවැත්වීම.
- ශ්‍රවණාබාධිත සිසුන් සඳහා ඉ තක්සලාව ප්‍රතිනිර්මාණය කිරීම සඳහා වැඩසටහනක් පැවැත්වීම.
- විශේෂ අවශ්‍යතා සහිත වූවන් සඳහා වන ජාත්‍යන්තර දින සැමරුම විශේෂ අධ්‍යාපන ගුරුවරුන්, සිසුන් හා නිලධාරීන් 480ක ගේ සහභාගීත්වයෙන් සිදු කිරීම.

**භෞතික සංවර්ධනය**

- විශේෂ අධ්‍යාපන සම්පත් හා තොරතුරු මධ්‍යස්ථානයේ දෙමහල් පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ කටයුතු සිදු කිරීම.
- විශේෂ අධ්‍යාපන ඒකක සඳහා සංගීත උපකරණ කට්ටල 25ක්, ක්‍රීඩා උපකරණ කට්ටල 25ක් වානේ අල්මාරි 50ක් හා හසුරු කුසලතා කට්ටල 50ක් සැපයීම.
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ආබාධිත දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහා 2017 අයවැය යෝජනා යටතේ රු.මි.150ක වියදමින් ඩිජිටල් තාක්ෂණික උපකරණ ලබා දීම.





විශේෂ අධ්‍යාපන සංවර්ධනය

## 4.5 පාසල් පෝෂණ හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

සමබර පෞරුෂයක් සහිත සෞඛ්‍ය සම්පන්න අනාගත පුරවැසියෙකු බිහිකිරීම සඳහා සෞඛ්‍යය හා පෝෂණ පහසුකම් සිසුන් වෙත සැපයීම සිදු කෙරේ. මේ සඳහා පාසල් පරිසරය තුළ සුරක්ෂිතභාවය මෙන්ම සෞඛ්‍ය ප්‍රවර්ධනය වෙනුවෙන් වර්ෂය තුළ විවිධ ක්‍රියාමාර්ගයන් ගනු ලැබීය.

### 4.5.1 දිවා ආහාරය හා කිරි වීදුරුවක් ලබා දීම

- පාසල් සිසුන් සඳහා දිවා ආහාර ලබා දීමේ වැඩසටහන යටතේ පාසල් 7,871 ක සිසුන් 1,105,605 ක් සඳහා ආහාර ලබාදීමට වසර තුළ රුපියල් මි. 2,302.4 ක පිරිවැයක් දැරීම.
- පාසල් 437ක පාසල් සිසුන් 119,500 දෙනෙකු සඳහා කිරි වීදුරුවක් ලබා දීම වෙනුවෙන් වසර තුළ රු.මි.284.6 ක පිරිවැයක් දැරීම.

### 4.5.2 ජල හා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම

ශිෂ්‍යයන් 50කට එක් වැසිකිලියක් බැගින් හා ගුරුවරුන් 50 කට එක් වැසිකිලියක් බැගින් තිබිය යුතුය යන ජාත්‍යන්තර නිර්ණායක අනුව මෙරට පාසල් පද්ධතියට සනීපාරක්ෂක පහසුකම් ලබා දීමේ ඉලක්කය සැපිරීමේ එක් අදියරක් යටතේ 2017 අයවැය යෝජනා අනුව සනීපාරක්ෂක පහසුකම් පාසල් මට්ටමින් වැඩිදියුණු කිරීම සඳහා පාසල් 1,633ක් වෙත රුපියල් මි. 1,869ක ප්‍රතිපාදන ලබා දීම සිදු විය.

### 4.5.3 සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

- මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව උපදෙස් සංග්‍රහය පිළියෙල කිරීම.
- ප්‍රජනන සෞඛ්‍ය හා ලිංගික අධ්‍යාපනය පිළිබඳ ගුරු උපදෙස් සංග්‍රහය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ උපදෙස් සංග්‍රහයක් සකස් කිරීම.
- පාසල් මට්ටමින් කැලිකසල කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සියලුම පාසල්වල ඩෙංගු මර්දන පවිත්‍රතා වැඩසටහන් විධිමත්ව හා අඛණ්ඩව ක්‍රියාත්මක කරවීම.
- සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්ව ශිෂ්‍ය සෞඛ්‍ය පරීක්ෂණ වැඩසටහන පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
- තිරසර පාසල් සංවර්ධන වැඩසටහන යටතේ ජනාධිපති කාර්යාලය හා එක් ව සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**ධාරිතා වර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| **මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ වැඩසටහන** | නියෝජ්‍ය විදුහල්පතිවරුන් හා ගුරුවරුන් 90ක් | වැඩසටහන් 2 |
| | ගුරු උපදේශකවරුන් 37 හා පුහුණුකරුවන් 206 | |
| | සිසුන් 682ක් | |
| **ප්‍රජනන සෞඛ්‍ය හා ලිංගික අධ්‍යාපනය** | ගුරුවරුන් 72ක් | වැඩසටහන් 2 |
| **පෝෂණය හා පාසල් පෝෂණ උයන්** | ගුරුවරුන් 1,193ක් | වැඩසටහන් 26ක් |





ඩෙංගු පවිත්‍රතා වැඩසටහන

## 4.6 සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන

1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබන සිසුන්ගේ කායික හා මනෝ සමාජීය යහපැවැත්ම තහවුරු කිරීම සඳහා සෑම දරුවකුට ම රක්ෂණාවරණයක් ලබා දීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2017 ඔක්තෝම්බර් 1වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන ආරම්භ කරන ලදී. මේ සඳහා 2017 අයවැය යෝජනා යටතේ ලබා දුන් රු.මිලියන 2,700ක ප්‍රතිපාදන වියදම් කරන ලද අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රක්ෂණ ආයතනය ලෙස තෝරා ගන්නා ලදී.

රජයේ සියලු පාසල්, ආධාර ලබන පෞද්ගලික පාසල්, ආධාර නොලබන පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල් හා පිරිවෙන් ඇතුළුව ශ්‍රී ලංකාවේ පාසල් 11,242ක් තුළ අධ්‍යාපනය ලබන දරුවන් ලක්ෂ 45කට ආසන්න සිසු පිරිසක් ආවරණය කරමින් රක්ෂණාවරණ පහසුකම් අංශ 3ක් මේ යටතේ ක්‍රියාත්මක වේ.

**සෞඛ්‍ය රක්ෂණාවරණය**

වාර්ෂිකව රෝහලේ නේවාසික ප්‍රතිකාර සඳහා රු.200,000ක ප්‍රතිලාභයක් ද, හඳුනාගත් බාහිර රෝග 7ක් වෙනුවෙන් බාහිර ප්‍රතිකාර සඳහා රු.10,000ක රක්ෂණ ප්‍රතිලාභයක් සෑම ශිෂ්‍යයකුටම හිමි වේ.

**හදිසි අනතුරු ආවරණය**

අනපේක්ෂිත වූ ද, සාහසික වූ ද දෘෂ්‍යමාන වූ ද ආකාරයකින් රක්ෂිතයාගේ රක්ෂිත කාල සීමාව තුළ ශරීරයට සිදු වන තුවාල හෝ එම හේතු නිසා සිදුවන සිසුවකු ගේ මරණය වෙනුවෙන් රු.100,000ක් සහ සිය මවගේ හෝ පියාගේ මරණයක දී දරුවන්ට රු.75,000ක් හිමි වන අතර දරුවා පූර්ණ ආබාධිත තත්වයකට පත්වීමේ දී රු.100,000ක් ද, අර්ධ ආබාධිත තත්වයක දී රු.50,000ක සිට රු.100,000ක් දක්වා ද වශයෙන් ප්‍රතිලාභ රාශියකට හිමිකම් කියනු ලබයි.

**විශේෂ ප්‍රසාද දීමනා**

නේවාසික රෝහල් ගාස්තු වලින් 20%ක් අඩු කිරීම, වෛද්‍ය උපදේශකවරයකු හෝ විශේෂඥ වෛද්‍ය ගාස්තුවලින් 20%ක් අඩු කිරීම.






**වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

- මේ පිළිබඳ ව අදාළ චක්‍රලේඛ සහ උපදෙස් සංග්‍රහ නිකුත් කර විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා සියලු පාර්ශව දැනුම්වත් කරන ලද අතර 2017 දෙසැම්බර් මස 7වන දා දිවයින පුරා පාසල්වල ජාතික සුරක්ෂා සිසු රක්ෂණාවරණ දිනය පැවැත්වූ අතර අත්පත්‍රිකා, දේශන හා වීඩියෝ දර්ශන මඟින් සිසුන් හා දෙමව්පියන් වැඩි දුරටත් දැනුම්වත් කිරීම සිදු විය.
- දිවයිනේ පාසල්වල සිටින රක්ෂණාවරණය හිමි සියලුම දරුවන්ගේ දත්ත ඇතුළත් කර දත්ත පාදකයක් සකස් කිරීමට පියවර ගෙන ඇති අතර එමඟින් මෙම වැඩසටහන විධිමත්ව හා කාර්යක්ෂම ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.
- සුරක්ෂා සිසු රක්ෂණ වැඩසටහන යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයට නීත්‍යානුකූලව හිමිවන කොමිස් මුදල මඟින් වෙනම අරමුදලක් ආරම්භ කිරීමට පියවර ගෙන ඇති අතර එ මඟින් අති දුෂ්කර ආර්ථික මට්ටම්වල පසුවන පවුල්වල දරුවන්ගේ සුරක්ෂා මඟින් ආවරණය නොවන සෞඛ්‍ය හා වෛද්‍ය අවශ්‍යතා සඳහා ආධාර ලබා දීමට අපේක්ෂිතය.

## 4.7 ශිෂ්‍ය සුභසාධන වැඩසටහන්

**4.7.1.** වගුව : **ශිෂ්‍ය සුභසාධන වැඩසටහන්**

| වැඩසටහන | වියදම රු.මි. | | | | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2017 |
|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | |
| කිරි වීදුරුවක් ලබා දීම | 205 | 230 | 197 | 127.6 | 212 | 285 | 119,500 |
| පෙළපොත් | 2,400 | 2,329 | 2,700 | 3,898 | 5,414 | 4,385 | 4,300,000 |
| පාසල් නිල ඇඳුම් | 1,600 | 1,739 | 3,574 | 2,245 | 2,157 | 2,700 | 4,672,000 |
| 5 ශ්‍රේණියේ ශිෂ්‍යාධාර (ජාතික පාසල් සිසුන්) | 240 | 268 | 300 | 365 | 323 | 310 | 72,480 |
| පාසල් පෝෂණ වැඩසටහන | 2,850 | 3,076 | 3,725 | 3,936 | 3,915 | 4,513 | 1,105,605 |
| දුෂ්කර පාසල් ළමුන් සඳහා සපත්තු ජෝඩුවක් ලබා දීම | - | 0.05 | 270 | 291 | 479 | 640 | 622,000 |

**මූලාශ්‍රය : මුදල් අමාත්‍යාංශය: වාර්ෂික වාර්තාව , මුදල් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය - 2015/2016**

### 4.7.2 ශිෂ්‍යාධාර වැඩසටහන්

ඉගෙනුමට දක්ෂතා ඇති නමුත් ආර්ථික අපහසුකම් ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනය සඳහා මෙන්ම විශේෂ දක්ෂතා සහිත සිසුන් අභිප්‍රේරණය සඳහා වාර්ෂිකව විවිධ ශිෂ්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

- **5 ශ්‍රේණිය ශිෂ්‍යත්වධාරීන් සඳහා ශිෂ්‍යාධාර**

  5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් අඩු ආදායම් ලාභී සිසුන් වෙනුවෙන් මෙම ශිෂ්‍යාධාර ලබා දීම ක්‍රියාත්මක අතර 2017 වසරේ ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව 114000ක් වේ. ඉන් 72480ක් ජාතික පාසල්වල ඉගෙනුම ලබයි. සිසුවෙකුට මසකට රු.500 බැගින් වසරකට මාස 10ක් පාසල් අධ්‍යාපනය අවසන් වන තුරු ශිෂ්‍යාධාර හිමිවේ.

- **සුභග ශිෂ්‍යත්ව වැඩසටහන**

  නව නිපැයුම් සෞන්දර්යය, ක්‍රීඩා යන ක්ෂේත්‍රයන්හි දක්ෂතා දක්වන සිසුන් 1000ක් වෙනුවෙන් වාර්ෂිකව ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා 2017 අයවැය යෝජනා යටතේ හඳුන්වා දෙනු ලැබූ මෙම ශිෂ්‍යත්ව ක්‍රමයේ මෙම වසර සඳහා සිසුන් 900ක් සුදුසුකම් ලැබූ අතර ඔවුන් මසකට රු.2500 බැගින් මාස 20ක් සඳහා ශිෂ්‍යාධාර ලැබීමට හිමිකම් කියනු ලැබේ.

- **මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව**

  අඩු ආදායම්ලාභී සිසුන්ගේ උසස් පෙළ අධ්‍යාපන අවස්ථා සඳහා ඉන්දියානු රජයේ අනුග්‍රහයෙන් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් පිරිනමනු ලබන මෙම ශිෂ්‍යත්වය යටතේ මසකට රු.2500 බැගින් මාස 20ක් සඳහා ශිෂ්‍යාධාර ලබාදෙන අතර මෙවර ද2016 වසරේ අ.පො.ස.(සා.පෙ) විභාගයේ ඉහළ ප්‍රවීනතා ලැබූ අඩු ආදායම්ලාභී සිසුන් 150ක් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය සිදුවිය.

- **ඩයලොග් ශිෂ්‍යත්ව**

  අ.පො.ස.(සා.පෙ) විභාගයේ දිස්ත්‍රික් මට්ටමින් මුල් ස්ථාන ලැබූ අ.පො.ස.(උ.පෙ) ගණිත විෂය ධාරාව හදාරණ සිසුන් 30 දෙනෙකු මෙම ශිෂ්‍යත්ව ප්‍රදානයට හිමිකම් කියන අතර මසකට රු.2500 බැගින් මාස 24ක් සඳහා ශිෂ්‍යාධාර ප්‍රදානය කෙරේ.

- **සුජාත දියණි ශිෂ්‍යත්ව වැඩසටහන**

  අ.පො.ස.(උ.පෙ) තාක්ෂණවේදය හදාරණ අඩු ආදායම් ලාභී සිසුවියන් 150ක් සඳහා පිරිනැමෙන අතර වසරකට රු.5000 බැගින් වසර 2ක් සඳහා ශිෂ්‍යාධාර හිමිවේ. මෙම වසරේ සිසුන් සඳහා අදාළ ප්‍රතිපාදන මහා භාරකාර දෙපාර්තමේන්තුව මගින් මහා භාණ්ඩාගාරය වෙත නිදහස් කිරීම සඳහා කටයුතු සිදු කර ඇත.

- **සෙලින්කෝ දිරි දරු ශිෂ්‍යත්ව වැඩසටහන**

  මසකට රු.1500 බැගින් වර්ෂයකට මාස 10ක් සඳහා 6 ශ්‍රේණියේ සිට 11 ශේණිය දක්වා ඉගෙනීමට මෙය ප්‍රදානය කරන අතර මේ වන විට සිසුන් 650 දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඇත.

- **ශ්‍රී ලංකා ටෙලිකොම්, මහජන බැංකුව හා සිංගර් ශ්‍රී ලංකා අනුග්‍රහයෙන් ශිෂ්‍යත්ව**

  අ.පො.ස.(උ.පෙ) සමස්ත දිවයිනෙන්ම ප්‍රමුඛස්ථානය ලැබූ සිසුන් හා 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් සමස්ත දිවයිනෙන්ම ප්‍රමුඛස්ථානය ලැබූ සිසුන් වෙනුවෙන් මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී. අ.පො.ස (උ.පෙ) විභාගයෙන් එක් විෂය ධාරාවකින් සිසුන් 05 බැගින් විෂය ධාරා 7න් සිසුන් 35 දෙනෙකු සඳහා ලැප්ටොප් පරිගණක,ටැබ්ලට් පරිගණක, අන්තර්ජාතික සබඳතා සඳහා රු.මි.2.275ක මුදල් ත්‍යාග වශයෙන් පිරිනමා ඇත. 05 ශ්‍රේණි ශිෂ්‍යත් විභාගයෙන් සමස්ත දිවයිනෙන් ප්‍රමුඛස්ථානය ලැබූ සිසුන් 12 දෙනෙකු සඳහා ලැප්ටොප් පරිගණක රු.මි.1.175ක මුදල් ත්‍යාග පිරිනමා ඇත.



# 05.
# ඉගෙනුම් සංවර්ධන වැඩසටහන්

# 5.1 ප්‍රාථමික අධ්‍යාපනය

## ධාරිතා සංවර්ධන වැඩසටහන්

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| ප්‍රාථමික පන්තිවල සිටින ඉගෙනුම් දුෂ්කරතා සහිත සිසුන් හඳුනාගෙන ඔවුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීම | සම්පත්දායකයින් ලෙස ප්‍රාථමික විෂයභාර ගුරු උපදේශකවරු 402ක් | වැඩසටහන් 9ක් |
| 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ සාධනය හා අයිතම විශ්ලේෂණය කර සිසුන් දුෂ්කරතා දක්වා ඇති කොටස් හඳුනා ගැනීම | නිලධාරීන් හා ගුරු උපදේශකවරු 261ක් | එක් වැඩසටහනක් |
| 4 ශ්‍රේණියේ සිසුන්ගේ විෂය ප්‍රාප්ති මට්ටම මැනීම සඳහා NEREC ආයතනය හා එක්ව පැවැත්වෙන ජාතික ඇගයීමේ ප්‍රතිපල පිළිබඳව දැනුම්වත් කිරීම | නිලධාරීන් හා ගුරු උපදේශකවරු 413ක් | වැඩසටහන් 4ක් |
| ප්‍රාථමික පංතිවල ගණිත අධ්‍යාපනය නැංවීම සඳහා මාර්ගෝපදේශ වැඩසටහන | සම්පත්දායකයින් 50ක්, ප්‍රාථමික විෂයයභාර ගුරු උපදේශකවරු 49ක් | වැඩසටහන් 3ක් |
| ප්‍රාථමික අධ්‍යාපනයේ බහුතල ඉගැන්වීම් සම්බන්ධව මාර්ගෝපදේශ සකස් කිරීම | සම්පත්දායකයින් 40ක්, ප්‍රාථමික විෂයයභාර නිලධාරීන් හා ගුරු උපදේශකවරු 278ක් | වැඩසටහන් 9ක් |
| ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය සඳහා ක්‍රියාකාරකම් හා කියවීම් කාමරය භාවිතා කිරීම | ප්‍රාථමික විෂයයභාර නිලධාරීන් හා ගුරු උපදේශකවරු 270ක් | වැඩසටහන් 5ක් |

### ගුණාත්මක සංවර්ධනය

- ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය සඳහා ක්‍රියාකාරකම් හා කියවීම් කාමරය භාවිතා කිරීම පිළිබඳව සම්පත්දායකයින් 37කගේ සහභාගීත්වයෙන් මාර්ගෝපදේශ සකස් කිරීම.
- පළමු වසරට සිසුන් ඇතුළත් කිරීම 2017 ජාතික මහෝත්සවය කිරිබත්ගොඩ විහාර මහාදේවි විද්‍යාලයේ දී පැවැත්වීම.
- පළාත් මට්ටමේ සම්බන්ධීකරණ නිලධාරීන් සමග ප්‍රගති සමාලෝචන රැස්වීම් 5ක් පැවැත්වීම.

### භෞතික සංවර්ධනය

- "ළඟ ම පාසල හොඳ ම පාසල" වැඩසටහන යටතේ ඉදි කළ ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් මධ්‍යස්ථානවල ක්‍රියාකාරකම් කාමරය සහ කියවීම් කාමරය සඳහා මල්ටිමීඩියා යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර සහ ලී බඩු බෙදා දීම.





ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන

# 5.2 විද්‍යා අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| විද්‍යා අධ්‍යාපනයේ නව ප්‍රවනතා | ගුරු උපදේශකවරු 128ක් | වැඩසටහන් 3ක් |
| අ.පො.ස.(උ/පෙළ) භෞතික විද්‍යාව ඉගැන්වීම | ගුරුවරුන් 63ක් | වැඩසටහන් 2ක් |
| විද්‍යා ගුරුවරුන්ගේ හා සිසුන්ගේ ධාරිතා සංවර්ධනය | වයඹ පළාතේ ගුරුවරුන් 47ක් හා සිසුන් 588ක්<br>ඌව පළාතේ ගුරුවරුන් 50ක් හා සිසුන් 300ක්<br>මධ්‍යම පළාතේ ගුරුවරු 184 ක් සබරගමුව පළාතේ ගුරුවරුන් 1,273ක් හා සිසුන් 8,000ක් | පළාත් මට්ටමින්<br>වැඩසටහන් |
| පාසල් සිසුන් අතර පරිසර අධ්‍යයනය වැඩිදියුණු කිරීම | ගුරුවරු 924ක් | මහවැලි අධිකාරිය හා පරිසර අධිකාරිය හා එක්ව වැඩසටහන් 8ක් |
| ප්‍රායෝගික ක්‍රියාකාරකම් සම්බන්ධව පුහුණු කිරීම | නවක පත්වීම්ලාභී රසායනාගාර සහායකාරවරුන් 100ක් | වැඩසටහන් 3ක් |

**ගුණාත්මක සංවර්ධනය**

- තෝරා ගත් සම්පත්දායකයින් 36ක ගේ එකතුවෙන් න්‍යෂ්ටික විද්‍යාව සඳහා අන්තර්ජාලයෙන් ඉගෙනීමට පාඩම් මාලා සකස් කිරීම.
- අ.පො.ස.(උ/පෙළ) විද්‍යා විෂයමාලාවේ ඉගෙනුමේ අවසන් නිමවුම (Learners' Outcomes) නැවත සකස් කිරීම සඳහා වැඩමුළු 4ක් පැවැත්වීම.
- අ.පො.ස.(සා/පෙළ) හා අ.පො.ස.(උ/පෙළ) විද්‍යා ප්‍රශ්න පත්‍රයන් විශ්ලේෂණය කර වාර්තාවක් සකස් කිරීම.
- පළාත් හා කලාප විද්‍යා විෂයභාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකවරු 97කගේ සහභාගීත්වයෙන් 2016 වසරට අදාළ ප්‍රගති සමාලෝචනය හා 2017 වසරට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධව රැස්වීම් 5ක් පැවැත්වීම.
- විද්‍යා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන සඳහා ව්‍යාපෘති යෝජනා 18ක් සකස් කිරීම හා එම ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම.
- ඉදිරි 5 වසර තුළ STEM (Science, Technology, Engineering & Mathematics) අධ්‍යාපනය ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත කිරීම හා ස්ථාපිත කිරීම වෙනුවෙන් ක්‍රියාමාර්ග ආරම්භ කිරීම මේ වන විට සිදු කර ඇත. ආරම්භක පියවර ලෙස විද්වත් ප්‍රවීණ දේශක මඩුල්ලකගේ ප්‍රධානත්වයෙන් වැඩමුළු පැවැත්වීම ආරම්භ කර ඇත.

**ශිෂ්‍ය පාදක ක්‍රියාකාරකම්**

- ජාතික ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් (කණිෂ්ඨ) තරඟාවලිය පැවැත්වීම හා ජයග්‍රාහකයින්ට සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම.
- අන්තර් ජාතික ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් තරඟාවලියට සහභාගීවන සිසුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- පාසල් බල ශක්ති දින ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන පැවැත්වීම.
- 2018 වසරේ අප්‍රේල් මස සර්බියාවේ බෙල්ග්‍රේඩ් හි පැවැත්වීමට නියමිත අන්තර්ජාතික තරුණ විද්‍යාඥයින්ගේ තරඟාවලිය 2018 සඳහා සිසුන් තෝරා පත් කර ගැනීම.

**විද්‍යාගාර පහසුකම් ලබා දීම**

- විද්‍යාගාර පහසුකම් අවම පාසල් 3,000ක් සඳහා රු.මිලියන 450ක ආයෝජනයෙන් ජංගම විද්‍යාගාර කට්ටල ලබා දීම. බස්නාහිර පාසල් 448, දකුණ පාසල් 306, නැගෙනහිර පාසල් 302, උතුරු මැද පාසල් 173, සබරගමුව පාසල් 410, මධ්‍යම පාසල් 440, උතුරු පාසල් 249, වයඹ පාසල් 403, ඌව පාසල් 249 ක් මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලැබීය.
- 2015 දී 2476ක් වූ අ.පො.ස.(සා/පෙ.) විද්‍යාගාර පාසල් සහිත පාසල් සංඛ්‍යාව 2017 වර්ෂයේ දී 3106 දක්වා වැඩි කර ඇත.

**ජයග්‍රහණයන්**

- අන්තර්ජාතික ගණිත තරගාවලියේදී සිසුන් 12ක් සහභාගී වී රිදී පදක්කම් 5ක් හා ලෝකඩ පදක්කම් 6ක් වශයෙන් සිසුන් 11ක් පදක්කම් දිනා ගන්නා ලදී.
- 2017 වසරේ ජර්මනියේ පැවති අන්තර්ජාතික තරුණ විද්‍යාඥයින්ගේ තරඟාවලියට ප්‍රථමවරට සිසුන් දෙදෙනෙකු සහභාගී කර වූ අතර රිදී පදක්කමක් දිනා ගැනීමට එක් ශිෂ්‍යයෙක් සමත් විය.






පාසල්වලට ජංගම විද්‍යාගාර ලබා දීම

## 5.3 ගණිත අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| ගණිත අධ්‍යාපනය සම්බන්ධ කෙටි කාලීන විදේශ පුහුණුව | ගණිතය විෂයභාර පළාත් හා කලාප නිලධාරීන් 50ක් | සිංගප්පූරු ජාතික අධ්‍යාපන ආයතනයේ දී |
| පළාත් හා කලාප ගණිත සම්බන්ධීකරණ නිලධාරීන් හා ගුරු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන | ගණිත සම්බන්ධීකරණ නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් | වැඩසටහන් 2ක් |
| ක්‍රියාකාරකම් පාදක ගණිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බලගැන්වීම | සම්පත් පුද්ගලයින් | වැඩසටහන් 8ක් |
| ගණිතාධාරක උපකරණ සකස්කිරීමේ හැකියාව සංවර්ධනය | ගණිත ගුරුවරුන් | වැඩමුළු 4ක් |
| ක්‍රියාමූලික පර්යේෂණ ජනප්‍රිය කිරීම | ගණිත ගුරුවරුන් | වැඩසටහන් 12ක් |

**ගණිතය විෂයය සංවර්ධන ක්‍රියාකාරකම්**

- ගණිත විෂය සඳහා ජාතික හා පළාත් මට්ටමේ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සහ පස් අවුරුදු ආංශික සැලැස්ම සකස් කිරීම.
- ජාතික හා අන්තර්ජාතික මාන ඔස්සේ ප්‍රාථමික හා ද්විතියික විෂයමාලාවට අදාළ ව ගණිත අධ්‍යාපනයේ අනාගත දිශානතිය හඳුනාගැනීම සඳහා විෂය මාලාව ඉගෙනුම් ක්‍රමවේද හා ඇගයීම් යන ක්ෂේත්‍ර 3 මුල් කර ගනිමින් විද්වතුන් 380ක ගේ සහභාගීත්වයෙන් විද්වත් කතිකාවක් පැවැත්වීම.
- ගණිත විෂයය පත්වීම් නොලැබ ගණිත විෂයය ඉගැන්වීමේ යෙදෙන ගුරුවරුන් සඳහා වන ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් සහතික පත්‍ර ගුරු පුහුණු පාඨමාලාව සඳහා 28/2017 චක්‍රලේඛය නිකුත් කිරීම.
- ගණිත අධ්‍යාපනය නියාමනය සඳහා වැඩසටහනක් පළාත් හා කලාප නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සකස් කිරීම.
- ජාත්‍යන්තරව භාවිතා වන ගණිත මෘදුකාංග හා පරිගණක ආශ්‍රිත ගණිත ක්‍රියාකාරකම් අධ්‍යාපන පද්ධතියට හඳුන්වාදීම සඳහා පාඩම් මොඩියුලයක් සකස් කිරීම.
- 6,7 ශ්‍රේණි සිසුන් සඳහා ක්‍රියාකාරකම් පාදක ගණිතය පොත් 2ක් නිර්මාණය කිරීම සඳහා 6 ශ්‍රේණියට ක්‍රියාකාරකම් 25ක් ද, 7 ශ්‍රේණියට ක්‍රියාකාරකම් 20ක් ද සකස් කිරීම.
- පළාත් හා කලාප ගණිත විෂය සම්බන්ධ නිලධාරීන් සමග ප්‍රගති සමාලෝචන රැස්වීම් 2ක් පැවැත්වීම.
- ක්‍රියාකාරකම් පාදක ගණිත ඉගෙනුම් ඉගැන්වීම් සඳහා විෂය අන්තර්ගතය වැඩසටහන් 2ක් මගින් සකස් කිරීම.

**ගුරු පාදක ක්‍රියාකාරකම්**

- ගණිතය විෂයභාර නිලධාරීන්ගේ සහ උසස් පෙළ සංයුක්ත ගණිතය විෂයය උගන්වන ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය ඉහළ නැංවීම සඳහා ගණිත අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව හැදෑරීමට ශිෂ්‍යත්ව 33ක් ප්‍රදානය කර එක් අයෙකුට රු.133,000 බැගින් රු.මිලියන 4.389ක පිරිවැයක් දැරීම.

**ශිෂ්‍ය පාදක ක්‍රියාකාරකම්**

- අ.පො.ස.(සා/පෙළ) ගණිත සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා 10 හා 11 ශ්‍රේණි පදනම් කර ගනිමින් කඩිනම් ඉගෙනුම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ගණිතයේ ප්‍රධාන තේමා 6ක් පදනම් කර ගනිමින් මොඩියුල 53ක් සකස් කිරීම හා ශිෂ්‍ය කඳවුරු 8ක් පැවැත්වීම.
- සමස්ත ලංකා ගණිත දැනුම මිණුම තරගය හා ජාතික ඔලිම්පියාඩ් තරගය පවත්වා ජයග්‍රාහකයින්ට සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම.
- අන්තර් ජාතික ගණිත ඔලිම්පියාඩ් තරගය සඳහා සහභාගීවන සිසුන් වැඩසටහන් 13ක් මගින් පුහුණු කිරීම.
- ඉන්දියාවේ ලක්නව් හි පැවති අන්තර් ජාතික ගණිත තරඟාවලියේ දී හොඳම නිර්මාණශීලීත්වය සඳහා වූ ශූරතා කුසලතාවය ඇතුළු දෙවන අනු ශූරතා කුසලතා 4ක්, රිදී පදක්කම් 1ක් , ලෝකඩ පදක්කම් 24ක්, කුසලතා සම්මන 3ක් හා සහභාගීත්ව සහතික 4ක් දිනා ගැනීමට සහභාගී වූ සිසුහු සමත් වූහ.





දේශීය හා අන්තර් ජාතික ගණිත තරගාවලි සඳහා ශිෂ්‍ය සහභාගීත්වය





ගුරු ධාරිතා වර්ධනය



## 5.4 තාක්ෂණ අධ්‍යාපනය

### 5.4.1 අ.පො.ස.(උසස් පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| සිවිල් ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ධාරිතා සංවර්ධනය | අ.පො.ස.(උසස් පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය ගුරුවරුන් | දින 4 X වැඩමුළු 5<br>දින 6 X වැඩමුළු 1<br>පැලවත්ත ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ විශ්ව විද්‍යාල විද්‍යායතනයේදී |
| විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය | ගුරුවරුන් | දින 4 හා දින 3 බැගින් වූ නේවාසික වැඩමුළු 10ක් මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී |
| අඩු වියදම් උපකරණ නිෂ්පාදනය | ඉංජිනේරු තාක්ෂණවේදය ගුරුවරුන් 40ක් | දින 8ක වැඩසටහනක් මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී |
| ඇලුමිණියම් පිරික්සුම තාක්ෂණය | ඉංජිනේරු තාක්ෂණවේදය සිංහල හා දෙමළ මාධ්‍ය ගුරුවරුන් | දින 4බැගින් පුහුණු වැඩසටහන් 2ක් සපුගස්කන්ද ඇලුමැක්ස් ආයතනයේ දී |
| බිම් මැනීම හා මට්ටම් ගැනීම පිළිබඳ පුහුණුව | ඉංජිනේරු තාක්ෂණවේදය උගන්වන ගුරුවරුන් | දින 3ක වැඩමුළු 2ක් හා දින 4 වැඩමුළු 2ක් මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී |
| මෝටර් යාන්ත්‍රික තාක්ෂණවේදය පිළිබඳ න්‍යායික පුහුණුව හා ප්‍රායෝගික පුහුණුව | ඉංජිනේරු තාක්ෂණවේදය උගන්වන ගුරුවරුන් | දින 4 බැගින් වූ වැඩසටහන් 12ක් මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී හා ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දී |
| ඉංජිනේරු තාක්ෂණවේදය දෙමළ මාධ්‍ය ගුරු පුහුණුව | දෙමළ මාධ්‍ය ගුරුවරුන් | දින 4 බැගින් පුහුණු වැඩසටහන් 3ක් යාපනය තාක්ෂණ විද්‍යාලයේ දී |
| ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ ගුරු පුහුණු | ඉංජිනේරු තාක්ෂණවේදය උගන්වන ගුරුවරුන් | දින 3 බැගින් වූ හා දින 4 බැගින් වූ නේවාසික පුහුණු වැඩසටහන් 3ක් මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී හා මරදාන කාර්මික විද්‍යාලයේ දී |
| ඉංජිනේරු ඇඳීම පිළිබඳ පුහුණුව | ඉංජිනේරු තාක්ෂණවේදය උගන්වන ගුරුවරුන් | දින 4ක නේවාසික පුහුණු වැඩසටහනක් ජාතික අධ්‍යාපන ආයතනයේ දී |
| ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ පුහුණුව | ඉංජිනේරු තාක්ෂණවේදය උගන්වන ගුරුවරුන් | දින 4 නේවාසික වැඩසටහන් 2ක් |
| පරිගණක ඇඳීම පිළිබඳ පුහුණුව | ඉංජිනේරු තාක්ෂණවේදය උගන්වන ගුරුවරුන් 36ක් | දින 3ක නේවාසික පුහුණු වැඩසටහන් 2ක් ඉංජිනේරු තාක්ෂණය විශ්ව විද්‍යාල විද්‍යායතනයේ දී හා මාතර ඊ සොෆ්ට් කැම්පස් හි දී |
| මෝටර් රථ යාන්ත්‍රික ඉදිකිරීම් තාක්ෂණය, කුරුඳු තෙල් නිෂ්පාදනය හා ආහාර තාක්ෂණය පිළිබඳ පුහුණුව | ඉංජිනේරු තාක්ෂණවේදය උගන්වන ගුරුවරුන් | දින 2ක නේවාසික වැඩමුළුවක් ජා ඇල ශ්‍රී ලංකා ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ දී |
| තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ දැනුම්වත් කිරීම | දෙමළ මාධ්‍ය විදුහල්පතිවරු | වැඩසටහන් 8ක් |
| තාක්ෂණවේදය හදාරණ සිසුන් සඳහා පුහුණු වැඩසටහන | මීගමුව අධ්‍යාපන කලාපයේ සිසුන් | ඔරුගොඩවත්ත AETI ආයතනයේ පුහුණු වැඩසටහන සඳහා ප්‍රතිපාදන ලබාදීම |
| B.Ed උපාධි පාඨමාලාව | ඉංජිනේරු තාක්ෂණවේදය උගන්වන ගුරුවරුන් 190ක් | පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ 88ක්, යාපනය විශ්ව විද්‍යාලයේ 25ක් හා SLIIT ආයතනයෙහි 77ක් සඳහා පාඨමාලා ශාස්ත්‍ර ගෙවීම. |



ධාරිතා සංවර්ධන වැඩසටහන්

**ගුණාත්මක සංවර්ධනය**

- තාක්ෂණවේදය විෂය ධාරාව සහිත පාසල් සංඛ්‍යාව 2013 දී 251 සිට 2017 වන විට 380 දක්වා ත් තාක්ෂණ පීඨ සංඛ්‍යාව 2013 දී 251 සිට 2017 වන විට 286 දක්වා ත් වැඩිවිය.
- තාක්ෂණ විෂය ධාරාවේ ප්‍රවර්ධනය සඳහා යෝජනා ලබා ගැනීම සඳහා අධ්‍යාපන ලේකම් විසින් කමිටුවක් පත් කළ අතර වැඩමුලු 5ක් පවත්වා සකස් කරන ලද ප්‍රවර්ධන කමිටුවේ වාර්තාව අධ්‍යාපන ලේකම් වෙත භාර දීම සිදුවිය.
- අ.පො.ස.(උ.පෙ) තාක්ෂණ විෂය ධාරාව පිළිබඳ දැනුම්වත් කිරීම හා නව විෂය නිර්දේශ බෙදා හැරීම සඳහා පළාත් මට්ටමින් වැඩසටහන් 9ක් ක්‍රියාත්මක කරන ලදී.
- 13 වසරක සහතික කළ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන සඳහා පොත් තෝරා ගැනීමේ දෙදින වැඩසටහන් ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවැත්විණි.
- තාක්ෂණ පීඨයේ සිසු ක්‍රියාකාරකම් සඳහා එක් පාසලකට රු.50,000 බැගින් පාසල් 226ක් වෙත ප්‍රතිලාභ ලබාදීම.

## 5.4.2 ජෛව පද්ධති තාක්ෂණවේදය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| අ.පො.ස.(උ/පෙළ) ජෛව තාක්ෂණවේදය ප්‍රායෝගික ක්‍රියාකාරකම් | ජෛව පද්ධති තාක්ෂණවේද ගුරුවරුන් | වැඩසටහන් 10ක් |
| ජෛව පද්ධති තාක්ෂණවේදය උපකරණ පරිහරණය, නඩත්තුව හා අංක සංශෝධනය | ගුරු උපදේශකවරු 80ක් | ප්‍රායෝගික වැඩසටහන 2ක් |
| නවක පත්වීම්ලාභී ගුරුවරුන් දිශාභිමුඛ කිරීම | සිංහල හා දමිළ මාධ්‍ය ගුරුවරුන් 250ක් | එක් පුහුණු වැඩසටහනක් |
| ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිසු කඳවුරු පැවැත්වීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම | අධ්‍යාපන නිලධාරීන් හා ගුරු උපදේශකවරු 47ක් | එක් පුහුණු වැඩසටහනක් |
| ආහාර විද්‍යාව ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණුව | නවක උපාධාධාරී ගුරුවරු 314ක් | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දී ප්‍රායෝගික වැඩමුළුවක් |

**ගුණාත්මක සංවර්ධනය**

- කෘෂි විද්‍යාව හා ජෛව තාක්ෂණවේදය හදාරණ උසස් පෙළ සිසුන්ගේ උසස් අධ්‍යාපන අවස්ථා හා රැකියා අවස්ථා පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම.
- ජෛව පද්ධති තාක්ෂණවේදයේ ප්‍රායෝගික පුහුණුවීම් තක්සේරුව සඳහා මාර්ගෝපදේශය සකස් කිරීම.
- නිලධාරීන් 50ක ගේ සහභාගිත්වයෙන් පළාත් සඳහා පස් අවුරුදු කෘෂිකර්ම පරිසර හා ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය සංවර්ධන සැලැස්මක් සකස් කිරීම.
- අ.පො.ස.(උ.පෙ) ජෛව පද්ධති තාක්ෂණවේදයේ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් විෂය පථයට අදාළ උපදෙස් සංග්‍රහය වයඹ විශ්ව විද්‍යාලය මගින් සංස්කරණ කටයුතු සිදු කර ගැනීම.
- ජෛව පද්ධති තාක්ෂණවේදය ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අවශ්‍ය ක්ෂය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම සඳහා රු.මි.11.76ක ප්‍රතිපාදන අදාළ පාසල් 196ක් වෙත ලබා දීම.
- අ.පො.ස.(උ.පෙ) ජෛව පද්ධති තාක්ෂණවේදය පළාත් මට්ටමින් ප්‍රායෝගික සිසු කඳවුරු පැවැත්වීම සඳහා මාර්ගෝපදේශයක් සකස් කිරීම.
- උසස් පෙළ තාක්ෂණවේදය විෂයය ධාරාව සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීම.

- උසස් පෙළ ජෛව පද්ධති තාක්ෂණවේදය සහ කෘෂි විද්‍යාව විෂය නිර්දේශ සම්බන්ධ නිර්දේශ ජාතික අධ්‍යාපන ආයතනය වෙත ලබා දීම.

### 5.4.3 අ.පො.ස. (සා.පෙළ) තාක්ෂණික විෂයයන්

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| **ඇලුමිනියම් පිරිසැකසුම්කරණය** | සියනෑ අධ්‍යාපන පීඨයේ ගුරු සිසුන් | දින 4 බැගින් වූ වැඩමුළු 3ක් ගම්පහ කාර්මික විද්‍යාලයේ දී |
| **10,11 ශ්‍රේණි සඳහා සිවිල් යාන්ත්‍රික හා ඉදිකිරීම තාක්ෂණවේදය හා නිර්මාණකරණය** | අ.පො.ස.(සා.පෙළ) තාක්ෂණවේදය ගුරුවරුන් 27ක් | දින 4ක නේවාසික පුහුණු වැඩසටහන් ජාතික අධ්‍යාපන ආයතනයේ දී |
| **ගින්හැම් ලේස් නිර්මාණය හා පබළු නිර්මාණය** | නිර්මාණකරණ හා තාක්ෂණවේදය ගුරුභවතුන් 42ක් | නේවාසික පුහුණුවක් |
| **මෝටර් යාන්ත්‍රික තාක්ෂණවේදය** | නිර්මාණකරණය හා තාක්ෂණවේදය ගුරුභවතුන් 21ක් | දින 4ක පුහුණුවක් ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දී |
| **ශිල්ප කලා විෂයයන්** | ශිල්ප කලා විෂය උගන්වන ගුරුවරුන් | පුහුණු වැඩසටහන් 3ක් රත්මලාන පේෂකර්ම ඇගලුම් ආයතනයේ දී හා වැඩසටහන් 2ක් ජාතික අධ්‍යාපන ආයතනයේ දී |
| | ශිල්ප කලා විෂය උගන්වන ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් | දින 4ක පුහුණු වැඩසටහන් ඉබ්බාගමුව අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයේ දී |

### 5.4.4 ගෘහ ආර්ථික විද්‍යාව

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| අ.පො.ස.(උසස් පෙළ) තාක්ෂණ විෂය ධාරාවට අයත් ගෘහ ආර්ථික විද්‍යාව | ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 608ක් | පුහුණු වැඩමුළු 8ක් |
| | අ.පො.ස.(උසස් පෙළ) ගෘහ ආර්ථික විද්‍යාව ගුරුවරු 303ක් | දින 4 ක වැඩමුළු 10ක් ශ්‍රී ලංකා රෙදි පිලි ආයතනයේ දී |
| | අ.පො.ස.(උසස් පෙළ) ගෘහ ආර්ථික විද්‍යාව ගුරුවරු 319ක් | දින 3ක වැඩමුළු 9ක් රත්නපුර හෝටල් පාසලේ දී හා දින 2ක වැඩමුළුවක් මහනුවර ටොපැස් හෝටලයේ දී |

**භෞතික සංවර්ධනය**

- සියලුම පළාත් නියෝජනය වන පරිදි තෝරා ගත් පාසල් 100කට ගෘහ විද්‍යාගාර අලුත්වැඩියා සඳහා රු.ලක්ෂ 5 බැගින් මූල්‍ය ප්‍රදාන ලබා දීම.
- පාසල්වල ගෘහ ආර්ථික විද්‍යා විෂයය සංවර්ධනය කිරීමේ අරමුණින් සිංගර් ආයතනයේ අනුග්‍රහයෙන් පාසල් 150ක් සඳහා ගෘහ විද්‍යා උපකරණ ලබා දීම..







ගෘහ ආර්ථික විද්‍යා තරගාවලිය

## 5.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| Oracle සහතික ලත් ජාවා මූලිකාංග (java Fundamental) පුහුණුව ලබා දී Oracle පුහුණුකරුවන් ලෙස පත් කිරීම | ගුරුවරුන් 25ක් | Oracle Cooperation ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමට අනුව |
| නවක ගුරුවරුන් දිශාභිමුඛ කිරීම | තොරතුරු හා සන්නිවේද තාක්ෂණ විෂය ජාතික ශික්ෂණ ඩිප්ලෝමාධාරී ගුරුවරුන් 101 | දින 5 ක නේවාසික පුහුණුවක් |
| අ.පො.ස.(සා/පෙළ) තොරතුරු තාක්ෂණය විෂය | ගුරුවරු 79ක් | වැඩසටහනක් |
| | වතු පාසල් හි අ.පො.ස.(සා/පෙළ) තොරතුරු තාක්ෂණය විෂය ගුරු සාහායකයින් 19ක් | පුහුණු වැඩමුළුවක් |
| ඉසුරු ලින්ක්ස් මෘදුකාංගය හඳුන්වාදීම | නැගෙනහිර පළාතේ ගුරුවරු 40ක් | පුහුණු වැඩසටහනක් |
| ICDL පාඨමාලාව | ගුරුවරුන් 80ක් | පහසුකම් සැලසීම |
| තොරතුරු සහ සන්නිවේදන අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා විදේශ පුහුණුව | තොරතුරු තාක්ෂණ විෂයභාර ගුරුවරුන් හා නිලධාරීන් 25ක් | අධ්‍යාපන අමාත්‍යාංශයත් කොරියානු ජනරජයත් අතර අවබෝධතා ගිවිසුමට අනුව ග්වැන්ග්ජු මෙට්‍රොපොලිටන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සති 2ක පුහුණුවක් |
| සුහුරු පන්ති කාමරය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයනය | ගුරුවරු 7 දෙනෙකු ඇතුළු 10 දෙනෙකු ගේ කණ්ඩායමක් | ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ආසියා අධ්‍යාපන පදනම |

**විෂයය සංවර්ධන ක්‍රියාකාරකම්**

- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් ධාරිතා සංවර්ධනය, ඩිජිටල් ඉගෙනුම් ආධාරක සංවර්ධනය, ඉගෙනුම් හා ඇගයීම් ක්‍රියාවලිය බලගැන්වීම, අධ්‍යාපන ක්‍රියාවලිය හා කළමනාකරණ ක්‍රියාවලිය බලගැන්වීම යන අංශ 5 යටතේ අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ප්‍රධාන සැලැස්ම සකස් කිරීම.
- තමන් ජීවත් වන සමාජ වටපිටාව තුළ ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි ආකාරයට අන්තර්ජාලය හැසිරවීමට විවිධාකාර වූ වයස් පරාස තුළ සිටින ප්‍රජාවන් දැනුම්වත් කිරීම සඳහා “IT යහමග” ව්‍යාපෘතිය සර්වෝදය ෆියුෂන් ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය හා එකාබද්ධ ව දියත් කිරීම.
- 1-13 ශ්‍රේණිවල සියලුම විෂයයන් සඳහා ඉගෙනුම් මෘදුකාංග සංවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් පැවැත්වීම.
- පාසල් 2820ක සිසුන් 159,078 හා ගුරු හා විදුහල්පතිවරු 36,070ක් සඳහා නොමිලයේ ටැබ් පරිගණක ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- ජාතික මට්ටමේ පරිගණක උපාංග හා ජාල නඩත්තු වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය හා එක්ව පාසල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිෂ්‍ය සමාජ බල ගැන්වීම යටතේ පාසල් 450ක ක්‍රියාත්මක වීම.

**ශිෂ්‍ය පාදක ක්‍රියාකාරකම්**

- ත්‍රිමාණ මුද්‍රණ තාක්ෂණය පාසල් සිසුන් අතර ප්‍රචලිත කිරීමත් අධ්‍යාපනය සඳහා යොදා ගැනීමත් ලෝක ත්‍රිමාණ මුද්‍රණ දිනය සැමරීමටත් මොබිටෙල් ආයතනය සහ RCS 2 (Research Creative Services & Sales) සමග එක්ව පරිගණක ආශ්‍රිත ත්‍රිමාණකරණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ ත්‍රිමාණ මුද්‍රණය පිළිබඳ දින 3ක සිසු පුහුණු කඳවුරක් පැවැත්වීම.
- INFOTEL 2017 ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රදර්ශනය සඳහා පාර්ශවකරුවකු ලෙස කටයුතු කිරීම. මෙහි දී තොරතුරු තාක්ෂණ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් හා සම්මන්ත්‍රණ සඳහා පාසල් සිසුන් 3500ක් පමණ සහභාගී කරවීම.

**නැණස අධ්‍යාපන රූපවාහිනී නාලිකාව**

- අ.පො.ස.(සා/පෙළ) 10 හා 11 ශ්‍රේණිවල විෂය නිර්දේශ ආවරණය වන පරිදි දෙමළ මාධ්‍ය නාලිකාවක් හා 12

හා 13 ශ්‍රේණි ඇතුළත් අ.පො.ස.(උ/පෙළ) විෂය නිර්දේශ ආවරණය වන පරිදි නාලිකාවක් වශයෙන් නාලිකා ද්විත්වයක් ආරම්භ කිරීමට අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

**ඉ තක්සලාව ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතිය**

- අ.පො.ස.(උ/පෙළ) විෂයයන්ට අදාළ ව ඉගෙනුම් මෘදුකාංග 50ක් සහ සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය ප්‍රශ්න පත්‍ර 5,000ක් ඇතුළත් කිරීම.

**සමස්ත වියදම රු.මි.25.775**





තොරතුරු තාක්ෂණ විෂය සම්බන්ධ ශිෂය පාදක වැඩසටහන්

## 5.6 කෘෂිකර්ම හා පරිසර අධ්‍යයනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම යටතේ කෘෂි තාක්ෂණය හා කෘෂිකර්මය ආශ්‍රිත වෘත්තීය විෂයයන් ක්‍රියාත්මක කිරීම | නිලධාරීන් 120ක් | වැඩසටහන් 2ක් |
| අ.පො.ස.(උ/පෙළ) කෘෂි විද්‍යාව නව විෂය නිර්දේශය ප්‍රායෝගික ක්‍රියාකාරකම් | ගුරුවරුන් 54ක් | එක් පුහුණු වැඩසටහනක් |
| කෘෂිකර්ම හා ආහාර තාක්ෂණය විෂය නිර්දේශය පිළිබඳ දැනුම්වත් කිරීම | නවක පත්වීම්ලාභී ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුභවතුන් 39ක් | දැනුම්වත් කිරීමේ වැඩසටහනක් |
| ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන සම්බන්ධව පුහුණුකරුවන් පුහුණු කිරීම. | පළාත් මට්ටමේ පුහුණුකරුවන් 60ක් | එක් පුහුණු වැඩසටහනක් |
| තිරසර පාසල් වැඩසටහන යටතේ ජාතික පරිසර සංරක්ෂණ වැඩසටහන පාසල්වල ක්‍රියාත්මක කිරීම | පළාත් මට්ටමේ පුහුණුකරුවන් 135ක් | වැඩසටහන් 2ක් |
| GLOBE පරිසර සිසු පර්යේෂණ සිදු කිරීම | කෘෂි විද්‍යාව උගන්වන ගුරුවරුන් 114ක් | ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 2ක් |

**ගුණාත්මක සංවර්ධනය**

- “ළඟ ම පාසල හොඳ ම පාසල” වැඩසටහන යටතේ කෘෂි තාක්ෂණ ඒකක භාවිතය සම්බන්ධව උපදෙස් සංග්‍රහයක් සකස් කිරීම.
- සමස්ත ලංකා කෘෂි විද්‍යා දැනුම මිනුම තරගය පැවැත්වීම.
- ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාම වැඩසටහනේ සිසු දින ජාතික උත්සවය ඔක්තෝබර් මස 07වන දින දොම්පේ සියනෑ ජාතික පාසලේ දී පැවැත්වීම.
- ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන සියලුම පාසල්වල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම.
- ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමයට සමගාමීව ආදර්ශ පාසල් ගෙවත්ත නමින් අත්පොතක් මුද්‍රණය කර පාසල් වෙත බෙදා හැරීම.
- තිරසර පාසල් වැඩසටහන යටතේ ජාතික පරිසර සංරක්ෂණ වැඩසටහන පාසල්වල ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය මොඩියුල සකස් කර පළාත් වෙත බෙදා හැරීම.
- GLOBE (පරිසරයේ යහ පැවැත්ම සඳහා අධ්‍යයනය හා නිරීක්ෂණය වැඩසටහන) ජල අධ්‍යයන අත්පොත පිටපත් 1000ක් මුද්‍රණය කිරීම.

- පරිසර සංරක්ෂණය සම්බන්ධ දැන්වීම් හා අත්පත්‍රිකා සකස් කර බෙදා හැරීම.
- GLOBE වැඩසටහන යටතේ විෂය ක්ෂේත්‍ර ආවරණය කරන ලද වයඹ, දකුණ, සබරගමුව හා උතුරු පළාත් පාසල්වල කාලගුණ විද්‍යා ඒකක පිහිටුවීම සඳහා ප්‍රතිපාදන ලබාදීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ තිරසර ලංකා ජාතික අධ්‍යාපනික ප්‍රදර්ශනයේ දී කාබනික පළිබෝධනාශක පිළිබඳ සිසුන් දැනුම්වත් කිරීමේ පෝස්ටර් හා අත්පත්‍රිකා සකස් කර බෙදා හැරීම.
- හරිත පාසල් උපදෙස් සංග්‍රහයක් සකස් කිරීම.




හරිත පාසල් වැඩසටහන

## 5.7 වාණිජ හා ව්‍යාපාර අධ්‍යයනය

නව ලෝකයට ගැලපෙන නව ව්‍යවසායකයින් බිහිවන අධ්‍යාපනයක් සිසුන් වෙත ලබා දීම සඳහා වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන විෂයභාර නිලධාරීන්ගේ ගුරු උපදේශකවරුන්ගේ හා ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා විවිධ වැඩසටහන් වසර තුළ ක්‍රියාත්මක කරන ලදී. වාණිජ හා ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම මෙන්ම වාණිජ්‍ය විෂයය ධාරාව සඳහා වූ සිසු ආකර්ෂණය වැඩි කර ගැනීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| අ.පො.ස.(උ/පෙළ) හා 10, 11 ශ්‍රේණිවල වාණිජ්‍ය විෂයයන් ක්‍රියාත්මක කිරීම | සිංහල හා දෙමළ මාධ්‍ය වාණිජ්‍ය විෂයයභාර නියෝජ්‍ය හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හා ගුරු උපදේශකවරුන් 176 | සියලුම පළාත්වල වැඩසටහන් |
| තෝරාගත් විශ්ව විද්‍යාලවල සහතික පත්‍ර පාඨමාලා හැදෑරීම | අ.පො.ස.(උ/පෙළ) වාණිජ්‍ය විෂය ධාරාවේ ගුරුවරුන් | මූල්‍ය පහසුකම් සැපයීම |
| අ.පො.ස.(උ/පෙළ) වාණිජ්‍ය විෂය ධාරාවට සිසුන් වැඩි කර ගැනීම | උසස් පෙළ වාණිජ්‍ය අංශ ප්‍රධානීන් 274ක් | දින 2ක වැඩසටහන් |
| අ.පො.ස.(සා/පෙළ) විෂයය සාධනය වැඩිකිරීම | අ.පො.ස.(සා/පෙළ) ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය, ව්‍යවසායකත්ව අධ්‍යයනය උගන්වන ගුරුවරුන් 217ක් | දින 2ක වැඩසටහන් |
| නවක ගුරුවරුන් දිශාභිමුඛ කිරීම හා පුහුණුව | අ.පො.ස.(උ/පෙළ) ගණකාධිකරණය, ආර්ථික විද්‍යාව හා ව්‍යාපාර අධ්‍යයනය ගුරුවරු 552ක් | එක් පුහුණු වැඩසටහනක් |
| වාණිජ විෂයය ධාරාවේ ගැටළු සම්බන්ධ ක්‍රියාකාරකම් පාදක පර්යේෂණ | වාණිජ්‍ය අංශයේ ගුරුවරුන්ට | එක් වැඩසටහනක් |

**ගුණාත්මක සංවර්ධනය**

- අ.පො.ස.(උ/පෙළ) ගණකාධිකරණය, ව්‍යාපාර අධ්‍යයනය හා ආර්ථික විද්‍යාව යන විෂයයන් හි සෑම පාඩමක් සඳහාම ප්‍රශ්ණ පත්‍ර බැංකුවක් සකස් කිරීම.
- අ.පො.ස.(සා/පෙළ) ව්‍යාපාර හා ගිණුම්කරණය සහ ව්‍යවසායකත්ව අධ්‍යයනය යන විෂයයන්ට අනුමාන ප්‍රශ්න පත්‍ර සකස් කර කලාප කාර්යාල වෙත CD තැටි ලබා දීම.

## 5.8 සෞන්දර්ය අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| **නර්තනය විෂයය** | | |
| ගුරු සංවර්ධනය | සිංහල හා දෙමළ මාධ්‍ය ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 210 | වැඩසටහන් 2ක් |
| ගුරුවරුන්ගේ තාක්ෂණික දැනුම සංවර්ධනය | ගුරුවරුන් 200ක් | දින 3 බැගින් වූ වැඩසටහන් 2ක් |
| ගුරු හා සිසු ධාරිතා වර්ධනය | අ.පො.ස.(සා/පෙළ) සිසුන් 75ක් හා ගුරුවරුන් 150ක් | එක් වැඩසටහනක් |
| සිසුන්ගේ දැනුම සංවර්ධනය | සිසුන් 503ක් | වැඩසටහන් 3ක් |
| සිසුන්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය | සිසුන් 250ක් | එක් වැඩසටහන් |
| **පෙරදිග සංගීතය විෂයය** | | |
| විෂයභාර නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් බලාත්මක කිරීම | විෂයභාර නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් 130ක් | දින 2 බැගින් වූ පුහුණු වැඩසටහන් 2ක් |
| ප්‍රායෝගික කුසලතා සංවර්ධනය | අ.පො.ස.(උ/පෙළ) සිසු සිසුවියන් 500ක් | "රාග් ශ්‍රවන්" ශාස්ත්‍රීය සංගීත ශිල්පීය ප්‍රාසාංගික වැඩසටහන් 2ක් |
| | සිසුන් 400ක් | "රාග් වලන්" සංගීත ශිල්පීය ප්‍රාසාංගික වැඩසටහන |
| | සිසුන් 250ක් | "රාග් මිලාන්" සංගීත ශිල්පීය ප්‍රාසාංගික වැඩසටහනක් |
| **බටහිර සංගීතය** | | |
| බටහිර සංගීතය විෂයය ප්‍රවර්ධනය | ගුරුවරුන් 488ක් | වැඩසටහන් 2ක් |
| ජාතික තරුණ වාදක මණ්ඩලය | සිසුන් 200ක් | වසර පුරා |
| **චිත්‍ර** | | |
| විෂයභාර නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් බලාත්මක කිරීම | විෂයභාර නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් 110ක් | දින 2ක වැඩමුළුවක් |
| ගුරු හා ගුරු උපදේශක ධාරිතා සංවර්ධනය | ගුරු උපදේශකවරු හා ගුරුවරුන් 100ක් | දින 2ක පුහුණු වැඩසටහනක් |
| **නාට්‍ය හා රංග කලාව** | | |
| පූර්ව සේවා ගුරු පුහුණුව | නාට්‍ය හා රංගකලා අධ්‍යාපනවේදී උපාධිධාරී ගුරුවරුන් 50ක් | එක් වැඩසටහනක් |

**සමස්ත ලංකා තරග**

- දිවයින පුරා පාසල් 1000ක පමණ සිසුන් 15,300ක ගේ සහභාගීත්වයෙන් සමස්ත ලංකා පාසල් නර්තන සිංහල මාධ්‍ය හා දමිළ මාධ්‍ය තරග පවත්වා සම්මාන උත්සවය පැවැත්වීම.
- සිසුන් 15000ක ගේ පමණ සහභාගීත්වයෙන් 2017 සමස්ත ලංකා පාසල් සංගීත තරගය පැවැත්වීම.
- සිසුන් 7000කගේ සහභාගීත්වයෙන් පළාත් තරඟ හා සිසුන් 4000ක ගේ සහභාගීත්වයෙන් ජාතික තරඟ වශයෙන් සමස්ත ලංකා පාසල් බටහිර සංගීත තරඟය - 2017 පැවැත්වීම.
- සමස්ත ලංකා පාසල් කර්ණාටක සංගීත තරඟය මෙම වසරේ සිට ආරම්භ කර පැවැත්වීම.
- දිවයිනේ සියලුම පාසල්වල ඉගෙනුම ලබන සිසුන්ගේ නියෝජනයෙන් සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරඟය 2017 අදියර 2ක් යටතේ පැවැත්වීම.
- සිසුන් 8500කගේ පමණ සහභාගීත්වයෙන් සමස්ත ලංකා නාට්‍ය හා රංගකලා උළෙල පැවැත්වීම.

**වෙනත් වැඩසටහන්**

- මහනුවර අධ්‍යාපන කලාපය විසින් පැවැත් වූ "කමලරසු නද" සෞන්දර්ය අධ්‍යාපන වැඩසටහනට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම.
- ජාතික තරුණ වාදක මණ්ඩලයේ 25වන සංවත්සර ප්‍රසංගය බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීම.
- ආසියානු ළමා චිත්‍ර තරඟයේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට සහතික පත්‍ර ලබා දීමේ උත්සවය පැවැත්වීම.
- ටවර් රඟහල මගින් පවත්වන සමස්ත ලංකා නාට්‍ය තරගය සම්බන්ධීකරණය.
- හැටන් හයිලන්ඩ් විද්‍යාලයේ දී හා මඩකලපුව හින්දු විද්‍යාලයේ දී වසර පුරාම පැවැත්වෙන ශනි දින බහු ශිල්ප වැඩසටහන වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන මධ්‍යම හා නැගෙනහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත ලබා දීම.






සෞන්දර්ය විෂය සංවර්ධන වැඩසටහන්





සෞන්දර්ය විෂය තරගාවලි



# 5.9 ක්‍රීඩා හා ශාරීරික  අධ්‍යාපනය

## ධාරිතා සංවර්ධන වැඩසටහන්

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| සෞඛ්‍ය හා ශාරීරික  අධ්‍යාපනය ගුරු සංවර්ධනය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම | පුහුණුකරුවන් | දින 2ක වැඩමුළුවක් මීපේ නායකත්ව සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී |
| ශාරීරික යෝග්‍යතාවය | සෞඛ්‍ය හා ශාරීරික  අධ්‍යාපන ගුරුවරුන් | දින 2 බැගින්  පුහුණු වැඩසටහන් 3ක් |
| රග්බි, ජිම්නාස්ටික්, තයිකොන්ඩෝ හා ත්‍රෝබෝල් යන ක්‍රීඩා | සෞඛ්‍ය හා ශාරීරික  අධ්‍යාපන ගුරුවරුන් | එක් ක්‍රීඩාවක් වෙනුවෙන් දින 2 බැගින් වූ පුහුණු වැඩසටහන් 4ක් |
| බර එසවීම, ප්‍රාථමික ක්‍රීඩා හා ජූඩෝ යන ක්‍රීඩා | සෞඛ්‍ය හා ශාරීරික  අධ්‍යාපන ගුරුවරුන් | එක් ක්‍රීඩාවක් වෙනුවෙන් දින 3 බැගින් වූ පුහුණු වැඩසටහන් 3ක් |
| පාපන්දු ක්‍රීඩාව | සෞඛ්‍ය හා ශාරීරික  අධ්‍යාපන ගුරුවරුන් | දින 2 බැගින් වූ වැඩසටහන් 2ක් පාපන්දු සම්මේලන මූලස්ථානයේ දී |
| මලල ක්‍රීඩා | සෞඛ්‍ය හා ශාරීරික  අධ්‍යාපන ගුරුවරුන් | දින 4ක පුහුණු වැඩසටහනක් |
| සමස්ත ලංකා මලල ක්‍රීඩා තරඟ සඳහා විනිසුරු පුහුණු කිරීම | සම්පත් පුද්ගලයින් 345 | දින 3බැගින් වූ පුහුණු වැඩසටහන් 3ක් යාපනය, දඹුල්ල හා මාතර දී |
| සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරඟ සංවිධානය | සම්පත්දායකයින් | එක් පුහුණු වැඩසටහනක් |
| කලාප ක්‍රීඩා සංවර්ධනය | කලාප ක්‍රීඩා සංවර්ධන නිලධාරී 530ක් | දැනුම්වත් කිරීමේ වැඩසටහනක් |
| පාසල් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාථමික අංශයේ ක්‍රීඩා සංවර්ධනය | කලාප ක්‍රීඩා සම්බන්ධීකාරකවරුන් ලෙස ගුරු උපදේශකවරුන් 80ක් | එක් පුහුණු වැඩසටහනක් |
| | ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීම | රු.මි.7.7ක ප්‍රතිපාදන පළාත් වෙත ලබා දීම |
| පාසල් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රීඩා 7ක් සංවර්ධනය | කලාප ක්‍රීඩා සම්බන්ධීකරණ උපදේශකවරුන් | දිනක 3ක පුහුණු වැඩසටහන් 6ක් |
| | කලාප මට්ටමින් ගුරුවරුන් | රු.මි.14.74ක ප්‍රතිපාදන පළාත් වෙත ලබා දීම |






**ගුණාත්මක සංවර්ධනය**

- ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා ජාතික සංවර්ධන සැලැස්ම (2017-2021) සකස් කිරීම
- පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීම.
- 2017 සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගාවලිය පැවැත්වීම.
- ප්‍රථම වරට 3,4,5 ශ්‍රේණිවල සිසුන් සඳහා සමස්ත ලංකා පාසල් ළමා මලල ක්‍රීඩා තරගාවලිය පැවැත්වීම.
- ශාරීරික අධ්‍යාපන විෂයය ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් 3800ක් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ශරීර සුවතා වැඩසටහන විධිමත්ව සිදු කිරීම සඳහා උපදෙස් සංග්‍රහයක් නිකුත් කර පුහුණුකරුවන් පුහුණු කිරීම.
- තෝරාගත් ක්‍රීඩා 10 ක සඳහා ක්‍රීඩා දක්ෂතා ඇති සිසුන් සහභාගි කර පුහුණු සංචිත ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම.

**භෞතික සංවර්ධනය**

- ක්‍රීඩා පාසල් සංඛ්‍යාව වැඩි කිරීම හා ඒවායේ පහසුකම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය සඳහා 2017 අයවැය මගින් රු.මි.200ක ප්‍රතිපාදන හිමිවූ අතර එමගින් ක්‍රීඩා පාසල්වල වොලිබෝල් නෙට්බෝල් හා බාස්කට් බෝල් ක්‍රීඩා පිටි ඉදිකිරීමටත් සක්‍රීයව පවතින ක්‍රීඩා පාසල් 18 සඳහා කායවර්ධන ක්‍රීඩාගාර සැලසුම් කිරීම හා කායවර්ධන උපකරණ ලබා දීම.

## 5.10 ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| ශිෂ්‍ය කඳවුරු | සිසුන් 300ක් | ප්‍රාදේශීය ඉංග්‍රීසි මධ්‍යස්ථාන මඟින් ශිෂ්‍ය කඳවුරු 30 ක් |
| ඉංග්‍රීසි විෂයයභාර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | නියෝජ්‍ය හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් 67ක් | එක් වැඩසටහනක් |
| සමස්ත ලංකා ඉංග්‍රීසි දින තරඟාවලියේ විනිශ්චයකාරවරු පුහුණු කිරීම | තරඟ විනිශ්චයකාරවරුන් | එක් පුහුණු වැඩසටහනක් |
| ප්‍රංශ භාෂාව උගන්වන ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය | ගුරුවරුන් 58ක් | එක් වැඩමුළුවක් |
| අනාගත ලෝකයට ගැලපෙන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නවීකරණය සඳහා ගුරු අධ්‍යාපනය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය iTESL (2017-2020) | | |
| පුහුණුකරුවන් පුහුණු කිරීම | තෝරා ගත් පුහුණුකරුවන් 18ක් | බ්‍රිතාන්‍ය කවුන්සිලය හා එක්ව දින 20ක පුහුණුවක් යාකරවත්ත අග්‍රගණ්‍ය ගුරු පුහුණු මධ්‍යස්ථානයේ දී |
| විද්‍යාපීඨවල උප පීඨාධිපතිවරු දැනුම්වත් කිරීම | උප පීඨාධිපතිවරු 19ක් | එක් වැඩසටහනක් |

**ගුණාත්මක සංවර්ධනය**

- පළමු ශ්‍රේණියේ ක්‍රියාකාරකම් පාදක කථන ඉංග්‍රීසි සඳහා ඉගෙනුම් පාඩම් මාලා 03ක් සකස් කිරීම.
- 6-11 ශ්‍රේණි ඉංග්‍රීසි භාෂාව බලගැන්වීම පිළිබඳ වැඩසටහන් 2ක් පැවැත්වීම.
- සිසුන් 1,224ක ගේ සහභාගීත්වයෙන් සමස්ත ලංකා ඉංග්‍රීසි හා නාට්‍ය තරගාවලිය පැවැත්වීම.
- උසස් පෙළ ඉංග්‍රීසි සාහිත්‍ය ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන ජාතික රූපවාහිනිය හා එක්ව පැවැත්වීම.
- ඉංග්‍රීසි අධ්‍යාපනය සම්බන්ධ සමුළුව 40 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්වීම.

## 5.11 ද්විභාෂා හා ත්‍රෛභාෂා අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| ද්විභාෂා අධ්‍යාපනය සම්බන්ධ නව ඉගෙනුම් ක්‍රමවේද | ද්විභාෂා ගුරුවරුන් | එක් වැඩමුළුවක් |
| කාර්යමූල පර්යේෂණ | ද්විභාෂා ගුරුවරුන් | වැඩමුළු 2ක් |
| ජාතික අවශ්‍යතා හා සමාජ සංහිඳියාව ඇති කිරීම සඳහා ත්‍රෛභාෂා වැඩසටහන් ප්‍රචලිත කිරීම | ද්විභාෂා ගුරුවරුන් හා නිලධාරීන් | කාර්ය සැසි 7ක් |

**ගුණාත්මක සංවර්ධනය**

- විෂයභාෂා සමෝධානිත ඉගෙනුම් ප්‍රවේශයේ (CLIL) ඉගෙනුම් ක්‍රමවේදයට ගුරුවරුන් සඳහා භාෂා සම්බන්ධ ඉගෙනුම් ඵල සහිත අත්පොත් සැකසීම.
- ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන් සහ ත්‍රෛභාෂා වැඩසටහන් නියාමනය සඳහා නියාමන රාමුවක් සකස් කිරීම සඳහා අධ්‍යාපන පද්ධතියේ විවිධ මට්ටම් නියෝජනය වන පරිදි කාර්ය සැසි 4ක් පැවැත්වීම.
- විෂයභාෂා සමෝධානිත ඉගෙනුම් ප්‍රවේශය පාසල්වලට සිදු කර ඇති බලපෑම නියාමනය සඳහා කාර්ය සැසි 4ක් පැවැත්වීම.
- ද්විභාෂා අධ්‍යාපන වැඩසටහනට අදාළ විවිධ ආයතනවල වගකීම් හඳුනා ගැනීම සඳහා පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් සමග පාර්ශවකරුවන්ගේ තොරතුරු විශ්ලේෂණය සඳහා සැසි 3ක් පැවැත්වීම.
- ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන සඳහා මානව සම්පත් අවශ්‍යතා හඳුනා ගැනීම හා අදාළ පාර්ශවයන්ගේ ධාරිතා සංවර්ධනය වෙනුවෙන් කාර්ය සැසි 2ක් පැවැත්වීම.

## 5.12 ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| සිංහල විෂයය උගන්වන ජ්‍යෙෂ්ඨ ගුරුවරු හා ගුරු උපදේශකවරුගේ ධාරිතා සංවර්ධනය | ජ්‍යෙෂ්ඨ ගුරුවරු හා ගුරු උපදේශකවරු 57ක් | එක් වැඩසටහනක් |
| දෙමළ විෂයය උගන්වන ජ්‍යෙෂ්ඨ ගුරුවරු හා ගුරු උපදේශකවරුගේ ධාරිතා සංවර්ධනය | ජ්‍යෙෂ්ඨ ගුරුවරු හා ගුරු උපදේශකවරු 118ක් | වැඩසටහන් 4ක් |
| දෙවන ජාතික භාෂාව විෂයය උගන්වන ජ්‍යෙෂ්ඨ ගුරුවරු හා ගුරු උපදේශකවරුගේ ධාරිතා සංවර්ධනය | ජ්‍යෙෂ්ඨ ගුරුවරු හා ගුරු උපදේශකවරු 265ක් | එක් වැඩසටහනක් |
| සමාජ විද්‍යාව විෂයයන් උගන්වන ජ්‍යෙෂ්ඨ ගුරුවරු හා ගුරු උපදේශකවරුගේ ධාරිතා සංවර්ධනය | ජ්‍යෙෂ්ඨ ගුරුවරු හා ගුරු උපදේශකවරු183ක් | මධ්‍යම පළාත් හා වයඹ පළාතේ වැඩසටහන් 2ක් |

**සමස්ත ලංකා තරගාවලි**

- සමස්ත ලංකා සිංහල භාෂා දින තරගාවලිය පැවැත්වීම.
- සමස්ත ලංකා දෙමළ භාෂා දින තරගාවලිය හා සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම.
- සමස්ත ලංකා දෙවන ජාතික භාෂා තරගාවලිය පැවැත්වීම.
- සමස්ත ලංකා සමාජ විද්‍යා තරගාවලිය පැවැත්වීම.

**අනෙකුත් සංවර්ධන වැඩසටහන්**

- නුවණ සඟරාව තෙවන වෙළුම දෙවන කලාපයේ පිටපත් 6500ක් මුද්‍රණය කිරීම.
- කුර්මති සඟරාව පිටපත් 3000ක් මුද්‍රණය කර බෙදා හැරීම.

## 5.13 ආගමික හා සාරධර්ම අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| විෂයභාර නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය | විෂයභාර නිලධාරීන් හා ගුරු උපදේශකවරු 125ක් | එක් වැඩසටහනක් |
| ආකල්ප සංවර්ධන | විෂය අධ්‍යක්ෂකවරු, ගුරු උපදේශකවරු හා ගුරුවරුන් ඇතුළු 116ක් | නැගෙනහිර පළාතේ එක් වැඩසටහනක් |
| සාරධර්ම අධ්‍යාපන ඉගෙනුම් ක්‍රමවේද | බිංගිරිය අධ්‍යාපන විද්‍යාපීඨයේ සිසුන් 280ක් | එක් වැඩසටහනක් |
| තොරතුරු තාක්ෂණය භාවිතය | බුද්ධ ධර්මය උගන්වන ගුරුවරුන් හා සම්පත්දායකයින් 51ක් | එක් පුහුණු වැඩසටහනක් |
| බුද්ධ ධර්මය ගුරුවරුන් පුහුණු කිරීම | බුද්ධ ධර්මය උගන්වන ගුරුවරුන් | වැඩමුළු 4ක් |
| | ගුරුවරුන් 76ක් | නේවාසික වැඩසටහන් 2ක් |
| කතෝලික විෂයය ගුරුවරුන් පුහුණු කිරීම | ගුරුවරුන් 220ක් | වැඩසටහන් 3ක් |
| 8 ශ්‍රේණිය කතෝලික ධර්මය නව විෂය නිර්දේශය පිළිබඳ දැනුම්වත් කිරීම | ගුරුවරුන් 80ක් | වැඩසටහන් 1ක් |
| ඉස්ලාම් විෂයය ගුරුවරුන් පුහුණු කිරීම | ගුරුවරුන් 70ක් | වැඩසටහන් 2ක් |
| හින්දු විෂයය ගුරුවරුන් පුහුණු කිරීම | ගුරුවරුන් 188ක් | වැඩසටහන් 2ක් |

**සාරධර්ම අධ්‍යාපනය**

- දෙමව්පියන් හා දරුවන්, ගුරුවරුන් හා සිසුන් අතර පවත්නා බැඳීම ශක්තිමත් කිරීම හා සාරධර්ම වර්ධනය සඳහා මාපිය සම්භාවනා වැඩසටහන් 13ක් ක්‍රියාත්මක කිරීම.
- සිසුන් හා ගුරුවරුන් 1300ක ගේ සහභාගීත්වයෙන් එක්සත් ජාතීන්ගේ වෙසක් දින උත්සවය ජාතික තරඟාවලිය පැවැත්වීම.
- සති පාසල් වැඩසටහන් 20ක් දිවයින පුරා පැවැත්වීම.
- සියලුම ආගම් නියෝජනය වන පරිදි තෝරා ගත් පාසල් ශිෂ්‍ය නායකයින් 134ක් හා ගුරුවරුන් 16ක් වෙනුවෙන් පොල්ගොල්ල අධ්‍යාපන විද්‍යා පීඨයේ දී අන්තර් ආගමික සම්බන්ධතා වැඩමුළුවක් පැවැත්වීම.
- තෝරා ගත් පාසල්වල බෞද්ධ ශිෂ්‍ය නායකයින් 155ක් හා ගුරුවරුන් 20ක් සඳහා සාරධර්ම අධ්‍යාපන වැඩසටහනක් බෝමිරිය ජාතික පාසලේදී පැවැත්වීම.

**ආගමික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන්**

- අ.පො.ස.(උ/පෙළ) බෞද්ධ ශිෂ්ඨාචාරය හදාරණ සිසුන් 190ක් වෙනුවෙන් ශිෂ්‍ය සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
- සම්පත්දායකයින් 21ක ගේ සහභාගීත්වයෙන් අ.පො.ස. (සා/පෙළ) බුද්ධ ධර්මය හා සම්පත්දායකයින් 19ක ගේ සහභාගීත්වයෙන් අ.පො.ස. (උ/පෙළ) බෞද්ධ ශිෂ්ටාචාරය වෙනුවෙන් අනුමාන ප්‍රශ්න පත්‍ර කට්ටල සකස් කිරීම.
- ඇඹිලිපිටිය, රත්නපුර, කන්තලේ, කොත්මලේ යන කලාපවල අ.පො.ස.(සා/පෙළ) සිසුන් 1,420ක් සඳහා අනුමාන ප්‍රශ්න පත්‍ර සහිතව ශිෂ්‍ය සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
- අ.පො.ස.(උ/පෙළ) කතෝලික ධර්මය හදාරණ සිසුන් වෙනුවෙන් ශිෂ්‍ය සම්මන්ත්‍රණ 2ක් පැවැත් වූ අතර ශිෂ්‍ය සහභාගීත්වය 420ක් විය.
- අ.පො.ස.(උ/පෙළ) ක්‍රිස්තියානි ධර්මය හදාරණ සිසුන් 300ක් සඳහා ශිෂ්‍ය සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
- ඉස්ලාම් ආගම හදාරණ සිසුන් වෙනුවෙන් මාර්ගෝපදේශ සකස් කිරීම.

## 5.14 විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම්

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| විෂය සමගාමී වැඩසටහන් පිළිබඳව නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය | ජාතික පාසල් හා "ළඟ ම පාසල හොඳ ම පාසල" වැඩසටහනට අයත් A ව්‍යාපෘතියේ නියෝජ්‍ය විදුහල්පතිවරුන් 495ක් | වැඩසටහන් 11ක් |
| ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම | විදුහල්පතිවරු 320ක් | දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් 7ක් |
| වෘත්තීය මාර්ගෝපදේශය සම්බන්ධ දැනුම්වත් කිරීම | තෝරාගත් කලාපවල ගුරුවරුන් 400ක් | වැඩසටහන් 4ක් |
| | නිලධාරීන් හා විදුහල්පතිවරුන් | පළාත් 5ක් වෙත රු.මි.1.18ක ප්‍රතිපාදන ලබා දීම |
| පළාත් මට්ටමින් මානසික ප්‍රථමාධාර කණ්ඩායම් ඇති කිරීම | පුහුණුකරුවන් 163ක් | වැඩසටහන් 6ක් |
| ප්‍රජාතන්ත්‍රවාදය, වගකීම් හා වගවීම් සම්බන්ධව ශිෂ්‍ය අත්දැකීම් ලබා දීම සඳහා ක්‍රියාත්මක ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන | සම්පත්දායකයින් පුහුණු කිරීම | වැඩසටහන් 2ක් |
| | නිලධාරීන්, විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුම්වත් කිරීම | වැඩසටහන් 19ක් |
| | ශිෂ්‍ය පාර්ලිමේන්තු අමාත්‍යවරුන් හා ගුරුවරුන් 470 ධාරිතා වර්ධන | වැඩමුළු 2ක් |

**අනෙකුත් සංවර්ධන වැඩසටහන්**

- 2008/14 චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන ක්‍රියාවට නැංවීමේදී පැන නැගුණු දුර්වලතාවයන් හඳුනා ගනිමින් එම දුර්වලතාවයන් මගහරවා ගැනීමටත් වඩාත් සක්‍රීයව හා ඵලදායීව ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 4/2016 චක්‍රලේඛය මගින් සංශෝධන හඳුන්වා දුන් අතර එය සඳහා ශිෂ්‍ය පාර්ලිමේන්තුව අත්පොත් සිංහල මාධ්‍ය 18,500ක් හා දෙමළ මාධ්‍ය 8,500ක් මුද්‍රණය කර බෙදාහැරීම.
- ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය හා ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය සඳහා රු.මිලියන 1.5 බැගින් හා සෞඛ්‍යදාන සංගමයට රු.මිලියන 1.0ක ප්‍රතිපාදන ලබා දීම.

**සාමය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යාපනය**

- දෙනුවර මිතුරෝ වැඩසටහන යටතේ උතුර හා නැගෙනහිර පළාත් පාසල් සිසු සිසුවියන් 200ක ගේ සහභාගීත්වයෙන් ගං වතුරෙන් හානියටපත් හිනිදුම මල්ලිකා විද්‍යාලයේ හා මාපලගම මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම.
- දෙමළ මාධ්‍ය පාසල් සිසුන් තුළ සාමය හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා පුත්තලම හා නිකවැරටිය අධ්‍යාපන කලාපවල දෙමළ මාධ්‍ය ගුරුවරුන් 50ක් සඳහා තෙදින ධාරිතා සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම.
- උතුර, නැගෙනහිර, ඌව, බස්නාහිර හා දකුණු පළාත්වල පාසල් සිසු සිසුවියන් 200ක ගේ සහභාගීත්වයෙන් යාපනය මධ්‍ය මහා විද්‍යාලයේ දී දෙනුවර මිතුරෝ වැඩසටහන පැවැත්වීම.
- සියලු ජාතීන් හා ආගම් අතර සාමය හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා ලෝක ළමා දිනයට සමගාමීව උතුර, නැගෙනහිර, ඌව, බස්නාහිර හා දකුණු පළාත්වල පාසල් සිසු සිසුවියන් 250ක ගේ සහභාගීත්වයෙන් රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දී සමරු වැඩසටහනක් පැවැත්වීම.

## 5.15 පාසල් පුස්තකාල සංවර්ධනය

- පළාත් හා කලාප පාසල් පුස්තකාල සම්බන්ධීකරණ නිලධාරීන් 81 දෙනෙකු පළමු අදියරේ දී දින තුනේ වැඩසටහන් 4ක් මඟින් ජාතික පුස්තකාල හා විද්‍යායතනයේ දී හා දෙවන අදියරේ දී දින දෙකේ පුහුණු වැඩසටහන් 3ක් මගින් රංගිරි දඹුලු මහා විද්‍යාලයේදී ද පුහුණු කිරීම.
- "අතීතයට යතුරක් අනාගතයට පාලමක්" යන තේමාව යටතේ "ළඟ ම පාසල හොඳ ම පාසල" වැඩසටහනට අයත් පාසල් 1,365ක් සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන බෙදා දුන් අතර එහි දී පාසල් පුස්තකාල සඳහා නිර්දේශිත පාසල් පුස්තකාල ග්‍රන්ථ නාමාවලියක් ද ප්‍රකාශයට පත් කරන ලදී.
- පාසල් සිසුන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීම මෙන්ම රසාස්වාදය දැනුම දියුණු කිරීම සඳහා "කළණ මිතුරු-පොත් සුමිතුරු" තේමාව යටතේ සිසුන් සඳහා දීප ව්‍යාප්ත කියවීම් තරඟයක් පවත්වා පදක්කම් ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම.
- පුස්තකාල විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි හැදෑරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම.




පාසල් පුස්තකාල සංවර්ධන වැඩසටහන්

## 5.16 අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය

- පාසල් පුස්තකාල බලපත්‍ර 8,286ක් ලබා දීම. එමඟින් රාජ්‍ය භාග ලෙස රු.මිලියන 1.16ක ආදායමක් ලබා දීම.
- පාසල් පුස්තකාල සඳහා පොත් තෝරා ගැනීමේ වැඩමුළු 5ක් පැවැත්වීම.
- ග්‍රන්ථ 14,021කින් 7,176ක් සඳහා අනුමත බලපත්‍රය ලබා දීම.
- කියවීමේ රුචිය වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද ප්‍රබුද්ධක පාඨක සම්මාන ප්‍රදානෝත්සව 3ක් (මධ්‍යම පළාත - 2, උතුරු මැද පළාත- 1) පවත්වා සම්මාන 615ක් ප්‍රදානය කිරීම.

## 5.17 අධ්‍යාපන සැලසුම්කරණය සහ කාර්යසාධනය ඇගයීම

### 5.17.1 අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා සැලසුම්කරණය

- අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් 2018-2022 මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්ම සහ 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- ජාතික පාසල් අනුමත කිරීම සඳහා වූ නිර්ණායක ඇතුළත් ප්‍රතිපත්තිය සහ ත්‍රෛභාෂික පාසල් පිහිටුවීම පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීම.
- ලෝක බැංකු ආධාර හා විදේශ ආධාර මත ක්‍රියාත්මක වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම හා අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් විදේශ ආයතන සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.
- ජාතික තක්සේරුකරණ වැඩසටහන යටතේ 8 ශ්‍රේණිය සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් පිළිබඳ වාර්තාව එළි දැක්වීම.

### 5.17.2 තිරසර සංවර්ධන අරමුණු හා සැමට අධ්‍යාපනය සැබැඳි වැඩසටහන්

- 13 වසරක සහතික කළ අඛණ්ඩ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම සඳහා නියමු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් තෝරා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමේ කටයුතු ඉටුකිරීම.
- සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු වෘත්තීය පුහුණුව සඳහා කම්කරු අමාත්‍යාංශය හා එක්ව අවශ්‍ය වෘත්තීය මාර්ගෝපදේශ පිළිබඳ තොරතුරු පද්ධතියක් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා මේ වසර තුළ දිස්ත්‍රික්ක 5ක් හා එක්ව කටයුතු කිරීම.
- තිරසර සංවර්ධන ඉලක්ක සහිත ජාතික වැඩසටහන් රාමුව සඳහා කෙටුම්පත් සකස් කිරීම.
- තිරසර සංවර්ධන ඉලක්ක 4 (2030 අධ්‍යාපන ඉලක්ක) පිළිබඳ දැනුම්වත් කිරීම.
- මානව අයිතිවාසිකම් ක්‍රියාකාරී සැලැස්මේ අධ්‍යාපන කෙටුම්පත සකස් කිරීම.
- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සුරකීමේ ප්‍රඥප්තියේ ක්‍රියාකාරකම් සම්බන්ධ නියාමන වැඩසටහන් කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අහිතකර බලපෑම් ඉවත් කිරීම සඳහා යුරෝපා සංගමය සමග එක්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 5.18 ප්‍රමිති පාදක පාසල් ඇගයීම්කරණ ක්‍රියාවලිය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| පාසල් ඇගයුම්කරුවන්ගේ වෘත්තීය සංවර්ධනය | පාසල් ඇගයුම්කරුවන් | වැඩසටහන් 6ක් |
| පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකයේ 50%ට අඩු පාසල්වල නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය | නියෝජ්‍ය විදුහල්පතිවරුන් 30ක් | එක් පුහුණු වැඩමුළුවක් |
| පාසල් ඇගයීම් පිළිබඳ පර්යේෂණ | අදාළ නිලධාරීන් | වැඩසටහන් 1ක් |

**ගුණාත්මක සංවර්ධනය**

- අපේ පාසල කොතරම් ගුණාත්මක ද යන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව පාසල් නියාමනය කිරීම සම්බන්ධව වැඩසටහන් 7ක් පැවැත්වීම හා මාර්ගෝපදේශ 4700ක් මුද්‍රණය කිරීම.
- පාසල් බාහිර ඇගයීම් සම්බන්ධව පසු පෝෂණ වැඩසටහන් අවශ්‍ය පාසල් වෙනුවෙන් වැඩසටහන් 3ක් පැවැත්වීම.
- අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සම්බන්ධ 2017 වාර්ෂික වාර්තාව සකස් කිරීම සඳහා වැඩමුළු 3ක් පවත්වා වාර්ෂික සමුළුව පැවැත්වීම හා වාර්ෂික වාර්තා 175ක් මුද්‍රණය කිරීම.
- පාසල් විශිෂ්ට ව්‍යවහාර හඳුනා ගැනීම සඳහා වැඩසටහන් 4ක් පැවැත්වීම.
- සම්පත්පුද්ගලයින් හට වැඩසටහන් 7ක් පවත්වා විදුහල්පති අත්පොත සකස් කිරීම.
- ගුරු වාර්තා පොත පිටපත් 10,000ක් මුද්‍රණය කිරීම.
- වැඩමුළු 3ක් පවත්වා ලබාගත් අදහස් මගින් ගුරු නිපුණතා රාමුව හා ගුරු ශිෂ්‍ය නිපුණතා රාමුව සකස් කිරීම.
- විද්‍යාපීය ඇගයීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමට වැඩසටහනක් පැවැත්වීම.
- කලාප කාර්යාල ඇගයීම හා නියාමනය සඳහා Digital උපාංග සැකසීමට වැඩසටහනක් පැවැත්වීම.
- වාර්ෂික ව සංවිධානය කරනු ලබන ගුරු ප්‍රතිභා ප්‍රභා සම්මාන ප්‍රදානෝත්සවය මගින් විශිෂ්ට සේවා කුසලතා වෙනුවෙන් විදුහල්පතිවරුන් 114ක් හා ගුරුවරුන් 282ක් සඳහා සම්මාන ප්‍රදානය කළ අතර ඒ අතර පරිවේනාධිපතිවරුන් හා පරිවේණාචාර්යවරුන් 18ක් ද විය.
- පාසල් සුපරීක්ෂණ වැඩසටහන සඳහා අදාළ මාර්ගෝපදේශ හා අත්පොත් සකස් කිරීම සඳහා වැඩමුළු 20ක් පැවැත්වීම හා පාසල් සුපරීක්ෂණ සේවාව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කිරීම.

## 5.19 අධ්‍යාපන පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| පාසල්වල පර්යේෂණ කටයුතු අභිප්‍රේරණය | නිලධාරීන් 33ක් | එක් වැඩමුළුවක් |
| පර්යේෂණ දිනය පාසල්වල ක්‍රියාත්මක කිරීම | කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂකවරු 315ක් ජාතික පාසල් ගුරුවරු 191ක් කලාප සම්බන්ධීකරණ හා ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන් 203ක් | වැඩසටහන් 3ක් |
| ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳ ව දැනුම්වත් කිරීම | ගුරුවරුන් 216ක් | වැඩසටහන් 4ක් |
| ප්‍රාථමික අධ්‍යාපනයේ ඉගෙනුම්ඵල ඇගයීම | ගුරු උපදේශකවරු 119ක් | එක් පුහුණු වැඩසටහනක් |
| පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරුවරු 80ක් - කොළඹ විශ්ව විද්‍යාලය දෙමළ මාධ්‍ය ගුරුවරු 50ක් - විවෘත විශ්ව විද්‍යාලය | පාඨමාලාව හැදෑරීමට මූල්‍ය පහසුකම් සැලසීම |

**අනෙකුත් සංවර්ධන වැඩසටහන්**

- රජයේ සියලුම පාසල්වල පර්යේෂණ දිනයක් පැවැත්වීම.
- ද්වි වාර්ෂික පර්යේෂණ ජනලය " Education perspective" පිටපත් 3,464ක් නිකුත් කිරීම.
- පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් සමග ප්‍රගති සමාලෝචන රැස්වීම් 3ක් පැවැත්වීම.
- තාක්ෂණික විෂය ධාරාව සම්බන්ධ පර්යේෂණ වාර්තාව පිළිබඳ කතිකාවත් 2ක් පැවැත්වූ අතර ඒ සඳහා විදුහල්පතිවරු 258ක් සහභාගී වූහ.
- වයඹ, දකුණ, මධ්‍යම,උතුර හා නැගෙනහිර පළාත් වෙත ක්‍රියාමූලික පර්යේෂණ ග්‍රන්ථ මුද්‍රණය සඳහා රු.මි.9.54ක ප්‍රතිපාදන බෙදා දීම.
- අන්තර් ජාතික පර්යේෂණ සමුළුව පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දී පැවැත්වීම.

## 5.20 දත්ත හා තොරතුරු කළමනාකරණය හා අධ්‍යාපන සැලසුම් නියාමනය

- රජයේ සියලුම පාසල් පිළිබඳ 2017 පාසල් සංගණනය, පිරිවෙන් සංගණනය, පුද්ගලික පාසල් සංගණනය, ජාත්‍යන්තර පාසල් සංගණනය, නොවිධිමත් අධ්‍යාපන ආයතන සංගණනය,විද්‍යාපීඨ හා ගුරු විද්‍යාල පිළිබඳ සංගණනයන් සිදු කිරීම.
- ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය සහ 13 වසරක අධ්‍යාපන වැඩසටහන පාසල් මට්ටමින් නියාමනය සඳහා දත්ත පද්ධතිය සකස් කිරීම හා නඩත්තු කිරීම.
- පළාත් අධ්‍යාපන නිලධාරීන් සමග පැවැත්වෙන අධ්‍යාපන සංවර්ධන කමිටු රැස්වීම් පවත්වා පළාත් මට්ටමින් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම නියාමනය.
- ජාතික අයවැය දෙපාර්තමේන්තුව, ජනාධිපති කාර්යාලය, ව්‍යාපෘති කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තුව වෙත අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු වැඩසටහන්වල ප්‍රගතිය මාසික කාර්තුමය හා වාර්ෂික වාර්තා මගින් ඉදිරිපත් කිරීම.



# 06.

## අධ්‍යාපන වෘත්තීය සේවාවන් බලගැන්වීම

## 6.1 ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම

**6.1.1. වගුව : ගුරු සේවය සඳහා 2017 වර්ෂයේ බඳවා ගැනීම**

| ගුරු වර්ගය | එකතුව |
|---|---|
| ජාතික පාසල් සඳහා උපාධිධාරීන් | 1,288 |
| ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් | 3,742 |
| වතු පාසල් ගුරු සහයක | 132 |
| **එකතුව** | **5,162** |

මූලාශ්‍රය : ගුරු ආයතන ශාඛාව

## 6.2 අධ්‍යාපන වෘත්තීය සේවාවන්ට බඳවා ගැනීම් හා උසස් කිරීම්

### 6.2.1 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියේ පැවති පුරප්පාඩු පිරවීම සඳහා විවෘත පදනම මත 195ක්, සීමිත පදනම මත 308ක් හා සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත 108ක් ලෙස වසර තුළ නිලධාරීන් බඳවා ගැනීම සිදු කර පුහුණු වීම් අවසානයේ ස්ථානගත කිරීම සිදු විය.

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් 160ක් ස්ථිර කිරීම, 190ක් II පන්තියට උසස් කිරීම හා 113 දෙනෙකු විශ්‍රාම ගැන්වීම සිදු කරන ලදී.

### 6.2.2 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය

- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පවතින පුරප්පාඩු 1190ක් පිරවීම සඳහා සීමිත හා විවෘත තරග විභාග පැවැත්වූ අතර ඉන් විභාග සමත් 684 දෙනෙකු අතරින් මූලික සුදුසුකම් සැපිරූ 431ක් දෙනෙකු බඳවා ගැනීම සඳහා අදාළ උපලේඛන රාජ්‍ය සේවා කොමිෂම වෙත යොමු කර ඇත.

- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ උසස් කිරීම යටතේ 2-II ශ්‍රේණියේ නිලධාරීන් 41 දෙනෙකු 2-I ශ්‍රේණියට හා 3 පන්තියේ නිලධාරීන් 11 දෙනෙකු 2-II ශ්‍රේණියට උසස් වීම් ප්‍රදානය කරන ලදී.

### 6.2.3 ශ්‍රී ලංකා විදුහල්පති සේවය

- 2015 වර්ෂයේ පැවති විදුහල්පති විභාගයේ ප්‍රතිඵල මත 43 දෙනෙකු 2017 වර්ෂයේ දී බඳවා ගැනීම සිදු කළ අතර 673 දෙනෙකුගේ සේවය ස්ථිර කිරීම සිදු විය.
- වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ විදුහල්පතිවරු 249 දෙනෙකු සඳහා ස්ථානමාරු ලබා දුන් අතර වර්ෂය තුළ විදුහල්පතිවරු 599 දෙනෙකු විශ්‍රාම ගැන්වීම සිදු කර ඇත.
- විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව අන්තර්ග්‍රහණය කිරීම් 313ක් ද සිදු කර ඇත.
- විදුහල්පති කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල 8966 දෙනෙකුගේ නිකුත් කිරීම හා 92 වෙනුවෙන් කාර්යක්ෂමතා කඩඉම් සහන ඉල්ලීම් ලබා දීම් සිදු කර ඇත.

## 6.3 ගුරු අධ්‍යාපනය සහ ගුරු සංවර්ධනය

### 6.3.1 පාසල් පාදක ගුරු සංවර්ධනය හා ගුරු පුහුණුව

- ගුරුවරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා අවශ්‍ය මොඩියුල 20 න් ඉතිරි ව තිබූ මෝඩියුල 05 ලියා අවසන් කිරීම.
- පසුගිය වසරේ මොඩියුල 8ට අමතරව මෙම වසරේ මොඩියුල 6ක් සඳහා පුහුණුකරුවන් පුහුණු කර අවසන් කරන ලදී.
- කාර්යක්ෂමතා කඩඉම සඳහා වන මොඩියුල, ගුරු මධ්‍යස්ථාන 106 හරහා ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වශයෙන් මෙම වසර සඳහා රුපියල් මි. 35.78 ක ප්‍රතිපාදන කලාප කාර්යාල වෙත ලබා දීම.
- පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන මඟින් සියලුම පාසල්වල අවශ්‍යතා පරිදි ගුරු පුහුණුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- ගුරු අධ්‍යාපන ක්‍රියාවලිය නවීන තාක්ෂණය ඇසුරින් වඩා ඵලදායී අයුරින් සිදු කිරීම සඳහා ගුරු මධ්‍යස්ථාන 108ක් සඳහා ලැප්ටොප් පරිගණකය බැගින් ලබා දීම.
- ගුරු මධ්‍යස්ථාන 106ක් පැවතිය ද, ඉන් ඇතැම් ඒවා පවතිනුයේ ඉතා කුඩා ඉඩකඩක නාමික වශයෙන් පමණක් බැවින් එවැනි මධ්‍යස්ථාන සඳහා භෞතික හා යටිතල පහසුකම් සහිත නව ගුරු මධ්‍යස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද අතර පළමු අදියර ලෙස ගුරු මධ්‍යස්ථාන 39ක ඉදිකිරීම් ආරම්භ කිරීම.
- පාසල් පාදක ගුරු සංවර්ධනය සඳහා " අප බලවන්ත වෙමු" වීඩියෝවේ ඩීවීඩී තැටි 480ක් සකස් කර ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන් , කලාප සම්බන්ධීකරණ නිලධාරී වෙත ලබා දීම.
- පාසල් පාදක ගුරු සංවර්ධනය වැඩසටහනේ ගුණාත්මකභාවය වැඩි කිරීමේ මෙවලම් කට්ටල, වැඩසටහන් 3ක් මඟින් කලාප සම්බන්ධීකරණ නිලධාරීන් හා ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන් වෙත හඳුන්වා දීම.
- දෑ අවුරුදු ගුරු පුහුණුව සඳහා නුපුහුණු ගුරුවරුන් 964 දෙනෙකු ගුරු විද්‍යාල සඳහා බඳවා ගැනීම.

### 6.3.2 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ

**ගුරු සිසුන් බඳවා ගැනීම හා පාඨමාලාවල ගුණාත්මක සංවර්ධනය**

- 2014 උසස් පෙළ ප්‍රතිඵල මත 4065 දෙනෙකු විද්‍යා පීඨ සඳහා බඳවා ගත් අතර 2015 වසරේ උසස් පෙළ ප්‍රතිඵල මත 4745ක් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන ලදී.
- ව්‍යවසායකත්ව හා කළමනාකරණ විෂයය සඳහා පමණක් පැවති මහරගම අධ්‍යාපන විද්‍යාපීඨයේ මෙම වසරේ සිට ප්‍රාථමික අධ්‍යාපනය, විශේෂ අධ්‍යාපනය හා තොරතුරු තාක්ෂණය පාඨමාලා ද ආරම්භ කිරීම.
- විද්‍යාපීඨ ශික්ෂණලාභීන් සඳහා ලබා දුන් රු.3,500ක මාසික දීමනාව රු.5,000 දක්වා වැඩිකිරීම.
- කිසිදු විදෙස් පුහුණුවක් නොලද විද්‍යාපීඨ නිලධාරීන් 70 දෙනෙකුට මැලේසියාවේ උටාරා විශ්ව විද්‍යාලයේ සති 2ක කෙටි විදෙස් පුහුණුවක් ලබා දීම.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පීඨාධිපතිවරුන්ට මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දී පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
- අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේද වැඩිදියුණු කිරීම පිළිබඳව පුහුණු වැඩසටහනක් අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා පස්දුන් රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දී පැවැත්වීම.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල සංගීත විෂයය ඉගැන්වීම කරන කථිකාචාර්යවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දී පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- විද්‍යා විෂයය ඉගැන්වීම් කරන කථිකාචාර්යවරුන් ගේ විෂයය සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ද පැවැත්වීම.

**භෞතික සංවර්ධනය**

- ජාතික තාක්ෂණ අධ්‍යාපන විද්‍යාපීඨය ඉදිකිරීම සඳහා කුලියාපිටිය නාරංගල්ල පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන අධිකාරියට අයත් අක්කර 15ක භූමි භාගය පවරා ගෙන ඉදිකිරීම් ආරම්භ කළ අතර සමස්ත ආයෝජනය රු.මිලියන 1911කි. මාස 18ක් තුළ ඉදිකිරීම් නිම කිරීමට අපේක්ෂිතය.
- අධ්‍යාපන විද්‍යාපීඨයකට ලැප්ටෝප් පරිගණක 2 බැගින් විද්‍යාපීඨ 19 සඳහා ලැප්ටොප් පරිගණක ලබාදීම හා මහරගම අධ්‍යාපන විද්‍යාපීඨයට පරිගණක 80කින් සමන්විත අංග සම්පූර්ණ පරිගණක විද්‍යාගාර 2ක් ලබා දීම.
- අධ්‍යාපන විද්‍යාපීඨවල පරිපාලන කටයුතු වඩාත් පහසු කිරීමේ අරමුණින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 19 හා දඹදෙණිය පීඨය සඳහා කුලී පදනම මත කැබ් රථය බැගින් ලබා දීම සිදු විය.
- විද්‍යාපීඨ සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම හා ගොඩනැගිලි අලුත්වැඩියාව, ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය

## 6.4 වෘත්තීය සේවාවන්හි මානව සම්පත් සංවර්ධනය

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| **ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය** | | |
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියේ නවක නිලධාරීන් දිශානතිමුඛ කිරීම | විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගත් නිලධාරීන් 195 ක් | දිශානතිමුඛ පුහුණුව ලෙස වර්ෂයක නේවාසික පුහුණුවක් ලබා දීම |
| | සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගත් නිලධාරීන් 308ක් | සති 12ක පුහුණුවක් ලබා දීම |
| | කුසලතා පදනමින් බඳවාගත් නිලධාරීන් 108 ක් | මාස දෙකක පුහුණුවක් ලබා දීම |
| සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ධාරිත් සංවර්ධනය | සේවයේ යෙදී සිටින නිලධාරීන් 225 | දින 5 බැගින් වූ වැඩසටහන් 5ක් |
| කළමනාකරණය හා ආකල්ප සංවර්ධනය | කලාප කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන් 25ක් | දින 3ක පුහුණු වැඩසටහනක් පැවැත්වීම |
| **ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය** | | |
| ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නවක නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | නිලධාරීන් 21ක් | දින 21ක පුහුණුවක් |
| ධාරිතා සංවර්ධනය | සිංහල මාධ්‍ය නිලධාරීන් 49 දෙනෙකු හා දෙමළ මාධ්‍ය නිලධාරීන් 29ක් | දින 15 බැගින් වූ 2ක් වැඩසටහන් |
| **ශ්‍රී ලංකා විදුහල්පති සේවය** | | |
| පාසල් නායකත්ව කළමනාකරණය සඳහා වූ ජාතික නිපුණතා රාමුව පිළිබඳ විදුහල්පතිවරුන් දැනුම්වත් කිරීම | පළාත් 4ක විදුහල්පතිවරුන් 340ක් | වැඩමුළු 4ක් |
| ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III පන්තියේ නවක නිලධාරීන් දිශානතිමුඛ කිරීම | නිලධාරීන් 43 | සති 6ක පුහුණුවක් |
| ස්වයං හා ආයතනික විනය හා නායකත්වය | ජාතික පාසල් විදුහල්පතිවරුන් 39ක් | දින 3ක පුහුණු වැඩසටහනක් |
| විදුහල්පති ධාරිතා වර්ධනය | ගාල්ල අධ්‍යාපන කලාපයේ විදුහල්පතිවරුන් 160ක් | දින 3ක පුහුණු වැඩසටහනක් |
| **ශ්‍රී ලංකා ගුරු සේවය** | | |
| ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම | පුහුණුකරුවන් 24 | දින 20ක් පුහුණුවක් |




ධාරිතා සංවර්ධන වැඩසටහන්

| විෂයය ක්ෂේත්‍රය | සහභාගීත්වය | වැඩසටහන් |
|---|---|---|
| **විවිධ ධාරිතා සංවර්ධන වැඩසටහන්** | | |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය හා වෘත්තීය සංවර්ධන වැඩසටහන් | මාණ්ඩලික නොවන නිලධාරීන් 280ක් | දින 3 බැගින් වූ වැඩසටහන 7ක් |
| | රියදුරන් 71ක් | දින 3 බැගින් වූ වැඩසටහන් 2ක් |
| | කාර්යාල කාර්ය සහායකයින් 140 ක් | දින 2 බැගින් වූ වැඩසටහන් 3ක් |
| | නිලධාරීන් 34 | වෘත්තීය සංවර්ධනය අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම |
| නියාමනය හා ඇගයීම පිළිබඳ නව්‍යකරණ එළඹුම පිළිබඳ අන්තර් ජාතික වැඩමුළුව | නිලධාරීන් 10ක් | සහභාගී කරවීම |
| කාර්යාල හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව | කලාප කාර්යාලවල පරිපාලන විෂයභාර නිලධාරීන් 39ක් | දින 3ක පුහුණුවක් |
| ක්‍රීඩා කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 1 නිලධාරියෙක් | ප්‍රතිපාදන ලබා දීම. |
| **විදේශ පුහුණු වැඩසටහන්** | | |
| විදේශ පුහුණුව—ඕස්ට්‍රේලියාව | පළාත් අධ්‍යාපන ලේකම්වරු හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරු 18ක් | දින 12ක් |
| නායකත්ව හා පෞරුෂ සංවර්ධනය සඳහා කෙටිකාලීන පුහුණුව—චීනය | නවක විදුහල්පතිවරු 46ක | දින 20ක |
| කෙටි කාලීන විදේශ පුහුණුව—මැලේසියාවේ උටාරා විශ්ව විද්‍යාලය | කිසිදු විදෙස් පුහුණුවක් නොලැබූ නිලධාරීන් 70ක් | සති 2ක් |
| පාසල් කළමනාකරණය පිළිබඳ කෙටි කාලීන පුහුණුව—මැලේසියව හා සිංගප්පූරුව | විදුහල්පතිවරු 60ක් | දින 14ක් |





ධාරිතා සංවර්ධන වැඩසටහන්



## 6.5 අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම්

**6.5.1 වගුව - 2017** වසර තුළ ඒකාබද්ධ සේවාවන්ට අනෙකුත් අනධ්‍යයන තනතුරු සඳහා බඳවා ගත් සංඛ්‍යා

| තනතුර/සේවය | බඳවාගත් සංඛ්‍යාව |
|---|---|
| රියදුරු | 28 |
| කාර්යාල සේවක සේවයට | 18 |
| අරක්කැමි | 144 |
| සනීපාරක්ෂක කම්කරු | 377 |
| මුරකරු | 131 |
| පාසල් කම්කරු/කම්කරු | 482 |
| තාක්ෂණ පීඨ සේවක | 314 |

## 6.6 මහජන ගැටලු, පැමිණිලි හා විමසීම්වලට විසඳුම් ලබා දීම

♦ 2017 වර්ෂයේ ජාතික මෙහෙයුම් මැදිරියට දුරකථනයෙන්, තැපැල්,ෆැක්ස් හා ඊ-මේල් මගින් ලැබුණු ගැටලු, පැමිණිලි, විමසීම් 12,787ක් අදාළ අංශ හා පළාත් වෙත යොමු කරන ලදි.

පළාත් වෙත යොමු කරන ලද - 899
විසඳන ලද පැමිණිලි - 56
ක්‍රියාත්මක වෙමින් පවතින - 843

♦ 2017-01-08 දින ආරම්භ කරන ලද "ජනපතිට කියන්න" මහජන දුක්ගැනවිලි යාන්ත්‍රණය වෙත ලැබෙන අධ්‍යාපනයට අදාළ ගැටලු ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරනු ලබන අතර 2017-12-31 දින වන විට පැමිණිලි, ගැටලු 2,536ක් ඉදිරිපත් වී ඇත.

අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කර ඇති - 1930
විසඳන ලද පැමිණිලි - 441
ක්‍රියාත්මක වෙමින් පවතින - 125
තොරතුරු ප්‍රමාණවත් නොවූ - 40

♦ විද්‍යුත් මාධ්‍ය මගින් පෙන්වන ලද ගැටලු 57ක් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් කළ ගැටලු 430ක් කෙරෙහි අවධානය යොමු කරන ලදි.

විසඳන ලද පැමිණිලි - 39
ක්‍රියාත්මක වෙමින් පවතින - 85
පළාත් වෙත යොමු කරන ලද - 274

♦ අධ්‍යාපන අමාත්‍යාංශයේ භෝජනාගාරයේ කටයුතු හා ආහාරවල පිරිසිදුභාවය පිළිබඳ පරීක්ෂා කර ඒ පිළිබඳ නිරීක්ෂණ වාර්තා ලබා දෙන අතර සතියකට වරක් නිරීක්ෂණ සටහන් කර ගනිමින් සෑම මාස 3කට වරක් නිරීක්ෂණ වාර්තා පිළියෙල කර අතිරේක ලේකම් (පාලන හා මුදල්) හා අධ්‍යාපන අධ්‍යක්ෂක (සෞඛ්‍ය හා පෝෂණ) වෙත යොමු කිරීම.



# 07.

## වියදම් සාරාංශය

## 7.1 වියදම් විශ්ලේෂණය - අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය

2015 සිට 2017 දක්වා වන වසර තුනක කාලසීමාව තුළ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්හි කාල උපනතිය පිළිබඳ සැලකීමේදී ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා එකිනෙකට වෙනස් ප්‍රවණතාවක් හඳුනාගත හැකිය. එනම් සමස්ත පුනරාවර්තන ඇස්තමේන්තුගත වියදමෙන් 95% ප්‍රමාණයක ඉහළ උපයෝජනයක් සත්‍ය ලෙස දැකගත හැකිවීමයි. කෙසේ වුවද 2015 වසරේ සමස්ත ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදමෙන් 90% ප්‍රමාණයක ඉහළ උපයෝජනයක් පැවතිය ද 2016 වසරේ සමස්ත ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදමෙන් උපයෝජනය කරන්නේ 48% ක් වන අතර 2017 වසරේදී එම ප්‍රතිශතය 52.35% දක්වා වන සුළු ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත.

**7.1. වගුව : ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම්හි ප්‍රවණතාව, 2015 - 2017**

රු. මිලියන වලින්

| ශීර්ෂය | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| සංශෝධිත ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම | 40,270.5 | 45,897.69 | 54985.03 |
| සත්‍ය පුනරාවර්තන වියදම | 38,896.36 | 45,396.30 | 49138.85 |
| සත්‍ය වියදම ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදමේ % ලෙස | **96.6 %** | **99%** | **89.36%** |
| සංශෝධිත ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම | 17,347.20 | 31178.64 | 52577.44 |
| සත්‍ය ප්‍රාග්ධන වියදම | 15,536.39 | 14937.95 | 27525.50 |
| සත්‍ය වියදම ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදමේ % ලෙස | **90%** | **48%** | **52.35%** |

මූලාශ්‍රය : ගිණුම් වාර්තා හා වාර්ෂික කාර්යසාධන වාර්තාවන්- අධ්‍යාපන අමාත්‍යාංශය

මෙලෙස අධ්‍යාපනය සඳහා කරන ප්‍රාග්ධන වෙන්කිරීම් අතුරින් ඌණ උපයෝජනයට බලපෑ සාධක කිහිපයකි. ඉන් පළමුවැන්න වන්නේ මෙම ප්‍රතිපාදන සඳහා අග්‍රිම නිදහස් කිරීමේදී ඇති වන අසංගතතාවයි. මීට අමතරව 2016 හා 2017 වසරවල අයවැය යටතේ ඉදිරිපත් කෙරුණු යෝජනා කිහිපයක් ම විවිධ හේතූන් නිසා අවසන් කිරීමට නොහැකිවීම තවත් හේතුවකි. මෙවැනි ඉහළ ප්‍රාග්ධන වෙන්කිරීම් සහිත පුළුල් වැඩසටහන් කඩිනම් ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක කරනවා වෙනුවට අදියරෙන් අදියර ක්‍රමානුකූල කිරීම හරහා සම්පත් පූර්ණ ලෙස උපයෝජනය කිරීමට හැකිවනවා මෙන්ම තිරසාර ලෙස එම ව්‍යාපෘති පැවතීමට ද එය හේතු වේ.

## 7.2 පුනරාවර්තන වියදම් සාරාංශය

ඉහත සමස්තයක් ලෙස අධ්‍යාපනය සඳහා කරන වියදම එක් එක් වියදම් ශීර්ෂයන් යටතේ සවිස්තරව විමසා බැලිය හැකිය. පුනරාවර්තන වියදම් අතුරින් වැඩිම වෙන්කිරීම වැටුප් හා වේතන, දීමනා හා සේවා සඳහා සිදුකර ඇත. එක් එක් වැය ශීර්ෂය යටතේ සිදුකරන ලද පුනරාවර්තන වියදම් අතුරින් පරිපාලන හා ආයතනක සේවා (සාමාන්‍ය අධ්‍යාපන) සහ ද්විතියික අධ්‍යාපනය යන ශීර්ෂය සඳහා සාපේක්ෂව ඉහළ ප්‍රතිපාදන වෙන්කිරීමක් හඳුනාගත හැකිය.

7.2. වගුව : **අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම් (රු.මිලියන)**

| ශීර්ෂය | වැඩසටහන | 2017 සංශෝධිත ඇස්තමේන්තුව | මාරුකිරීම්/ අතිරික්ත | ශුද්ධ ප්‍රතිපාදන | 2017.12.31 දිනට වියදම |
|---|---|---|---|---|---|
| 126 - 1- 1 | අමාත්‍ය කාර්යාලය | 26.00 | +7.62 | 33.62 | 31.03 |
| 126 - 1- 2 | **පරිපාලන හා ආයතනික සේවා** | 898.40 | +213.91 | 1,112.31 | 1088.75 |
| | පාසල් පෝෂණ වැඩසටහන | | +4631.80 | 4631.80 | 4434.02 |
| | පාසල් නිල ඇඳුම් | | +2,491.20 | 2,491.20 | 2,478.64 |
| | දුෂ්කර පාසල් සිසුන්ට සපත්තු | | +640.00 | 640.00 | 639.97 |
| | පෙළපොත් | | +4384.33 | 4384.33 | 4280.86 |
| | කිරි වීදුරුවක් ලබා දීම | | +310.00 | 310.00 | 266.65 |
| | 5 ශ්‍රේණිය ශිෂ්‍යාධාර | | +363.00 | 363.00 | 309.80 |
| | සුහග ශිෂ්‍යත්ව වැඩසටහන | | +30.00 | 30.00 | - |
| | පාසල් සිසු රක්ෂණාවරණය | | +2700.00 | 2700.00 | 2700.00 |
| | භික්ෂු සිසු ශිෂ්‍යාධාර | | +150.00 | 150.00 | - |
| | ජාතික අධ්‍යාපන ආයතනය | 430.00 | | 430.00 | 330.00 |
| | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | 144.00 | | 144.00 | 133.70 |
| 126 - 1- 11 | ආයතනික කාර්යයන් | 26.60 | +3.66 | 30.26 | 28.85 |
| 126 – 2-3 | ප්‍රාථමික අධ්‍යාපනය | 4375.60 | -166.63 | 4208.97 | 4204.71 |
| 126 – 2-4 | ද්විතීයික අධ්‍යාපනය | 19433.50 | +6,655.13 | 26,088.63 | 21,086.84 |
| 126 – 2-5 | විශේෂ අධ්‍යාපනය | 4977.75 | +460.52 | 5,438.27 | 5,349.61 |
| 126 – 2-6-1 | ගුරු විද්‍යාල සහ ගුරු මධ්‍යස්ථාන | 291.35 | 0.35 | 291.70 | 290.01 |
| 126 – 2-6-2 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | 1372.25 | +8.95 | 1,381.20 | 1369.71 |
| 126 – 2-8 | අධ්‍යාපනය සඳහා ප්‍රදාන හා ආධාර සංස්කෘතික ක්ෂේත්‍රයට අයත් ආයතන | 130.00 | -4.26 | 125.74 | 115.71 |
| | **මුළු එකතුව** | **32,105.46** | **22,879.21** | **54,985.03** | **49,138.86** |

**මූලාශ්‍රය : මුදල් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය**

# 7.3 ප්‍රාග්ධන වියදම් සාරාංශය

**7.3.1 වගුව : අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම් (රු.මිලියන)**

| වැඩසටහන | 2017 ඇස්තමේන්තුව | මාරු කිරීම් හා අතිරේක ප්‍රතිපාදන | සංශෝධිත ඇස්තමේන්තුව | 2017.12.31 දිනට වියදම |
|---|---|---|---|---|
| 126-1-1 අමාත්‍ය කාර්යාලය | 1.75 | +40.70 | 42.45 | 42.05 |
| **126-1-2 ආයතන හා පරිපාලන කටයුතු** | | | | |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා නඩත්තුව | 81.50 | +10.14 | 91.64 | 91.52 |
| ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම | 232.00 | -53.77 | 178.22 | 146.56 |
| ධාරිතා සංවර්ධනය | 4.00 | | 4.00 | 1.63 |
| ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | 50.00 | | 50.00 | 9.00 |
| ජාතික පුස්තකාල නවීකරණය | | +500.00 | 500.00 | 0.11 |
| ජාතික අධ්‍යාපන ආයතනය | 360.00 | | 360.00 | 197.67 |
| **126-1-11 රාජ්‍ය අමාත්‍ය කාර්යාලය** | | | | |
| ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම් හා නඩත්තුව | 1.50 | +2.93 | 4.43 | 4.08 |
| ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම් | 0.50 | +39.89 | 40.39 | 39.84 |
| **126-2-3 ප්‍රාථමික අධ්‍යාපනය** | | | | |
| ප්‍රාථමික පාසල් සංවර්ධනය | 130.00 | +80.00 | 210.00 | 179.94 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 5.00 | | 5.00 | 0.00 |
| ආරක්ෂක සේවා විද්‍යාල | 115.00 | +11.30 | 126.30 | 126.30 |
| **126-2-3 ද්විතීයික අධ්‍යාපනය** | | | | |
| ද්විතීයික පාසල් සංවර්ධනය | 1770.00 | +465.69 | 2235.69 | 2193.92 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 230.00 | | 230.00 | 180.15 |
| ක්‍රීඩා පාසල් සංවර්ධනය | 200.00 | | 200.00 | 49.15 |
| **126-2-5 විශේෂ අධ්‍යාපනය** | | | | |
| විශේෂ අධ්‍යාපනය | 155.00 | -50.00 | 105.00 | 60.98 |
| පිරිවෙන් අධ්‍යාපනය බලගැන්වීම | 80.00 | | 80.00 | 27.72 |
| ආබාධිත සිසුන්ගේ අධ්‍යාපනය බලගැන්වීම | 10.00 | | 10.00 | 5.56 |
| ජාතික හා පළාත් විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන | 100.00 | -34.27 | 65.73 | 55.08 |
| **126-2-6 ගුරු සංවර්ධන රාමුව** | | | | |
| ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන | 191.50 | +0.90 | 192.40 | 109.35 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | 1087.00 | +157.13 | 1244.13 | 855.73 |
| වැඩසටහන් සඳහා පහසුකම් සැපයීම (අයවැය යෝජනා - 2017) | 1000.00 | -238.03 | 761.97 | 714.17 |
| **126-2-7 සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධනය** | | | | |
| යුනෙස්කෝ ක්‍රියාකාරකම් | 15.00 | | 15.00 | 13.41 |
| TESP ව්‍යාපෘතිය (GOSL—WB) | 260.00 | +247.00 | 507.00 | 414.06 |
| යුනිසෙෆ් වැඩසටහන් (GOSL—UNICEF) | | +12.30 | 12.30 | 10.01 |
| සමාජ ඒකාබද්ධතාව සඳහා අධ්‍යාපනය (GOSL/GIZ) | | +25.87 | 25.87 | 20.94 |
| උතුරු පළාතේ පාසල් 27ක් ප්‍රතිසංස්කරණය | 60.00 | | 60.00 | 0.00 |
| පොළොන්නරුව බහුජාතික ත්‍රිභාෂා පාසල ගොඩනැංවීම | 198.00 | -100.88 | 97.12 | 0.00 |
| පුස්සැල්ලාව සරස්වතී ම.වි.දියුණු කිරීම (GOSL/India) | 89.00 | | 89.00 | 0.00 |
| ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | 250.00 | | 250.00 | 94.01 |
| UNIFPA පුහුණු වැඩසටහන | | +0.45 | 0.45 | 0.18 |
| FAO පුහුණු වැඩසටහන | | +9.50 | 9.50 | 2.99 |
| පළාත් හා කලාප තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන | 185.00 | -60.00 | 125.00 | 104.30 |
| අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන | 4880.00 | -1087.43 | 3792.57 | 2655.77 |
| පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණය | | +800.00 | 800.00 | 78.72 |
| **126-2 අයවැය යෝජනා 2017** | | | | |
| පාසල්වලට විදුලිය සැපයීම | 700.00 | +192.00 | 892.00 | 691.00 |
| විද්‍යා අධ්‍යාපනය දියුණු කිරීම සඳහා පහසුකම් සැපයීම | 200.00 | | 200.00 | 0.00 |
| දන්ත සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීම | 50.00 | | 50.00 | 43.45 |
| පාසල්වලට ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 2000.00 | +1808.00 | 3808.00 | 3419.52 |
| ප්‍රාථමික පාසල් 3577ක පහසුකම් සංවර්ධනය | 6500.00 | | 6500.00 | 2252.14 |
| ග්‍රාමීය පාසල්වලට ගුරු නිවාස සැපයීම | 1000.00 | -423.00 | 577.00 | 92.00 |
| ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය | 7170.00 | -161.00 | 7009.00 | 5402.00 |
| මෑතකාලීනව සංවර්ධනය නොවූ පාසල් 1360ක් සංවර්ධනය | 10130.00 | +123.00 | 10253.00 | 6007.13 |
| උපෙළ ගුරුවරුන් හා සිසුන් සඳහා ටැබ් පරිගණක ලබාදීම | | +5000.00 | 5000.00 | 0.24 |
| 13 වසරක අනිවාර්ය අධ්‍යාපන | | +5000.00 | 5000.00 | 781.50 |
| විශේෂ අධ්‍යාපන පහසුකම් සංවර්ධනය | | +150.00 | 150.00 | 20.02 |
| පිරිවෙන් ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් | | +50.00 | 50.00 | 39.44 |
| වතු අංශයේ පාසල් 25ක ද්විතියික අංශය සංවර්ධනය | | +250.00 | 250.00 | 57.74 |
| **126-2-8 සංස්කෘතික අංශය** | 33.50 | +283.77 | 317.27 | 233.45 |
| **එකතුව** | 39,525.25 | 13,052.19 | 52,577.44 | 27,525.50 |

මූලාශ්‍රය : මුදල් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

## 7.4 සමස්ත අධ්‍යාපන වියදම

මධ්‍යම රජය හා පළාත් සභාව විසින් අධ්‍යාපනය සඳහා සිදුකරන වියදම් සැලකීමේදී සමස්තයක් ලෙස අධ්‍යාපනය සඳහා කරන වියදම ක්‍රමානුකූලව ඉහළයාමක් හඳුනාගත හැකිය. එහිදී සමස්ත වියදමින් වැඩි ප්‍රතිශතය පුනරාවර්තන වියදම් සඳහා සිදුකර ඇති අතර සමස්ත වියදම් ප්‍රමාණයෙන් වැඩි කොටස පළාත් සභා විසින් දරා ඇත. පහත සටහනෙන් 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වසර 11 තුළ අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා සහ ආයතන විසින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දරන ලද වියදම දක්වා ඇත.

**7.3.1 ප්‍රස්තාරය : අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා හා වෙනත් අමාත්‍යාංශ විසින් දරන ලද සමස්ත අධ්‍යාපන වියදම් රු.බි. 2007 - 2017**




මූලාශ්‍රය - අයවැය ඇස්තමේන්තු 2007 - 2016 මුදල් කොමිසම

**7. 4. 1. වගුව : සමස්ත අධ්‍යාපන වියදම (ජාතික හා පළාත් මට්ටම අනුව) - 2017**

| | විස්තරය | වටිනාකම (රු. බි ) |
|---|---|---|
| **අධ්‍යාපන අමාත්‍යාංශය (ජාතික මට්ටම)** | ප්‍රාග්ධන වියදම. | 27.71 |
| | පුනරාවර්තන වියදම රු. බි. | 52.05 |
| | එකතුව රු. බි. | 79.76 |
| **පළාත් සභා මට්ටම** | ප්‍රාග්ධන වියදම රු. බි. | 9.21 |
| | පුනරාවර්තන වියදම රු. බි. | 124.14 |
| | එකතුව රු. බි. | 133.35 |
| **සමස්ත එකතුව** | | 213.11 |

මූලාශ්‍රය : මුදල් කොමිසම හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ගිණුම් වාර්තා

අධ්‍යාපනය සඳහා පළාත් වශයෙන් කරන වෙන්කිරීම සැලකීමේදී වැඩිම මූල්‍ය වෙන්කිරීම බස්නාහිර පළාත් සභාවෙන් ද දෙවනුව හා තෙවනුව මධ්‍යම පළාත් සභාවෙන් හා වයඹ පළාතෙන් ද සිදුකර ඇත. සමස්ත අධ්‍යාපන වියදමේ දක්නට ලැබෙන ප්‍රවණතාව පළාත් සභා අධ්‍යාපන වියදම් තුළ ද හඳුනාගත හැක. එනම් ප්‍රාග්ධන වියදම්වලට සාපේක්ෂව පළාත් සභාවල ද පුනරාවර්තන වියදම් සඳහා වැඩි කොටසක් වෙන්වීමයි.

**7. 4. 2. වගුව : අධ්‍යාපන වියදම (පළාත් මට්ටම අනුව) - 2017**

| පළාත | පුනරාවර්තන වියදම රු. මි. | ප්‍රාග්ධන වියදම් රු. මි. |
|---|---|---|
| බස්නාහිර | 22,008.83 | 2,200.39 |
| මධ්‍යම | 17,714.29 | 303.91 |
| දකුණ | 14,126.58 | 645.03 |
| උතුර | 9,670.87 | 1972.25 |
| වයඹ | 15,111.31 | 1,006.06 |
| උතුරු මැද | 9,882.11 | 789.08 |
| සබරගමුව | 12,725.95 | 899.11 |
| ඌව | 10,769.25 | 573.41 |
| නැගෙනහිර | 12,131.66 | 821.39 |
| **එකතුව** | **124,140.85** | **9,210.63** |

## 7. 5. අධ්‍යාපනය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය - 2017

**7. 5. 1.** වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කරන ලද ප්‍රසම්පාදන කාර්යයන්

| ප්‍රසම්පාදන කාර්යය | ඇස්තමේන්තු-ගත පිරිවැය (රු.මි) | පාසල් ගණන |
|---|---|---|
| 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන සඳහා සෞන්දර්ය, කෘෂිකර්ම හා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම | 91.5 | 43 |
| 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන සඳහා ශිෂ්‍යය හා ගුරු පුටු, මේස හා අනෙක් උපකරණ මිලදී ගැනීම | 54.2 | 43 |
| 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන සඳහා White Board, Interactive White Board, Multimedia මිලදී ගැනීම | 17.65 | 43 |
| 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන සඳහා පරිගණක හා ඒ සඳහා වන මේස, පුටු මිලදී ගැනීම | 188.5 | 43 |
| පරිගණක ජාලගතකිරීම හා ඒ සම්බන්ධ වෙනත් කටයුතු | 7.3 | 43 |
| 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන සඳහා LED TV Screen (55") මිලදී ගැනීම | 11.6 | 43 |
| වතු පාසල් සඳහා ලී බඩු හා අනෙක් උපකරණ මිලදී ගැනීම | 31.76 | ** |
| වතු පාසල් සඳහා Multi Media, Lap Top හා Printer මිලදී ගැනීම | 8 | 32 |
| වතු පාසල් සඳහා White Board මිලදී ගැනීම | 0.17 | 32 |
| විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා පරිගණක මිලදී ගැනීම | 43.5 | ** |
| විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා LED රූපවාහිනී, වීඩියෝ කැමරා හා Interactive Smart Board මිලදී ගැනීම | 26.21 | ** |
| විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා ඉගෙනුම් ආධාරක උපකරණ මිලදී ගැනීම | 49 | ** |
| පාසල් සිසුන් සඳහා වන රු. 200,000 සෞඛ්‍ය රක්ෂණාවරණය | 2700 | ** |
| පාසල් හා මාර්ගෝපදේශන ඒකක සඳහා පුස්තකාල පොත් මිලදීගැනීම | 141 | ** |
| පාසල් ආපනශාලා සඳහා පුටු හා මේස මිලදී ගැනීම | 16 | 55 |
| තාක්ෂණ ගොඩනැගිලි සඳහා කෘෂිකර්ම උපකරණ මිලදී ගැනීම | 194 | 200 |
| ප්‍රාථමික ඉගෙනුම් මධ්‍යස්ථාන, ගුරු මධ්‍යස්ථාන හා NCOE සඳහා පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම | 212.4 | ** |
| ප්‍රාථමික ඉගෙනුම් මධ්‍යස්ථාන, ගුරු විද්‍යාල හා NCOE සඳහා ඡායා පිටපත් යන්ත්‍ර හා Multimedia මිලදී ගැනීම | 102.9 | ** |
| ගුරු මධ්‍යස්ථාන හා ජාතික පාසල් සඳහා ඡායා පිටපත් යන්ත්‍ර, ඩුප්ලෝ යන්ත්‍ර, Multimedia හා වෙනත් විද්‍යුත් උපකරණ මිලදී ගැනීම | 49.4 | 140 |
| ප්‍රාථමික ඉගෙනුම් මධ්‍යස්ථාන, ගුරු මධ්‍යස්ථාන හා හා මාර්ගෝපදේශන ඒකක සඳහා පරිගණක පුටු හා මේස මිලදී ගැනීම | 13.6 | ** |
| ජාතික පාසල්, ගුරු මධ්‍යස්ථාන හා NCOE සඳහා Magi Board, White Board මිලදී ගැනීම | 217.38 | ** |
| තාක්ෂණ විද්‍යාගාරවල සූර්යය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම සම්බන්ධ මිලදී ගැනීම | 42.7 | 25 |
| ජෛව පද්ධති තාක්ෂණ විද්‍යාගාරයන්හි කෘෂිකාර්මික උපකරණ මිලදී ගැනීම | 2.87 | ** |
| තාක්ෂණ විද්‍යාගාර සඳහා අවශ්‍ය වන තාක්ෂණික උපකරණ කට්ටල මිලදී ගැනීම | 305 | 200 |
| පාසල් නිල ඇඳුම් සඳහා වවුචර්පත් මිලදී ගැනීම | 17 | ** |
| ප්‍රාථමික සම්පත් මධ්‍යස්ථාන සඳහා ගුරු පුටු හා පොත් රාක්ක ලබාදීම | 67.3 | ** |
| තාක්ෂණ පීඨයන් සඳහා අවශ්‍ය වන නාම පුවරු හා දැන්වීම් පුවරු මිලදී ගැනීම | 5.85 | 73 |
| පාසල් දසදහසේ වැඩසටහනේ විද්‍යාගාරවලට අවශ්‍ය ලී බඩු හා උපකරණ මිලදී ගැනීම | 84 | 8 |

| ප්‍රසම්පාදන කාර්යය | ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි) | පාසල් ගණන |
|---|---|---|
| ජාතික පාසල් ශ්‍රවණාගාර සඳහා අවශ්‍ය පුටු ලබාදීම | 42 | 5 |
| ජාතික පාසල්, ගුරු මධ්‍යස්ථාන,දශ්‍යාබාධිත සිසුන් සඳහා හා NCOE සඳහා යකඩ කබඩ් මිලදී ගැනීම | 35.5 | ** |
| ගුරු මධ්‍යස්ථාන හා ජාතික පාසල් සඳහා කාර්යාල මේස හා පුටු ලබාගැනීම | 18.1 | 20 |
| ගුරු මධ්‍යස්ථාන සඳහා දේශනශාලා පුටු මිලදී ගැනීම | 5.5 | ** |
| උපදේශන ඒකක සඳහා ඩෙස්, පුටු, ජල පෙරණ, තාක්ෂණ හා අනෙකුත් උපකරණ මිලදී ගැනීම | 32.3 | ** |
| Virtual Data Center (VDC) මිලදී ගැනීම් කටයුතු | 3.3 | ** |
| හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලය සඳහා අවශ්‍ය ඩෙස් පුටු මිලදී ගැනීම | 4.3 | 1 |
| තාක්ෂණ පීඨයන් හී ජෛව පද්ධති තාක්ෂණ විද්‍යාගාර ලී බඩු මිලදී ගැනීම | 30 | ** |
| සුහුරු පංති කාමර උපකරණ මිලදී ගැනීම | 9.2 | 5 |
| තාක්ෂණ පීඨයන් සඳහා අවශ්‍ය වන උද්‍යාන අලංකරණ උපකරණ | 6.1 | ** |
| ජාතික විද්‍යාපීඨ සඳහා Interactive Boards, Smart Short වැනි යාන්ත්‍රික උපකරණ මිලදීගැනීම | 12.7 | ** |
| පාසල්හි ප්‍රාථමික හා ද්විතියික අංශය සඳහා ලී බඩු උපකරණ ලබාදීම | 22.5 | ** |
| නොවිධිමත් අධ්‍යාපනය හදාරන්නන්ට මහන මැෂින් ලබාදීම | 3.8 | ** |
| නොවිධිමත් හා විශේෂ අධ්‍යාපනය සඳහා පැස්සුම් උපකරණ හා බ්‍රේල් යතුරු ලියන ලබාදීම | 3.8 | ** |
| ගංවතුරින් හානියට පත් පාසල් සඳහා ලී බඩු හා උපකරණ සැපයීම | 16.95 | ** |

** විවිධ භාණ්ඩ විවිධ ප්‍රමාණයන්ගෙන් පාසල්වලට සපයා ඇත.

### 7.5.2. 2017.12.31 දින වන විට ක්‍රියාත්මක වෙමින් පැවති ප්‍රසම්පාදන කාර්යයන්

| ප්‍රසම්පාදන කාර්යය | ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි) | 2017.12.31 වන විට ක්‍රියාත්මක තත්වය |
|---|---|---|
| උසස් පෙළ ගුරුවරුන් හා සිසුන් වෙනුවෙන් නොමිලේ ටැබ් පරිගණක ලබා දීම | 5,000.00 | කැබිනට් අනුමැතිය ලැබී නැත |
| එක් පාසලක් සඳහා උපරිම 50ක් වන ලෙස කුලී පදනම මත පරිගණක ලබා දීම | 5,000.00 | EOI Presentation අවසන් වී ඇත. මිළ ගණන් කැඳවීමට ඇත |
| පිරිවෙන් සිසුන් සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීම | 4.5 | ලංසු ලියවිලි සකස් කරමින් පවතී. |
| ගුරු හා විදුහල්පති නිවාස සඳහා ලී බඩු මිලදී ගැනීම | 26.15 | කැබිනට් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී |
| තාක්ෂණ පීඨයන්ට සමීක්ෂණ, ජෛව පද්ධති තාක්ෂණ හා ආහාර තාක්ෂණ උපකරණ මිලදී ගැනීම | 61.9 | ලංසු ලියවිලි සකස් කරමින් පවතී. |
| තාක්ෂණ පීඨයන් සඳහා අවශ්‍ය වන ඉංජිනේරු තාක්ෂණවේදය සඳහා උපකරණ මිලදී ගැනීම | 535 | පුවත්පත් දැන්වීම පළ කිරීමට නියමිතය. ලංසු ලියවිලි සකස් කරමින් පවතී. |
| තාක්ෂණ පීඨයන් සඳහා අවශ්‍ය වන පාංශු හා කාලගුණ උපකරණ මිලදී ගැනීම | 25 | ආදර්ශ භාණ්ඩ පරීක්ෂා කර අවසන් කර ඇත. |
| ගාල්ල මහින්ද විද්‍යාලය සඳහා සෞන්දර්යය උපකරණ සැපයීම | 0.09 | සුදුසුකම් ලැබූ ආයතන නොමැත |
| තිරසාර පාසල් ව්‍යාපෘතිය යටතේ උස හා බර මැනීම සඳහා උපකරණ ලබාදීම | 18.5 | ලංසු ප්‍රදානය කර ඇත. |

2017 වසර ආරම්භයේදී සැලසුම් කරන ලද සමහර ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වන මිලදී ගැනීම් විවිධ හේතු මත අත්හිටුවා ඇත. වඩාත් ගුණාත්මක හා ඵලදායී මිලදී ගැනීම් සිදුකිරීමේ අරමුණින් තාක්ෂණ ඇගයීම හා ක්‍රමවත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ දී ඇති වන විවධ සංරෝධක හේතුවෙන් සමහර මිලදී ගැනීම් 2017 වසර අවසන් වන විට නිම කිරීමට නොහැකි වූ බැවින් 2018 වසරේ එය අවසන් කිරීමට නියමිතය.



# 08.
## ශිෂ්‍ය සාධනය

## 8.1 ශිෂ්‍ය සාධනය පිළිබඳ සමස්ත නිරීක්ෂණ

සමස්තයක් ලෙස 2017 වසරේදී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ ප්‍රධාන විභාග වන පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, අ. පො. ස. සාමාන්‍ය පෙළ හා අ. පො. ස. උසස් පෙළ විභාග කඩයිම්වලදී පෙර වසරට සාපේක්ෂව ශිෂ්‍ය සාධනයේ යම් අඩු වැඩි වීමක් හඳුනාගත හැකිය. පසුගිය වසරේ විධිමත් විෂය මාලාව සම්බන්ධ ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ද ගනු ලැබිණි. මීට අමතරව විධිමත් හා විෂය සමගාමී විෂය මාලාව තුළ සිදුකෙරෙන කටයුතු තවදුරටත් දිරිගැන්වීමෙලා විවිධ ජාතික හා ජාත්‍යන්තර තරගවලට සහභාගී වීමේ අවස්ථාව සිසුන්ට හිමි විය. එයින් උපරිම ඵල නෙලාගනිමින් ලාංකේය සිසුන් රැසකට ජයග්‍රහණ අත්කර ගැනීමට හැකි විය.

## 8.2 පස් වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය


**8.2. වගුව : පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය**

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 322455 | 327648 | 333672 | 343757 | 350462 |
| ලකුණු 70ට වඩා ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 69.44 | 78.96 | 76.33 | 75.67 | 69.40 |
| මධ්‍යන්‍ය අගය | 110.71 | 113.89 | 109.50 | 107.86 | 106.43 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාවන්


2013 වසරේ සිට 2017 දක්වා වන කාලසීමාව තුළ පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගෙන් 70% ට ආසන්න ප්‍රමාණයක් ලකුණු 70ට වඩා ලබාගැනීමට සමත්ව ඇත. 2017 වසරේදී පෙර වසරට සාපේක්ෂව එම ප්‍රතිශතය 69.40% දක්වා පහළ බසින ලදි. මෙම ප්‍රතිඵල විශ්ලේෂණයේදී සලකා බලා ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රාප්ති මට්ටම ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව ක්‍රියාමාර්ග අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් සභා විසින් ඉටු කරනු ලැබේ. එමෙන් ම 2013 – 2017 කාල සීමාව තුළ ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දුන් සියලු සිසුන් පදනම් කරගනිමින් ගණනය කරන මධ්‍යයන්‍ය ලකුණ 100ත් 110ත් අතර අගය පරාසයක් තුළ විචලනය වන බව පැහැදිලි වේ.

**8.2. ප්‍රස්ථාරය : පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාවන්

## 8.3 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය




මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## 8.4 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

**8. 4. 1.වගුව : විවිධ විෂය ධාරාවන්ගේ විශ්ව විද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව - පළාත් අනුව (පාසල් අයදුම්කරුවන්) - 2017**


| පළාත | විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව % ලෙස | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ජීව විද්‍යාව | භෞතික විද්‍යාව | වාණිජ | කලා | ඉංජිනේරු තාක්ෂණය | ජෛව පද්ධති තා: | පොදු |
| බස්නාහිර | 63.59* | 56.43 | 71.68 | 75.55 | 60.90 | 60.21 | 39.54 |
| උතුර | 59.31 | 58.67* | 72.74 | 75.55 | 58.58 | 60.21 | 36.51 |
| දකුණ | 55.46 | 54.98 | 69.71 | 73.69 | 64.31* | 70.14* | 34.56 |
| මධ්‍යම | 53.54 | 53.56 | 71.33 | 73.39 | 53.95 | 57.35 | 50.69 |
| සබරගමුව | 52.13 | 51.30 | 74.97* | 77.19 | 55.56 | 68.04 | 40.08 |
| වයඹ | 53.14 | 53.17 | 73.53 | 74.38 | 56.99 | 60.40 | 45.38 |
| ඌව | 48.96 | 51.08 | 70.26 | 77.60* | 62.58 | 65.58 | 42.54 |
| නැගෙනහිර | 53.36 | 49.12 | 64.66 | 70.74 | 45.60 | 54.84 | 56.20* |
| උතුරු මැද | 43.04 | 43.81 | 67.06 | 75.13 | 54.86 | 55.51 | 32.39 |
| **සාමාන්‍ය අගය** | **55.71** | **54.05** | **71.17** | **73.82** | **57.74** | **61.79** | **40.83** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

* වැඩි ම ප්‍රතිශතක අගය ලබාගත් පළාත

ඉහත වගු සටහනේ දැක්වෙන පරිදි ජීව විද්‍යා හා භෞතික විද්‍යා විෂය ධාරාවේ සමත් ප්‍රතිශතය බස්නාහිර හා උතුරු පළාත තුළ ඉහළ අගයක් ගන්නා බව පැහැදිලි වේ. නමුත් අනෙක් උසස් පෙළ විෂය ධාරාවන් සම්බන්ධයෙන් අනෙක් පළාත් ද ඉහළ සමත් ප්‍රතිශතයක් දක්වන බව පැහැදිලි වේ. සමස්තයක් ලෙස සැලකීමේදී ඉහළ ම සමත් ප්‍රතිශතය කලා හා වාණිජ විෂය ධාරාවන්ගෙන් හඳුනාගත හැක. මෑත කාලීනව හඳුන්වාදුන් තාක්ෂණ විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය යන අංශවල ද සාපේක්ෂව ඉහළ සමත් ප්‍රතිශතයක් පැවතීම සාධනීය ප්‍රවණතාවයකි. ජීව විද්‍යා හා භෞතික විද්‍යා විෂය ධාරාවේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ප්‍රතිශතාත්මක අගය පළාත් කිහිපයක සාපේක්ෂව අඩු අගයක් ගන්නා බව පැහැදිලි වේ. කෙසේ වුව ද පොදු විෂය ධාරාව පිළිබඳ තවදුරටත් වැඩි අවධානයක් යොමුකළ යුතු බව මේ සංඛ්‍යා දත්ත හරහා පැහැදිලි වේ.


**8. 4. 1. ප්‍රස්ථාරය : විවිධ විෂය ධාරාවන් සඳහා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ඉහත ප්‍රස්තාර සටහනෙහි දැක්වෙන පරිදි, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් හා විවිධ විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක කරන වැඩසටහන් හා එහි උපක්‍රමික සැලසුම් හේතුවෙන් සෑම විෂය ධාරාවක ම ක්‍රමානුකූල වර්ධනයක් හඳුනාගත හැකිය. සමස්තයක් ලෙස සැලකීමේදී විශ්ව විද්‍යාල සුදුසුකම් ලත් ප්‍රතිශතය 2.66% ප්‍රමාණයකින් ඉහළගොස් ඇති අතර සමත් ප්‍රතිශතය වැඩි ප්‍රතිශතයකින් වර්ධනය කරගෙන තිබෙන අංශ අතර කලා අංශය (3.54%) හා ජීව විද්‍යා අංශය (2.45%) ප්‍රධාන වේ. කෙසේ වුව ද 2016 වර්ෂයට සාපේක්ෂව සමත් සංඛ්‍යාව අඩු ම ප්‍රමාණයකින් වර්ධනය කරගෙන තිබෙන්නේ භෞතික විද්‍යා (0.7%) අංශයයි.

**8. 4. 1. ප්‍රස්ථාරය : අ. පො. ස. උසස් පෙළ ප්‍රධාන විෂයන් කිහිපයක සමත් ශිෂ්‍ය ප්‍රතිශතය -2016 හා 2017**




| | භෞතික වි: | රසායන වි: | ජීව වි: | සං: ගණිතය | ආර්ථික වි: | භූගෝල වි: | දේශපාලන වි: | ව්‍යාපාර අ: | ගිණුම්කරණය | ජෛව පද්: තා: | සිංහල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2016 | 66.81 | 67.67 | 75.52 | 62.2 | 76.36 | 81.68 | 70.8 | 90.4 | 72.69 | 68.67 | 95.75 |
| 2017 | 67.36 | 69.17 | 75.79 | 66.06 | 76.69 | 86.68 | 76.23 | 87.38 | 76.29 | 70.33 | 94.81 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ. පො. ස. උසස් පෙළ විවිධ විෂය ධාරාවන්ගෙන් වැඩි ම සිසුන් පිරිසක් පෙනී සිටින විෂයයන් කිහිපයක ශිෂ්‍ය සාධනය පිළිබඳ ඉහත ප්‍රස්ථාර සටහන තුළින් පැහැදිලි වේ. මෙම තෝරාගත් විෂයයන් කිහිපය අතුරින් භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය හා ජෛව පද්ධති තාක්ෂණය යන විෂයයන්ගේ සමත් ප්‍රතිශතය 60ත් 70ත් අතර අගය පරාසයක පවතී. මීට අමතරව ජීව විද්‍යාව, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව හා ගිණුම්කරණය යන විෂයයන්ගේ සමත් ප්‍රතිශතය 70ත් 80ත් අතර අගය පරාසයක ද භූගෝල විද්‍යාව හා ව්‍යාපාර අධ්‍යයනය විෂයයන්ගේ සමත් ප්‍රතිශතය 80ත් 90ත් අතර අගය පරාසයක ද සිංහල භාෂාව සඳහා සියයට 90ට වැඩි සමත්වීමේ අගයක් ද පවතී. ඉහත පැහැදිලි කරන ලද අඩු විෂයය සාධනයක් පෙන්නුම් කරන විෂයයන්ගේ ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමට අවධානය යොමුකළහොත් මෙම විෂයයන් අයත් වන විෂය ධාරාවන්ගේ සමස්ත සමත් ප්‍රතිශතය ඉහළ නැංවීමේ හැකියාව තව දුරටත් පවතී.

## 8.5 සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම පිළිබඳ ජාතික තක්සේරුකරණ වැඩසටහන

පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් පසුව සිසුන්ගේ ශිෂ්‍ය සාධනය මිනුම් කරන අනෙක් විභාග කඩයිම වන්නේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයයි. මේ අතරතුර කාලය තුළ ශිෂ්‍ය සාධනය පිළිබඳ සිදුකරන අධ්‍යයනයන් අතුරින් කොළඹ විශ්ව විද්‍යාලයේ ජාතික අධ්‍යාපන හා පර්යේෂණ හා ඇගයීම් ආයතනය (NEREC) මඟින් මෙහෙය වන ජාතික තක්සේරුකරණ වැඩසටහන විශේෂිතය. පාසලේ 8 ශ්‍රේණියේ ශිෂ්‍ය ප්‍රාප්ති මට්ටම මැනෙන ජාතික වැඩසටහනේ 2016 වසරේදී නිකුත් කරන ලද වාර්තාවේ තොරතුරු පහත පරිදි දැක්විය හැක.


**8.5.1. වගුව : ලකුණු 50 හෝ 50ට වැඩි ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය - 2016**

| පළාත | ගණිතය | විද්‍යාව | ඉංග්‍රීසි |
|---|---|---|---|
| මධ්‍යම | 46.06 | 27.81 | 22.88 |
| නැගෙනහිර | 40.55 | 26.41 | 11.30 |
| උතුරු මැද | 52.38 | 33.43 | 19.94 |
| වයඹ | 51.57 | 38.55 | 21.86 |
| උතුර | 42.78 | 22.92 | 12.84 |
| සබරගමුව | 55.69 | 38.38 | 24.19 |
| දකුණ | 62.31 | 47.74 | 28.61 |
| ඌව | 41.73 | 28.48 | 15.48 |
| බස්නාහිර | 59.45 | 42.76 | 32.33 |
| සමස්ත දිවයිනටම | 50.49 | 34.23 | 21.27 |

මූලාශ්‍රය : ජාතික අධ්‍යාපන හා පර්යේෂණ හා ඇගයීම් ආයතනය (NEREC)

ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයන් ත්‍රිත්වය සඳහා 50 හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත් ශිෂ්‍යය සංඛ්‍යාව සැලකීමේදී 8 ශ්‍රේණියේ ළමුන්ගෙන් වැඩි ප්‍රමාණයක් ගණිතය සඳහා ඉහළ සාධනයක් දක්වන බව පැහැදිලි වේ. විද්‍යාව සඳහා ඉන් අනතුරුව ද අවසන් වශයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සිසුන් ලකුණු 50 හෝ ඊට වැඩි ප්‍රමාණයක් හිමිකරගෙන තිබේ. පළාත් ලෙස සැලකීමේදී දකුණු පළාත හා බස්නාහිර පළාත ඉහළ ශිෂ්‍ය සාධනයක් දක්වන බව ඉහත දත්ත හරහා පැහැදිලි වේ. එමෙන් ම මෙම විෂයන් ත්‍රිත්වය සඳහා ලකුණු 50 හෝ ඊට වැඩි යන නිර්ණායකයට අදාළව දුර්වල ශිෂ්‍ය සාධනයක් පෙන්නුම් කරන පළාත් වන්නේ උතුරු හා නැගෙනහිර පළාත් ය. මෙම ඇගයීමේ ප්‍රතිඵල ජාතික හා පළාත් මට්ටමේ විෂයභාර නිලධාරීන් වෙත ඉදිරිපත් කරනු ලබන අතර ඒ අනුව ශිෂ්‍ය සාධන මට්ටමේ වැඩි කිරීම සඳහා පියවර ගනු ලැබේ.

**8.5.1 ප්‍රස්ථාරය : ලකුණු 50 හෝ 50ට වැඩි ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය - පළාත් අනුව**




මූලාශ්‍රය : ජාතික අධ්‍යාපන හා පර්යේෂණ හා ඇගයීම් ආයතනය (NEREC)



# 09.

## ජාතික උරුම අංශයට අයත් ආයතන

## 9.1 ජාතික උරුම වැඩසටහන්

**"දැයේ උරුමය දරුවන්ටයි" වැඩසටහන**

ශ්‍රී ලාංකීය ස්පර්ශනීය හා අස්පර්ශනීය ජාතික උරුමයන් පිළිබඳ ව පාසල් සිසු සිසුවියන් දැනුමින් පෝෂණය කිරීම මූලික අරමුණ කර ගත් මෙම වැඩසටහන තුළින් පාසල් සිසු සිසුවියන්ට

- පුරාවිද්‍යා හා ඉතිහාසය යන ක්ෂේත්‍රයන් හි නිරන්තර සිදුවන නව සොයාගැනීම් හා ඒ ඇසුරින් කරන ප්‍රකාශ සම්බන්ධව
- දීප ව්‍යාප්තව පිහිටා ඇති කෞතුකාගාර හා ඒවායේ ප්‍රදර්ශිත ප්‍රදර්ශනාංග පිළිබඳ හා ඒවා නැරඹීම සම්බන්ධව
- දිවයින පුරා පිහිටි අප්‍රකට පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධව
- දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදු කරනු ලබන මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ජාතික උරුමයන් වෙත එල්ලවී ඇති බලපෑම් සම්බන්ධව
- පාරම්පරික හා සාම්ප්‍රදායික අස්පර්ශනීය උරුමයන් සම්බන්ධව දැනුම ලබා දීම සිදු කෙරේ.

- ♦ එක් දින වැඩසටහන් 5ක් මගින් විද්‍යාපීඨ 5ක ගුරු සිසු සිසුවියන්1,310ක් දැනුම්වත් කිරීම.
- ♦ එක් දින වැඩසටහන් 10ක් මගින් පාසල් සිසු සිසුවියන් 4,790ක් දැනුම්වත් කිරීම..
- ♦ වෙන්ව තිබූ රු.මි.4න් රු.මි.2.00ක් පාසල් නාට්‍ය උළෙල සඳහා ටවර් හෝල් රඟහල පදනම වෙත ලබා දෙන ලදී.

**ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සංගමය**

බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ දී ස්ථාපිත කරන ලද පුරා විද්‍යා හා ඉතිහාසය යන විෂයයන්ට අදාළව පර්යේෂණ හා විමර්ශන ආදී ශාස්ත්‍රීය කටයුතු සිදු කරනු ලබන සංවිධානය වන්නේ රාජකීය ආසියාතික සංගමයයි.

- 2017 වාර්ෂික අයවැය යටතේ හිමි රු.මි.1.00ක ප්‍රතිපාදන මගින් කාර්යාලීය කටයුතු පවත්වාගෙන යාම හා වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ පැවැත්වීම සිදු කරන ලදී.

**විදේශීය බැඳීම්**

ජාතික උරුමය විෂය ක්ෂේත්‍රයට අදාළ ව විදේශීය සම්බන්ධතා තර කර ගැනීම, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, වැඩමුළු හා ජාත්‍යන්තර සංවිධානයන්හි රැස්වීම් හා සාකච්ඡා සඳහා ශ්‍රී ලංකා නියෝජනය වෙනුවෙන් සහභාගී වීම මේ යටතේ සිදු වේ.

- ♦ ජාතික උරුමය විෂයට අදාළව පැවැත්වූ පහත සඳහන් අන්තර්ජාතික සාකච්ඡා වැඩමුළු නියෝජනය කර ඇත.
    - පෝලන්තයේ පැවති ලෝක උරුමය කමිටුවේ 41වැනි සැසිවාරය .
    - චීනයේ පැවතිලෝක සංස්කෘතික උරුමයන් සංරක්ෂණය පිළිබඳ මාසයක පුහුණු වැඩසටහන
    - රෝමයේ පැවති ලෝක උරුම 30වන සමුළුව

**ආදි වාසී ජන උරුම සංරක්ෂණ වැඩසටහන**

- ♦ දඹානේ දී 2017 ලෝක ආදිවාසී දිනය සැමරීම.

## 9.2 ටවර් හෝල් රගහල පදනම

- නාට්‍ය හා රංග කලාව සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය තුන් දින ප්‍රායෝගික වැඩමුළු 5ක් පැවැත්වීම.
- දෙවර්ෂ පූර්ණ කාලීන නාට්‍ය හා රංග කලා පාඨමාලාවේ සිසුන් 76 දෙනෙකු සඳහා අධ්‍යයන කටයුතු සිදු කිරීම.
- 2017/18 අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් 40ක් බඳවා ගැනීම.
- 2017/18 සමස්ත ලංකා දෙමළ මාධ්‍ය කෙටි නාට්‍ය තරගය පැවැත්වීම.
- අන්තර් පාඨශාලා නාට්‍ය තරගය - 2016 තිළිණ හා සම්මාන ප්‍රධානෝත්සවය පැවැත්වූ අතර අවසන් වටය සඳහා නාට්‍ය 32ක් සහභාගී විය.
- අන්තර් පාඨමාලා පාසල් නාට්‍ය තරඟය—2017 පළාත් වටයේ තරග පැවැත්වූ අතර ඒ සඳහා නාට්‍ය 200ක් ඉදිරිපත් විය.
- සිසුන් 189ක් සඳහා භාත්කණ්ඩේ විභාගය හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම.
- කලා ශිල්පීන් 70 දෙනෙකු සඳහා අවුරුදු තිළිණ ප්‍රධානය කිරීම.
- ජනපති සුභසාධක අරමුදල යටතේ ශිල්පීන් 135 දෙනෙකු සඳහා විශ්‍රාම වැටුප් ලබා දීම.
- පැරණි ටවර් හෝල් ශිල්පීන් 60 දෙනෙකු සඳහා විශ්‍රාම වැටුප් හා වෛද්‍යාධාර ලබා දීම.
- ජාත්‍යන්තර රංග කලායතනය සමග සංස්කෘතික වැඩසටහන් හුවමාරුව යටතේ වැඩසටහන් 3ක් පවත්වන ලද අතර ජර්මන් සංස්කෘතික මධ්‍යස්ථානය මගින් පවත්වනු ලැබූ නාට්‍ය කතිකාව ඇතුළු වැඩසටහන් සඳහා



## 9.3 ශ්‍රී ලංකා කලා මණ්ඩලය

- දෘශ්‍ය කලා සංකල්ප වැඩසටහන පැවැත්වීම.
- ලෝක නාට්‍ය දිනය 2017 මාර්තු මස සැමරීම.
- අදියර 4ක් යටතේ දෘශ්‍ය කලා නේවාසික වැඩමුළු 4ක් පැවැත්වූ අතර අවසන් අදියරේ දී චිත්‍ර ප්‍රදර්ශනයක් ද පැවැත්වීම.
- මාසික නාට්‍ය දර්ශන සඳහා නාට්‍ය තේරීම.
- අගෝස්තු මස අංගම් හරඹක්කාර පෙළහර පැවැත්වීම.
- නුවරඑළිය ගාමිණී ජාතික පාසලේ දී නාට්‍ය හා රංග කලා වැඩමුළුවක් පැවැත්වීම.
- ජාතික සංහිඳියාව හා භාෂාවේ කාර්යභාරය පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම.
- සාහිත්‍ය ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය සඳහා ග්‍රන්ථ සමීක්ෂණ කටයුතු කිරීම.
- කතුවරයෙකු සමග පොතක් කියවමු සංකල්ප වැඩසටහන් 4ක් සිදු කිරීම.
- ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය සම්මන්ත්‍රණය පැවැත්වීම.
- උතුරු මැද පළාත හා සබරගමු පළාතේ නර්තන වැඩමුළු පැවැත්වීම.
- රම්බඩගල්ල ම.ම.විද්‍යාලය,මහව විජයබා ජාතික පාසල, නාඋල ප්‍රා.ලේ. කාර්යාලය මහනුවර ප්‍රා.ලේ.කාර්යාලය කුරුණෑගල නගර සභාව හා පුත්තලම ප්‍රා.ලේ කාර්යාලයේ දී ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් පැවැත්වීම.
- 2017 දෙසැම්බර් මාසයේ මානව හිමිකම් කලා උළෙල පැවැත්වීම.

## 9.4 ජනකලා කේන්ද්‍රය

ශ්‍රී ලංකාවේ ජන සංස්කෘතියේ අංගයන් වන ජන කලා, ජනශ්‍රැති, සිරිත් විරිත් පිළිබඳ ගවේශනය ,සුරක්ෂිත කිරීම, පාරම්පරික ශිල්පය ආරක්ෂා කිරීම හා එම ශිල්ප ඥානය මතු පරපුර වෙත රැගෙන යමින් අනාගත ශිල්පීන් බිහි කිරීම සඳහා විවිධ පර්යේෂණ වැඩසටහන් වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදී.

- **රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ පෙරහැර පිළිබඳ අධ්‍යයනය**

  කිසිදු ප්‍රමාණාත්මක පර්යේෂණයක් සිදුකර නොමැති මෙම පෙරහැරේ චාරිත්‍ර වාරිත්‍ර පූජා විධීන් පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීම.

- **නේත්‍රා තැබීමේ මංගල්‍යය**

  අෂ්ඨ බහිරව පූජාව, කර්මපල පූජාව ,අඳුන් සැදීම,නේත්‍රා තැබීම ආදී ලෙස බුද්ධ ප්‍රතිමා හා දේව ප්‍රතිමා සඳහා නේත්‍රා තැබීමේ දී කරන ලද වත් පිළිවෙත් පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීම.

- **කොටහළු මංගල්‍යය**

  ශ්‍රී ලංකේය සිංහල සංස්කෘතියේ අංගයක් වන කොටහළු මංගල්‍යය ප්‍රාදේශීය ව සිදු කරන ආකාරය පිළිබඳ සංරකෂණාත්මක වැඩසටහනක් සිදු කිරීම.

- **විවාහ මංගල්‍යය**

  ලාංකීය විවාහ චාරිත්‍ර විවිධ ප්‍රදේශයන්හි උපසංස්කෘතික ලක්ෂණ සහිතව සිදු කෙරේ. එම ලක්ෂණ සංරක්ෂණය කිරිමේ අරමුණින් උඩරට ප්‍රදේශයේ සිරිත් විරිත්වලට අනුකූල ව ප්‍රදර්ශනාත්මක විවාහ මංගල්‍යයක් අපේ ගම පරිශ්‍රයේ දී සිදු කිරීම.

- **හෙළවත මුද්‍රා නාට්‍ය හා රස මංජරි සංගීත වැඩසටහන**

  ශ්‍රී ලංකාවේ දේව, රාක්ෂ, යක්ෂ, නාග යන සිව් හෙළයන්ගෙන් ඇරඹී ලක්දිව ආදී මානව සංස්කෘතියේ තෝරා ගත් කඩඉම් පර්යේෂණාත්මකව අධ්‍යයනය කරමින් සකස් කළ හෙළ වත මුද්‍රා නට්‍ය හා ලාංකීය ජන සංගීතය අතීතයේ සිට වර්තමානය දක්වා විකාශනය වී ඇති ආකාරය පිළිබඳ සකස් කළ අධ්‍යාපනික රසවින්දනාත්මක රසමංජරී වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12ක දී පැවැත්වීම.

## 9.5 ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය

වර්ෂය තුළ දේශීය චිත්‍රපට නාට්‍ය හා සියලු මහජන සංගීත හා ප්‍රාසාංගික සංදර්ශන විෂය පථයන් සුදුසු පරිදි අවශ්‍ය අවස්ථාවලදී පරීක්ෂා කර බලා අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ වර්ගීකරණයට ලක් කිරීම සහ සංශෝධනයන් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව

- වර්ෂය තුළ චිත්‍රපට 220ක් නාට්‍ය 249ක් හා සංදර්ශන 426ක් හා ඩීවීඩී 302ක් සඳහා බලපත්‍ර ලබා දීම සිදුවිය.
- නව කාර්යාල ගොඩනැගිල්ල හා සිනමා ශාලාවේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.
- බලපත්‍ර සඳහා චිත්‍රපට ශාලා ගාස්තු වශයෙන් වසරේ රාජ්‍ය ආදායම ලෙස රු.මි.9.46ක් උපයා ඇත.

# ඇමුණුම්

# ඇමුණුම 1

## ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

| දර්ශකය | 2007 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|
| **පාසල් (a)** | | | | | | | |
| රජයේ පාසල් සංඛ්‍යාව | 9,678[1] | 9,905 | 10,012 | 10,121 | 10,144 | 10,162 | 10,194 |
| පාසල් වර්ගය අනුව (b) | | | | | | | |
| 1ඒබී පාසල් | 681 | 753 | 868 | 959 | 1,004 | 1,016 | 1,029 |
| 1සී පාසල් | 1,883 | 2,013 | 1,910 | 1,852 | 1,801 | 1.805 | 1,818 |
| 2 වර්ගයේ පාසල් | 4,204 | 3,869 | 3,730 | 3,603 | 3,462 | 3.408 | 3,288 |
| 3 වර්ගයේ පාසල් | 2,910 | 3,270 | 3,504 | 3,707 | 3,877 | 3,933 | 4,059 |
| පන්ති පරාසය අනුව | | | | | | | |
| ප්‍රාථමික පන්ති පමණක් | 2,450 | 2,991 | 3,299 | 3,558 | 3,704 | 3,780 | 3,881 |
| 1 ශ්‍රේණියේ සිට 8 ශ්‍රේණිය දක්වා | 472 | 271 | 205 | 150 | 173 | 153 | 177 |
| 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා | 4,168 | 3,853 | 3,706 | 3,587 | 3,442 | 3,391 | 3,269 |
| 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා | 2,270 | 2,330 | 2,240 | 2,187 | 2,165 | 1,917 | 1.866 |
| 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා | 28 | 24 | 24 | 21 | 20 | 17 | 20 |
| 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා | 290 | 436 | 538 | 618 | 640 | 904 | 981 |
| පරිපාලන අධිකාරිය අනුව | | | | | | | |
| ජාතික පාසල් | 328 | 342 | 350 | 351 | 352 | 353 | 353 |
| පළාත් පාසල් | 9,350 | 9,563 | 9,662 | 9,770 | 9,792 | 9,809 | 9,841 |
| ඉගැන්වීමේ මාධ්‍ය අනුව | | | | | | | |
| සිංහල පමණක් | 6,414 | 6,368 | 6,355 | 6,388 | 6,389 | 6.338 | 6,332 |
| දෙමළ පමණක් | 2,780 | 2,914 | 2,949 | 2,982 | 3,018 | 2,989 | 3,009 |
| සිංහල හා දෙමළ | 37 | 39 | 60 | 53 | 39 | 66 | 75 |
| සිංහල හා ඉංග්‍රීසි | 309 | 403 | 446 | 495 | 504 | 554 | 558 |
| දෙමළ හා ඉංග්‍රීසි | 109 | 152 | 164 | 166 | 160 | 168 | 173 |
| සිංහල,දෙමළ හා ඉංග්‍රීසි | 29 | 29 | 38 | 37 | 34 | 47 | 47 |
| පිහිටීම අනුව (c) | | | | | | | |
| නාගරික | N/A | 1,071 | 1,078 | 1,116 | 1,140 | 1,095 | 1,089 |
| ග්‍රාමීය | N/A | 8,834 | 8,934 | 9,005 | 9,004 | 9,067 | 9,105 |
| ශිෂ්‍ය සංඛ්‍යාව අනුව | | | | | | | |
| 1 - 50 | 1,533 | 1,652 | 1,614 | 1,572 | 1,515 | 1,455 | 1,486 |
| 51 - 500 | 5,818 | 5,990 | 6,104 | 6,247 | 6,291 | 6,377 | 6,365 |
| 501 - 2500 | 2,160 | 2,069 | 2,094 | 2,103 | 2,140 | 2,138 | 2,137 |
| 2501 - 5000 | 162 | 183 | 187 | 185 | 184 | 175 | 192 |
| 5000ට වැඩි | 5 | 11 | 13 | 14 | 14 | 17 | 14 |
| පෞද්ගලික පාසල් සංඛ්‍යාව (d) | 70 | 73 | 78 | 78 | 78 | 80 | 80 |
| විශේෂ පාසල් සංඛ්‍යාව (e) | 23 | 25 | 25 | 25 | 25 | 25 | 26 |
| පිරිවෙන් සංඛ්‍යාව | 658 | 734 | 734 | 747 | 749 | 754 | 753 |
| **ගුරුවරුන් (a)** | | | | | | | |
| රජයේ පාසල්වල ගුරුවරුන් සංඛ්‍යාව | 208,277[1] | 223,333 | 226,983 | 232,993 | 236,988 | 235,999 | 241,018 |
| ස්ත්‍රී පුරුෂ භාවය අනුව | | | | | | | |
| ස්ත්‍රී | | 160,544 | 163,860 | 168,642 | 172,536 | 172,000 | 176,530 |
| පුරුෂ | | 62,789 | 63,123 | 64,351 | 64,462 | 63,999 | 64,488 |
| සුදුසුකම් අනුව | | | | | | | |
| උපාධිධාරී | 72,126 | 86,751 | 90,515 | 96,200 | 99,004 | 101,632 | 106,742 |
| වෘත්තීයමය සුදුසුකම් සහිත (f) | | 51,814 | 56,593 | 70,123 | 71,448 | 70,629 | 75,429 |
| වෘත්තීයමය සුදුසුකම් රහිත | | 34,937 | 33,922 | 26,077 | 27,556 | 31,003 | 31,313 |
| පුහුණු ගුරුවරු (g) | 127,499 | 128,152 | 129,686 | 131,622 | 132,952 | 129,937 | 129,616 |
| නුපුහුණු / අභ්‍යාසලාභී / වෙනත් | 8,652 | 8,430 | 6,782 | 5,171 | 5,042 | 4,430 | 4,660 |

| දර්ශකය | 2007 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|
| වෘත්තීයමය සුදුසුකම් සහිත ගුරුවරු ප්‍රතිශතය (h) | | 81 | 82 | 86 | 86 | 85 | 85 |
| ගුරු ශිෂ්‍ය අනුපාතය | 19 | 18 | 18 | 18 | 17 | 18 | 17 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව | 17 | 18 | 18 | 18 | 19 | 19 | 19 |
| ගුරු විද්‍යාල සංඛ්‍යාව | 9 | 9 | 9 | 9 | 9 | 8 | 8 |
| ගුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව (i) | 101 | 104 | 105 | 105 | 105 | 109* | 109* |
| **ශිෂ්‍යයින් (a)** | | | | | | | |
| රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 3,942,327 | 4,004,086 | 4,037,157 | 4,078,037 | 4,129,534 | 4,143,330 | 4,165,955 |
| ස්ත්‍රී පුරුෂ භාවය අනුව | | | | | | | |
| ස්ත්‍රී | 1,983,874 | 2,018,803 | 2,035,317 | 2,057,471 | 2,084,165 | 2,091142 | 2,106,159 |
| පුරුෂ | 1,958,453 | 1,985,283 | 2,001,840 | 2,020,566 | 2,045,369 | 2052188 | 2,059,796 |
| ප්‍රධාන ඉගෙනුම් මාධ්‍ය අනුව | | | | | | | |
| සිංහල | 2,871,737 | 2,920,720 | 3,006,262 | 2,982,715 | 3,022,072 | 3.034305 | 3,055,933 |
| දෙමළ | 1,021,299 | 1,020,008 | 1,030,895 | 1,025,068 | 1,031,295 | 1.028032 | 1,025,302 |
| ද්විභාෂා (w) | 49,291 | 63,358 | 67,061 | 71,015 | 76,167 | 80.993 | 84,720 |
| ඉගෙනුම් චක්‍රය අනුව | | | | | | | |
| ප්‍රාථමික ( 1-5 ශ්‍රේණි) | 1,616,555 | 1,698,510 | 1,718,675 | 1,732,446 | 1,725,657 | 1.717092 | 1,700,666 |
| කනිෂ්ඨ ද්විතීයික ( 6-9 ශ්‍රේණි) | 1,285,841 | 1,245,609 | 1,272,645 | 1,294,756 | 13,08,485 | 1.314.381 | 1,331,069 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික ( 10-11ශ්‍රේණි) | 391,661 | 591,087 | 567,396 | 570,383 | 594,494 | 619.105 | 621,520 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික ( 12-13ශ්‍රේණි) | 54,953 | 468,880 | 478,441 | 480,452 | 494,597 | 492.752 | 512,700 |
| පිරිවෙන්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 30,606 | 64,608 | 66,116 | 62,870 | 64,606 | 66,003 | 62,872 |
| පැවිදි | 24,347 | 35,019 | 35,595 | 34,003 | 34,652 | 35025 | 33,441 |
| ගිහි | 112,973 | 29,589 | 30,521 | 28,867 | 29,954 | 30978 | 29,431 |
| පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව (විශේෂ පාසල් ද ඇතුළුව) | | 125,669 | 127,986 | 131,427 | 133,749 | 136407 | 136,300 |
| **ප්‍රවේශය සහ සහභාගිත්වය (j)** | | | | | | | |
| රජයේ පාසල්වල 1 ශ්‍රේණිය සඳහා ඇතුළත් වන සිසුන් සංඛ්‍යාව | 334,641 | 339,142 | 350,294 | 349,182 | 334,877 | 325,369 | 327,925 |
| ප්‍රාථමික අධ්‍යාපනයට (1ශ්‍රේණියට) ශුද්ධ ප්‍රවේශ අනුපාතය (k) | 95 | 98.3 | 99.4 | 99.5 | 99.4 | 99.4 | 98.5 |
| ස්ත්‍රී | 94 | 98.2 | 99.4 | 99.6 | 99.3 | 99.3 | 97.4 |
| පුරුෂ | 95 | 98.4 | 99.4 | 99.4 | 99.4 | 99.4 | 99.5 |
| ප්‍රාථමික චක්‍රය තුළ (1-5ශ්‍රේණි) ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (l) | 96 | 99.9 | 98.4 | 98.5 | 97.5 | | 93.9 |
| ස්ත්‍රී | 95 | 99.6 | 98.4 | 98.5 | 97.5 | 95.27 | 93.31 |
| පුරුෂ | 96 | 100.0 | 98.4 | 98.6 | 97.5 | 96.54 | 94.49 |
| කනිෂ්ඨ ද්විතීයික චක්‍රය තුළ (1-9 ශ්‍රේණි ) තුළ ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (m) | | 98.4 | 98.7 | 99.0 | 98.3 | | 96.28 |
| ස්ත්‍රී | | 99.6 | 98.3 | 98.7 | 98.4 | 96.31 | 95.21 |
| පුරුෂ | | 98.2 | 99.1 | 99.8 | 98.3 | 98.38 | 97.33 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික චක්‍රය තුළ (1-11 ශ්‍රේණි ) ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (n) | | 98.6 | 96.2 | 96.3 | 96.2 | | 96.24 |
| ස්ත්‍රී | | 98.2 | 96.0 | 96.5 | 96.3 | 95.33 | 95.58 |
| පුරුෂ | | 99.0 | 96.3 | 96.8 | 96.2 | 96.49 | 96.89 |
| 9 ශ්‍රේණිය දක්වා රැඳී සිටීමේ අනුපාතය(o) | | 92.1 | 91.9 | 92.5 | 93.3 | 95.1 | 95.36 |
| ස්ත්‍රී | | 94.1 | 93.9 | 94.7 | 95.06 | | 96.98 |
| පුරුෂ | | 90.1 | 90.0 | 90.3 | 91.48 | | 93.79 |
| 11 ශ්‍රේණිය දක්වා රැඳී සිටීමේ අනුපාතය(o) | | N/A | N/A | 85.1 | 85.42 | 87.5 | 88.75 |
| ස්ත්‍රී | | N/A | N/A | 88.3 | 88.52 | | 91.03 |
| පුරුෂ | | N/A | N/A | 82.0 | 82.42 | | 86.54 |

| දර්ශක | 2007 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|
| **ශිෂ්‍ය සාධනය ( p)** | | | | | | | |
| **5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දී ශිෂ්‍ය සාධනය** | | | | | | | |
| 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | | 310,329 | 322,455 | 327,648 | 333,672 | 343,757 | 350,462 |
| ලකුණු 200න් 70ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | | 64.3 | 78.96 | 78.96 | 76.33 | 75.67 | 69.40 |
| **අ.පො.ස. ( සා.පෙළ ) විභාගයේ ශිෂ්‍ය සාධනය** | | | | | | | |
| අ.පො.ස. (සා.පෙළ ) විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව (පළමු වරට පෙනී සිටින) | | 268,995 | 264,772 | 257,322 | 273,410 | 286,251 | 296,812 |
| අ.පො.ස. (උ.පෙළ ) සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය | | 64.7 | 66.67 | 69.02 | 69.33 | 69.94 | 73.05 |
| සමත් ප්‍රතිශතය | | | | | | | |
| ගණිතය | | 55.3 | 57.23 | 56.70 | 55.18 | 62.81 | 67.24 |
| විද්‍යාව | | 68.2 | 67.53 | 60.58 | 68.02 | 66.33 | 73.46 |
| ඉංග්‍රීසි | | 47.7 | 47.86 | 45.08 | 45.40 | 47.9 | 51.12 |
| **අ.පො.ස. (උ.පෙළ ) විභාගයේ ශිෂ්‍ය සාධනය** | | | | | | | |
| අ.පො.ස. (උ.පෙළ ) විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව (පාසල් අයදුම්කරුවන්) | | 194,448 | 209,906 | 207,304 | 210,340 | 211,865 | 206,630 |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | | | |
| ජීව විද්‍යා විෂය ධාරාව | | 53.8 (v) | 49.8 (v) | 50.30 | 53.3 | 53.26 | 55.71 |
| භෞතීය විද්‍යා විෂය ධාරාව | | 44.7 | 47.1 | 46.60 | 48.6 | 53.35 | 54.05 |
| වාණිජ විෂය ධාරාව | | 72.3 | 57.6 | 64.03 | 67.9 | 69.64 | 71.17 |
| කලා විෂය ධාරාව | | 67.7 | 66.0 | 68.90 | 65.9 | 70.28 | 73.82 |
| ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව | | X | X | X | 50.09 | 55.58 | 57.74 |
| ජෛව පද්ධති තාක්ෂණයවේදය විෂය ධාරාව | | X | X | X | 60.66 | 60.16 | 61.79 |
| විකල්ප විෂය ධාරාවන් | | 55.33 | 48.9 | 47.42 | 39.0 | 39.36 | 40.83 |
| **මූල්‍ය (s)** | | | | | | | |
| අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දරන ලද මුළු වියදම (රු. මි. ) | 26,967 | 33,618 | 38,336 | 52,381 | 54,432 | 60,334 | 79,768 |
| පුනරාවර්තන (රු. මි. ) | 20,309 | 28,977 | 30,693 | 36,592 | 38,896 | 45,396 | 52,057 |
| ප්‍රාග්ධන (රු. මි. ) | 6,658 | 4,641 | 7,643 | 15,789 | 15,536 | 14,938 | 27,711 |
| අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සභා විසින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දරන ලද මුළු වියදම (රු. මි. ) | 69,962 | 90,422 | 110,737 | 117,000 | 151,130 | N/A | 213,119 |
| පුනරාවර්තන (රු. මි. ) | 62,099 | 82,872 | 99,297 | 97,000 | 127,000 | N/A | 36,922 |
| ප්‍රාග්ධන (රු. මි. ) | 7,863 | 7,550 | 11,440 | 20,000 | 24,130 | N/A | 176,197 |
| ඒක පුද්ගල ශිෂ්‍ය වියදම- සාමාන්‍ය අධ්‍යාපනය සඳහා (රු.) (X) | 17,745 | 22,581 | 27,427 | 35,577 | 36,621 | 45,880 | 51,157 |
| පාසල් පෙළපොත් ලබා දීම සඳහා වියදම (රු. මි.) | 2,250 | 2,055 | 2,700 | 2,703 | 3,000 | 5,414 | 4,280 |
| පාසල් නිල ඇඳුම් ලබා දීම සඳහා වියදම (රු. මි.) | 1,067 | 2,218 | 1,826 | 3,574 | 2,600 | 2,156 | 2,706 |
| පාසල් පෝෂණ වැඩසටහන (රු. මි.) | 1,308 | 2,790 | 3,000 | 3,725 | 4,082 | 3,915 | 4,434 |
| 5 ශ්‍රේණිය ශිෂ්‍යාධාර (රු. මි.) | 201 | 230 | 280 | 300 | 325 | 323 | 309 |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල් සිසුන් සඳහා සපත්තු ලබා දීම | X | X | X | 298 | 600 | 479 | 411 |
| කිරි වීදුරුවක් ලබා දීම | X | 205 | 230 | 197 | 127 | 212 | 266 |
| **යටිතල පහසුකම් (q)** | | | | | | | |
| අ.පො.ස. (උ.පෙළ ) විද්‍යාගාර සහිත පාසල් සංඛ්‍යාව | 681 | 748 | 868 | 959 | 1004 | 1016 | 1127 |
| තොරතුරු තාක්ෂණ විද්‍යාගාර සහිත 1ඒබී සහ 1සී පාසල් ප්‍රතිශතය | N/A | 95.9 | 95.9 | 73 | 73 | 75 | 72 |
| තොරතුරු තාක්ෂණ විද්‍යාගාර සහිත 2 වර්ගයේ සහ 3 වර්ගයේ පාසල් ප්‍රතිශතය | N/A | 43.0 | 43.0 | 20 | 21 | 21 | 19 |
| පානීය ජල පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය | N/A | 85 | 86.2 | 85 | 87 | 88 | 84 |
| ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය (r) | N/A | 79 | 75 | 98 | 99 | 99 | 99 |
| අන්තර්ජාල පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය | | | | | | | 20.1 |
| විදුලිබල පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය | | | | | | | 96.5 |

| දර්ශකය | 2007 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|
| පුස්තකාල/තාවකාලික පුස්තකාල/කියවීම් ශාලා සහිත ප්‍රාථමික පාසල් ප්‍රතිශතය ( 3වර්ගයේ පාසල්) | | | | | | | 43.01 |
| පුස්තකාල/තාවකාලික පුස්තකාල සහිත ප්‍රාථමික පාසල් ප්‍රතිශතය ( 1AB, 1C හා 2 වර්ගයේ පාසල්) | | | | | | | 79.0 |
| පුස්තකාල/තාවකාලික පුස්තකාල සහිත පාසල් ප්‍රතිශතය (සියලුම පාසල් ඇතුලත් වේ) | | | | | | | 59.3 |
| 6-11 ශ්‍රේණි සඳහා විද්‍යාගාර සහිත පාසල් ප්‍රතිශතය (y) | | | | | | | 74.9 |

(a) වාර්ෂික පාසල් සංගණන දත්ත ඇසුරිනි.

(b) 1AB : 1 සිට 13 හෝ 6 සිට 13 ශ්‍රේණි සහිත අ.පො.ස. (උ.පෙ) විද්‍යා, වාණිජ, කලා විෂය ධාරා තුන ම සහිත පාසල් (තෝරා ගත් පාසල්වල තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වේ.)

1C : 1 සිට 13 හෝ 6 සිට 13 ශ්‍රේණි සහිත අ.පො.ස. (උ.පෙ) වාණිජ හෝ කලා විෂය ධාරා දෙක ම හෝ එකක් හෝ සහිත පාසල් (තෝරා ගත් පාසල්වල තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වේ.)

2 වර්ගය : 1 සිට 11 හෝ 6 සිට 11 ශ්‍රේණි සහිත අ.පො.ස. (සා.පෙ) දක්වා වූ පාසල්

3 වර්ගය : 1 සිට 5 හෝ 8 ශ්‍රේණිය දක්වා ඇති ප්‍රාථමික හෝ කනිෂ්ඨ පාසල්

(c) නාගරික - මහ නගර සභා හෝ නගර සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

ග්‍රාමීය - ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

(d) මුදල් අය කරනු ලබන හෝ අය කරනු නොලබන ජාතික විෂය මාලාව උගන්වන පෞද්ගලික අංශයෙන් පාලනය වන පාසල් ( මෙහි දී ජාත්‍යන්තර පාසල් ඇතුළත් නොවේ)

(e) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ( අන්ධ, ගොළු, බිහිරි, ඔටිසම් ) සඳහා වූ විශේෂ පාසල්

(f) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිත උපාධිධාරීන්

(g) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළින් හෝ ගුරු විද්‍යාල තුළින් පුහුණුව ලබා ඇති ගුරුවරුන්

(h) වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් සහ පුහුණු ගුරුවරුන් සංඛ්‍යාව, සමස්ත ගුරුවරුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස

(i*) මෙයට අඟී ගණ්‍ය ගුරු මධ්‍යස්ථාන වන බිබිල, යාකරවත්ත හා මන්නාරම යන මධ්‍යස්ථාන තුන ද ඇතුළත් වේ.

(j) වාර්ෂික පාසල් සංගණන දත්ත, සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජනගහන දත්ත හා ලෝක බැංකු දත්ත පාදකය ඇසුරිනි.

(k) අවුරුදු 5 සම්පූර්ණ වූ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල පළමු ශ්‍රේණියට ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(l) අවුරුදු 5-10 වයස් සීමාවේ සිටින ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික අධ්‍යාපන චක්‍රයට ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(m) අවුරුදු 5-14 වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික සිට කනිෂ්ඨ ද්විතීයික අවධිය දක්වා (1-9 ශ්‍රේණිවලට ) ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(n) අවුරුදු 5-16 අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික සිට ජ්‍යෙෂ්ඨ ද්විතීයික පළමු අවධිය දක්වා (1-11ශ්‍රේණිවලට ) ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(o) රජයේ පාසල්වලට පළමු ශ්‍රේණියට ඇතුළත් වන ශිෂ්‍යයින්ගෙන් 9 ශ්‍රේණිය හා 11 ශ්‍රේණිය දක්වා රැඳී සිටින ප්‍රතිශත

(p) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ප්‍රතිඵල දත්ත ඇසුරිනි.

(q) පාසල්වල පවතින යටිතල පහසුකම් අතරින් ප්‍රධාන කිහිපයක් පමණක් මෙහි සලකා ඇත.

(r) පාසල් සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ ව සකස්කර ඇති ජාතික ප්‍රතිමානයන්ට අනුව අවශ්‍ය ප්‍රමාණයෙන් 50% ක් හෝ ඇති පාසල්

(s) අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත සහ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ දත්ත ඇසුරිනි.

(t) කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල සියලු ම රජයේ පාසල් ද මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල ඇතැම් රජයේ පාසල් ද 2009 ජූනි 01 පාසල් සංගණන දිනය වන විට වසා තිබිණි.

(u) පළමු වර අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

(v) පළමු වර හා දෙවන වර විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

(w) සිංහල හෝ දෙමළ මාධ්‍ය සහිත ව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද විෂයයන් කිහිපයක් හදාරන සිසුන්

(x) සලකා බලන වර්ෂයේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා කරන සමස්ත වියදම, වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බෙදීමෙන් ඒක පුද්ගල ශිෂ්‍ය වියදම ගණනය කරනු ලැබේ.

N/A—අදාළ නොවේ

X—දත්ත නොමැත

(y) සාමාන්‍ය පෙළ විද්‍යාගාර/ විද්‍යා කාමර හෝ මිනි ලැබ් සහිත 6-11/ 6-13 පාසල් ප්‍රතිශතය

# ඇමුණුම 2

## 2017 වසරේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කළ චක්‍රලේඛ

| දිනය | චක්‍රලේඛ අංකය | විෂය හා යොමුව |
|---|---|---|
| 2017-12-29 | 2018/01 | ද්විතියික ශ්‍රේණි (6-11) සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම |
| 2017-12-29 | 2017/48 | ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් වල ගුරුවරුන් සඳහා 2017 අය වැය තුළින් යෝජිත දේපළ ණය වරප්‍රසාද ලබා දීම |
| 2017-12-29 | 2017/47 | ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් වල ගුරුවරුන් සඳහා 2017 අය වැය තුළින් යෝජිත ආපදා ණය වරප්‍රසාද ලබා දීම |
| 2017-11-29 | 2017/45 | දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා පාසල් සිසුන් වෙනුවෙන් පාවහන් වෙනුවට තිළිණපත් ලබා දීම |
| 2017-11-29 | 2017/44 | 'කළණ මිතුරු පොත් සුමිතුරු'- තිරසර කියවීම් ප්‍රවර්ධන වැඩසටහන |
| 2017-11-16 | 2017/42 | පාසල් සිසුන් වෙනුවෙන් පාසල් නිල ඇඳුම් සඳහා තිළිණපත් ලබා දීමේ චක්‍රලේඛය |
| 2017-11-06 | 2017/41 | සමස්ත ලංකා පාසල් හස්ත කර්මාන්ත තරගය හා ප්‍රදර්ශනය |
| 2017-10-24 | 2017/40 | රජයේ අනුමත ආධාර ලබන/නොලබන පෞද්ගලික පාසල් වල අධ්‍යාපනික හා ආයතනික කටයුතු පිළිබඳ 2005/31 චක්‍රලේඛය සංශෝධනය කිරීම |
| 2017-11-27 | 2017/39 | පාසල් පුස්තකාල පොත්/ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වන නිර්ණායක -2017 |
| 2017-10-06 | 2017/38 | තුන්වන ශ්‍රේණියේ සිට 2018 වසරේ සිට නව විෂය මාලාව ක්‍රියාත්මක කිරීම |
| 2017-09-20 | 2017/37 | 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන - 2017 12,13 ශ්‍රේණි සඳහා වෘත්තීය විෂය ධාරාව හඳුන්වා දීම |
| 2017-09-19 | 2017/36 | ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය- 2017 |
| 2017-09-29 | 2017/35 | 'සුරක්ෂා ' සිසු රක්ෂණාවරණය |
| 2017-10-06 | 2017/32 | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නව සේවා ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම් හා සන්ධාන භාෂා පරීක්ෂණ සම්පූර්ණ කිරීම. |
| 2017-08-18 | 2017/31 | ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල, ජාතික අධ්‍යාපන ආයතනය හා රජයේ පිළිගත් වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල දේශීය පාඨමාලාවන් හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබා දීම |
| 2017-07-21 | 2017/30 | ඩෙංගු රෝග මර්ධනය පිළිබඳ විශේෂ වැඩසටහන |
| 2017-07-21 | 2017/29 | සුහග ශිෂ්‍යත්ව වැඩසටහන- 2017 |
| 2017-07-17 | 2017/28 | ගණිත විෂයය පත්වීම් නොලැබ ගණිත විෂයය ඉගැන්වීමේ යෙදෙන ගුරුවරුන් සඳහා වන ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් සහතිකපත්‍ර ගුරු පුහුණු පාඨමාලාව |
| 2017-07-25 | 2017/27 | පාසල් ගුරුවරියන් සඳහා ගර්භනී සමයට උචිත ඇඳුමක් හඳුන්වා දීම |
| 2017-06-30 | 2017/26 | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථාන මාරු පටිපාටිය- 2018 |
| 2017-06-23 | 2017/25 | අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු -2018 |
| 2017-07-11 | 2017/24 | අධ්‍යාපන ශික්ෂණවේදී ඩිප්ලෝමාධාරී ගුරු භවතුන් සඳහා ආයතන සංග්‍රහයේ XIIවන පරිච්ඡේදයේ 16 වෙනි වගන්තිය යටතේ රැකියා/අධ්‍යයන කටයුතු සඳහා වැටුප් රහිත විදේශ නිවාඩු ලබා දීම |

| දිනය | චක්‍රලේඛ අංකය | විෂය හා යොමුව |
|---|---|---|
| 2017-06-01 | 2017/23 | පාසල් පදනම් කරගත් තක්සේරුකරණ වැඩසටහන 2017 වර්ෂයේ හා ඉන් ඉදිරියට ක්‍රියාත්මක කිරිම. |
| 2017-05-30 | 2017/22 | පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම |
| 2017-11-08 | 2017/21(i) | පාසල්, පිරිවෙන් හා අනිකුත් අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම |
| 2017-06-21 | 2017/21 | පාසල්, පිරිවෙන් හා අනිකුත් අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම. |
| 2017-05-26 | 2017/20 | අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන වැඩමුළු/පුහුණු සැසි/ සම්මන්ත්‍රණ සඳහා ගෙවීම් කිරීම |
| 2017-05-23 | 2017/19 | ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් වල ගුරුවරුන් සඳහා 2017 අයවැය තුළින් යෝජිත අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ වරප්‍රසාද ලබා දීම |
| 2017-04-28 | | සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය 2017 |
| 2017-04-28 | 2017/18 | සමස්ත ලංකා ගණිත දැණුම මිණුම තරගාවලිය |
| 2017-01-31 | 2017/17 | පාසල් හා පිරිවෙන් ආශ්‍රිතව සංවත්සර සමරු මුද්දර නිකුත් කිරීම |
| 2017-03-14 | 2017/16 | විදුහල්පතිවරුන් සඳහා විශේෂ දීමනාවක් ලබා දීම |
| 2017-02-28 | 2017/14 | මානව සම්පත් සංවර්ධන සැලැස්ම |
| 2017-02-27 | 2017/13 | රාජ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරිමට එරෙහිව පාසල් සිසුන් පෙළඹවීම |
| 2017-02-28 | 2017/12 | මුදල් රෙගුලාසි 135 යටතේ බලතල පැවරීම- 2017 |
| 2017-01-27 | 2017/11 | ශ්‍රී බුද්ධ වර්ෂ 2561 වන වෙසක් සැමරුම් සතිය(2017.05.07 සිට 2017.05.13) |
| 2017-05-19 | 2017/10 | පාසල් ළමුන් සඳහා ක්‍රියාත්මක වන පෝෂණ වැඩසටහන |
| 2017-01-25 | 2017/09 | රාජ්‍ය විශ්ව විද්‍යාල ප්‍රවේශ සඳහා මාර්ග ගත ලෙස (Online) අයදුම්පත් යොමු කිරීම- 2016/2017 අධ්‍යයන වර්ෂය |
| 2017-01-26 | 2017/08 | ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ දිවයිනෙන් බැහැර ගතකරන නිවාඩු ලබා දීම |
| 2017-01-17 | 2017/07 | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ විදුහල්පතිවරුන් සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් අතුරින් වැටුප් වර්ධක ගැලපුම් දීමනාවක් ලබමින් සිටින නිලධාරීන්ගේ වැටුප රා.ප.ච03/2016 අනුව පරිවර්තනය කළ යුතු ආකාරය |
| 2017-01-11 | 2017/06 | සමස්ත ලංකා කර්ණාටක සංගීත තරඟය- 2017 |
| 2017-01-11 | 2017/05 | සමස්ත ලංකා පාසල් බටහිර සංගීත හා නැටුම් තරඟය - 2017 |
| 2017-01-11 | 2017/04 | සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල 2017 |
| 2017-01-11 | 2017/03 | සමස්ත ලංකා පාසල් නර්තන තරඟය-2017 |
| 2017-01-11 | 2017/02 | සමස්ත ලංකා පාසල් සංගීත තරඟය - 2017 |
| 2017-01-11 | 2017/01 | සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරඟය -2017 |